SriLankan
Airlines



වාර්ෂික වාර්තාව 2014/15

## පටුන


| | |
|---|---|
| සුවිශේෂ කරුණු | 03 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 04 |
| ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය | 06 |
| අධ්‍යක්‍ෂවරුන් පිළිබඳ කෙටි හැඳින්වීමක් | 09 |
| **මූල්‍ය ප්‍රකාශ** | |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව | 14 |
| මණ්ඩලීය විගණන කමිටුවේ වාර්තාව | 19 |
| අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය | 20 |
| ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව | 21 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 22 |
| ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශය | 23 |
| සර්වව්‍යාපී ආදායම් ප්‍රකාශය | 24 |
| කොටස් ආයෝජනවල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය | 25 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 26 |
| ගිණුම් ප්‍රතිපත්ති හා මූල්‍යමය ප්‍රකාශවලට සටහන් | 27 |
| **අතිරේක තොරතුරු** | |
| දස අවුරුදු සමාලෝචනය | 71 |
| ගුවන් මාර්ග සිතියම | 72 |
| ශ්‍රීලංකන් එයාර්ලයින්ස් - විශේෂ කඩඉම් | 74 |
| පාරිභාෂික පද විවරණය | 76 |
| මහ සභා රැස්වීම දැනුම් දීම | 77 |
| පෙරකලාසි පත්‍රය | ඇතුළත් කර ඇත |
| ආයතනික තොරතුරු | පසුකවරයේ ඇතුලත |


සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ මෙම වාර්තාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් ප්‍රකාශිත 2014/15 වාර්ෂික වාර්ථාවේ සෘජු පරිවර්තනයකි.

SriLankan Airlines
You're our world

**අපගේ දැක්ම**

# ආසියාවේ ප්‍රියතම ගුවන් සේවය බවට පත්වීම

**අපගේ මෙහෙවර**

අපි ගුවන් ප්‍රවාහන ව්‍යාපාර කාර්යයෙහි නිරතව සිටින්නෙමු. විශ්වාසදායක සහ සුපසන්න ප්‍රවාහන අත්දැකීමක් අපි අපගේ සේවාලාභීන් වෙත සපයන්නෙමු. අපි අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් වෙත නව්‍ය, වෘත්තීයමය සහ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වූ විවිධ සේවා සලසා දෙන්නෙමු. ශ්‍රී ලංකාව ලාභදායී වශයෙන් අලෙවිකරණය කිරීම සහ ශ්‍රී ලංකාවේ සමාජීය සුභසාධනය කෙරෙහි දායකවීම පිළිබඳ කොටස් හිමියන්ගේ අපේක්ෂා අපි විසින් සාක්ෂාත් කරන්නෙමු. අප ප්‍රවීන, පෙරටුගාමී හා අනලස්ව ක්‍රියාත්මකවන කණ්ඩායමකි. අපගේ දායකත්ව මෙහෙවර ප්‍රසාදජනකවූද, ඵලදායීවූද එකකි.


You're our world
SriLankan Airlines
oneworld
SriLankan Catering
SriLankan Engineering
FlySmiLes Frequent flyer rewards
SriLankan Economy
SriLankan Business
SriLankan Holidays A world of memories
SriLankan MICE Meet the world
SriLankan Cares
SriLankan Cargo
SriLankan Training
SriLankan IT Systems
upgrád e-auction

# සුවිශේෂී කරුණු




| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | | 2015 | 2014 | 2015 | 2014 |
| **මූල්‍ය** | | | | | |
| ආදායම | රු. මිලියන | 134,316.22 | 124,154.62 | 131,922.13 | 121,585.83 |
| මෙහෙයුම් වියදම් | රු. මිලියන | (145,893.49) | (150,393.31) | (145,983.35) | (150,389.46) |
| බදු පූර්ව අලාභය | රු. මිලියන | (16,254.53) | (31,297.64) | (16,433.03) | (32,357.98) |
| වර්ෂය සඳහා ශුද්ධ අලාභය | රු. මිලියන | (16,329.90) | (31,365.83) | (16,494.66) | (32,408.34) |
| ශුද්ධ වත්කම් | රු. මිලියන | 76,158.30 | 65,386.97 | 72,558.27 | 62,366.70 |
| කොටස් හිමියන්ගේ අරමුදල් | රු. මිලියන | (67,292.86) | (51,678.69) | (74,105.90) | (57,220.95) |
| **ප්‍රවාහනය** | | | | | |
| මගී ධාරිතාව | ඒඑස්කේ මිලියන | | | 16,180.27 | 15,780.54 |
| සමස්ත ධාරිතාව | ඒටීකේ මිලියන | | | 2,224.87 | 2,187.18 |
| ප්‍රවාහනිත මගී සංඛ්‍යාව | ආර්පීකේ මිලියන | | | 12,963.71 | 12,810.95 |
| ප්‍රවාහනිත සමස්ත පැටවුම | ආර්ටීකේ මිලියන | | | 1,519.93 | 1,466.74 |
| මගී පැටවුම් සාධකය | % | | | 80.12 | 81.18 |
| සමස්ත පැටවුම් සාධකය | % | | | 68.32 | 67.06 |
| සමච්ඡේදක පැටවුම් සාධකය | % | | | 77.03 | 84.07 |
| **කාර්ය මණ්ඩල ඵලදායිතාවය** | | | | | |
| පිරිස් බලයේ සාමාන්‍යය | සංඛ්‍යාව | 7,870 | 7,475 | 6,987 | 6,578 |
| ඒක සේවක ආදායම | රු. මිලියන | 17.07 | 16.61 | 18.88 | 18.48 |
| ඒක සේවක අගය ආරෝපණය | රු. මිලියන | (1.08) | (3.55) | (1.41) | (4.33) |
| **ගුවන් යානා ඇණිය** | | | | | |
| A320-200 | සංඛ්‍යාව | | | 6 | 8 |
| A321-200 | සංඛ්‍යාව | | | 2 | – |
| A330-200 | සංඛ්‍යාව | | | 7 | 7 |
| A330-300 | සංඛ්‍යාව | | | 2 | – |
| A340-300 | සංඛ්‍යාව | | | 4 | 6 |
| වසරාවසාන සේවාගත ගුවන් යානා | සංඛ්‍යාව | | | 21 | 21 |


**සමස්ත උත්පාදනය**




**මගී කිලෝමීටරයකට ආදායම**




**රැගෙන යන ලද ඒකක ගණන සහ ආදායම් මගී කිලෝමීටර්**



# සභාපතිතුමාගේ පණිවිඩය



**ආයතනය මුළුල්ලෙහි සියළුම තරාතිරම්වල සෑම දෙනාගෙන්ම අප හට ලැබුණු සහයෝගය සහ අනුග්‍රහය අප ඉමහත් ලෙස දිරිමත් කරනු ලැබීය. ගුවන් සමාගමෙහි සංස්කෘතියෙහි සහ සිතුම්පැතුම්වල පැහැදිලි වෙනසක් සහ තිරසාර ලාභදායීත්වය කරා ආයතනය නැඹුරු කෙරෙන වෙනසක් දැකීමට ඇති දැඩි ඇල්මක් ඇතිවී තිබේ.**

2014/15 මූල්‍ය වර්ෂය සඳහා වූ සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සමාගමෙහි වාර්ෂික වාර්තාව සහ විගණිත ගිණුම් ඔබට මෙලෙස ඉදිරිපත් කරමි.

මාගේ මෙම පණිවුඩය ඔබ වෙත ඉදිරිපත් කෙරෙනුයේ සමාලෝචනයට භාජනය කෙරෙන මූල්‍ය වර්ෂයේ අවසාන කාලයේ එනම් 2015 පෙබරවාරි මස සිදුකෙරුණු මගේ පත්වීම සහ නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කිරීම සමග ගුවන් සමාගමෙහි සැලකිය යුතු වෙනස්කම් සිදුවන පසුබිමකය.

ඒ හේතුකොටගෙන මෙහි දැක්වෙන අදහස් බොහෝ දුරට අනාගතය දෙස අවධානය යොමු කෙරෙමින් සිදුකොට ඇති අතර, එමගින් ශ්‍රීලංකන් ගුවන් සමාගමෙහි සමස්ථ කාර්යසාධනය නිවැරදි මගට ගෙන ඒම අරමුණුකොටගෙන කෙරෙන මූලික ප්‍රතිසංස්කරණදාමයක් ක්‍රියාවට නංවන පෙරලිකාර කාලපරිච්ඡේදයක් නිවේදනය කෙරේ.

සමාලෝචනයට භාජනය වන කාලපරිච්ඡේදය තුළදීද දිගින් දිගටම පාඩුලබමින් පවත්නා තත්ත්වයක් මධ්‍යයේ අධ්‍යක්ෂ මණ්ඩලය හමුවේ ඇති මූලික ප්‍රශ්නය වනුයේ තාත්වික සහ තිරසාර නිවැරදි මගට ගෙනඒමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කළ හැකිද, ඒ සඳහා කුමන කාලවකවානුවක් ගතවනු ඇතිද, සහ එය කොතරම් ස්වයංපෝෂිත ආකාරයට ලඟාකර ගතහැකිද යන්නයි.

මෙම ස්වයං අගැයීමේ ප්‍රාථමික ප්‍රතිඵලයක් ලෙස අපි ප්‍රතිසංස්කරණ සැලැස්මක් පිළියෙල කර ඇති අතර, එය ඉදිරි වාර්ෂ තුන (2015/16 සිට) මුළුල්ලෙහි ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙමු. මෙම සැලසුමට අනුව ගුවන් සේවයේ ව්‍යාපාර කටයුතුවලට සම්බන්ධ ප්‍රධාන අංශයන් කිහිපයක් පවත්වාගෙන යන ආකාරය පිළිබඳව මූලික වෙනස්කම් රැසක් සිදුකෙරෙනු ඇත.

අප ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු  වන්නා වූ එම වෙනසට මඟපෙන්වීමට හැකි නිපුණත්වය සහ කුසලතාවලින් හෙබි පුද්ගලයින්, විශේෂයෙන්ම ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන වාණිජ නිලධාරි, ප්‍රධාන කාර්මික නිලධාරී සහ ප්‍රධාන මූල්‍ය නිලධාරි බඳවා ගැනීමේ ක්‍රියාවලිය දැන් ක්‍රියාත්මක වෙමින් පවතී.

නව සැලසුමට ශ්‍රී ලංකා රජයේ අනුමැතිය සහ අනුග්‍රහය ලැබී ඇති අතර, එය මුළුමනින්ම ක්‍රියාවට නැංවීම සඳහා නිවැරදි මාර්ගයන් ඔස්සේ එහි ප්‍රගතිය අපේක්ෂාවෙන් සිටිමු.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කළමනාකරණය, සේවක මණ්ඩලය සහ ඔවුන් නියෝජනය කරන වෘත්තිය සමිති පහ සමගද පුළුල් ලෙස වෙනස්කම් පිළිබඳ සාකාච්ඡා කළ බවද ඔවුන්ව සිය අදහස් සහ ප්‍රතිචාර ලබාදීමට දිරිමත් කළ බවද මෙම අවස්ථාවේදී මම ප්‍රකාශ කර සිටීමට කැමැත්තෙමි.ආයතනය මුළුල්ලෙහි සියළුම තරාතිරම්වල සෑම දෙනාගෙන්ම අප හට ලැබු සහයෝගය සහ අනුග්‍රහය අප ඉමහත් ලෙස දිරිමත් කරනු ලැබීය. ගුවන් සමාගමෙහි සංස්කෘතියෙහි සහ සිතුම්පැතුම්වල පැහැදිලි වෙනසක් සහ තිරසාර ලාභාදායීත්වය කරා ආයතනය නැඹුරු  කෙරෙන වෙනසක් දැකීමට ඇති දැඩි ඇල්මක් ඇතිවී තිබේ.

මෙම ප්‍රතිචාරයට අපි අතිශයින්ම ස්තුතිවන්ත වන අතර, එමගින් අපි ඉමහත් උද්යෝගයට පත්ව සිටිමු.

ඉදිරියේදී ශ්‍රීලංකන් ගුවන් සමාගම මිහින්ලංකා සමාගමෙහි උපායමාර්ගයටත් එහි ක්‍රියාකාරිත්වයටත් සහය දක්වන අතර, එය ආයතන දෙක අතර වඩාත් සමීප සම්බන්ධතාවයක් තුළ සිදුකෙරෙනු ඇත. මෙම සම්බන්ධතාව තුළ පවතින අන්‍යෝන්‍ය වශයෙන් වාසිසහගත වන්නාවූ කරුණු ප්‍රයෝජනයට ගනිමින් ආයතන දෙකටම අනාගත වර්ධනය සඳහා ඉමහත් ඉඩප්‍රස්ථා ඇති බව අපට පෙනී යයි. මෙම ක්‍රියාදාමය තුළින් ශ්‍රී ලංකන් ගුවන් සමාගමට පූර්ණ සේවා සපයන ජාත්‍යන්තර ගුවන් සමාගමක් ලෙසත් මිහින් ලංකා සමාගමට ගුණාත්මක සේවාවන් සපයන අඩුපිරිවැය ගුවන් සමාගමක් ලෙස මූලිකවම 'ශ්‍රී ලංකා ගුවන් සීමාවෙහි' ක්‍රියාත්මක වීමටත් ඉඩ ප්‍රස්ථා සලසයි.

සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම, ශ්‍රීලංකන් ඒවියේෂන් කොලෙජ් සහ ශ්‍රීලංකන් ඉංජිනේරු සේවා (විශේෂයේන්ම සේවාදයක ගුවන් සමාගම් සඳහා නඩත්තු, අළුත්වැඩියා සහ පිරිවැඩියා සේවාවන් සැපයීම) ලබා ඇති ප්‍රගතිය පිළිබඳ මම මෙහිදී සටහන් කිරීමට කැමැත්තෙමි. එම ආයතන සහ සේවාවන් සියල්ලටම ගෙවුණු වසර සාර්ථක එකක් විය.

අපගේ සැලසුම් ක්‍රියාත්මක කිරීමට අප දිරිමත් කළ සහ උපකාර කළ සියළුම පාර්ශව කරුවන්ටත් විශේෂයෙන්ම ශ්‍රී ලංකා රජයටත් අපි ණයගැති වෙමු.



**අජිත් නිශ්ශංක ඩයස්**
සභාපති

# ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය



**අභියෝග මධ්‍යයේ වුවද ශ්‍රීලංකන් ගුවන් සමාගමේ අනාගත වර්ධනයටත් තිරසාර පැවැත්මටත් පදනම දැමීම සඳහා ඵලදායී ලෙස උපයෝගී කර ගත හැකි සුවිශේෂී ශක්තීන් සහ අවස්ථාවන් රාශියක් සමාගම සතු බව අපි හඳුනා ගත්තෙමු.**

2015 පෙබරවාරි මාසයේ දී නව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතනයේ පාලනය භාරගන්නා අවස්ථාවේදී ආයතනය පැවතියේ අතිශයින්ම අර්බුදකාරී මූල්‍ය තත්ත්වයකය.

සමාගමේ මුළු සමුච්චිත අලාභය 2014 මාර්තු 31 දිනට රුපියල් බිලියන 110.74 ක්ද 2015 මාර්තු 31 දිනට රුපියල් බිලියන 128.24 ක්ද විය.

සමුච්චිත අලාභ හේතුකොටගෙන ආයතනය බරපතල ප්‍රාග්ධන පාඩුවකට මුහුණදී සිටී.

2015 මාර්තු 31 දිනට සමාගමේ මුළු ණය ප්‍රමණය රුපියල් බිලියන 76.07 (ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 572 ක්) විය.

2014/15 වර්ෂය සඳහා පමණක් මුල්‍ය පිරිවැය රුපියල් බිලියන 5.01 ක් විය.

2014/15  මූල්‍ය වර්ෂය සඳහා ලැබිය යුතුව තිබූ ශ්‍රී ලංකා රජයේ ඇමරිකානු ඩොලර් 125 ක අරමුදල් මේ දක්වා ලැබී නැත.

2015/16 මූල්‍ය වර්ෂය සඳහා වූ අයවැයක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරුණු අතර, එය සමාලෝචනය කර සැලකිය යුතු වැඩි දියුණු කිරීම් සිදු කරන ලදී.

නිසැකවම ඉමහත් බැරෑරුම් කර්තවයක් අප ඉදිරියේ ඇත.

නව අධ්‍යක්ෂ මණ්ඩලය හැකි ඉක්මනින් ආයතනය මුහුණ දෙමින් පැවති මූලික ප්‍රශ්ණ ග්‍රහණය කරගැනීමට උත්සහ දැරුවේය. පසුගිය වසර ගණනාවක් මුලුල්ලේ බොහෝ ප්‍රයත්නයන් ගෙන තිබුණද ගුවන් සමාගමේ ඉතිහාසයේ ඉතා කෙටි කාලපරිච්ඡේද කිහිපයක හැර මූල්‍යමය වශයෙන් තිරසාර පැවැත්මක් සහිත ගුවන් සමාගමක් ලෙස ස්ථාපිතවීමට ශ්‍රීලංකන් ගුවන් සමාගමට නොහැකිවූ බව අපි කෙටිකාල සීමාවක් තුල අවබෝධ කර ගතිමු. අභ්‍යන්තර සහ බාහිර කරුණු රාශියක් මෙම තත්ත්වයට දායකවී තිබුණි. ආයතනය සමාරම්භයේ සිටම ප්‍රමාණවත් පරිදි ප්‍රාග්ධනිත කොට නොතිබුණි.

ගුවන් සමාගමේ ඒකක පිරිවැය අඛණ්ඩවම එහි ඒකක ආදායමට වඩා ඉහළ මට්ටමක පැවතිණි. ඒකක පිරිවැය සලකා බලන කල අනිකුත් සංසන්දනය කළ හැකි ගුවන් සේවාවන්ට සාපේක්ෂව ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ඒකක පිරිවැය පිළිබඳ වාසිසහගත තත්ත්වයක් පැවතියේ වූ නමුත් ආදායම පිළිබඳ අවාසිදායක තත්ත්වය හිලව් කිරීමට එය ප්‍රමාණවත් නොවේ.

අතීත අත්දැකීම් තුළින් ගුවන් සේවාව වෙනස් වූ ප්‍රතිඵලයක් අත්පත් කරගැනීමට නම් ඒ සඳහා නිර්භීත පියවරයන් ගැනීමටත් වෙනස් වූ ප්‍රවේශයක් අත්හදා බැලීමට අවශ්‍ය විශ්වාසය සහ ධෛර්යය තිබිය යුතු බවටත්, ආයතනයේ මූල්‍ය කාර්යසාධනය තහවුරුකරගන්නා තෙක් මෙම ප්‍රවේශය ඔස්සේම ගමන් කළ යුතු බවත් අපි අවබෝධ කරගතිමු.

ප්‍රමුඛත්වයෙහි ලා සැලකියයුතු කරුණක් ලෙස අපි කොටස්හිමියාගෙන් ලැබිය යුතුව තිබූ අරමුදල් ලබාගැනීමට උත්සාහ කළෙමු. එම අවස්ථාවේ ශ්‍රී ලංකා රජය සමස්ථ ආර්ථිකයට ජාතික ගුවන් සේවයෙන් ඉටුකරන කාර්යභාරයේ වැදගත්කමත්, එයට මූල්‍යමය වශයෙන් සහය ලබාදීමට ඇති කැපවීමත් පුනපුනා ප්‍රකාශ කරන ලද අතර (මෙතෙක් කල් එතරම් පැහැදිලිතාවයක් නොතිබුණු), ව්‍යාපාර කටයුතුවලට වාණිජමය ස්වරූපයක් ලබාදීම තුළින් ශ්‍රී ලංකා රජයේ අරමුදල් මත සැපීම අවම කරගනිමින් නුදුරු අනාගතයේදී මිහින් ලංකාද ඇතුළුව ආයතනය ස්වයංපෝෂිත තත්ත්වයට ලගාකර ගත හැකි පැහැදිලි සහ තාත්වික සැලසුමක් ඉදිරිපත් කරන මෙන් ඉල්ලා සිටියේය.

එක් එක් ගුවන් සමාගම සඳහා ක්‍රියාවට නැංවිය හැකි සවිස්තරාත්මක ව්‍යාපාර සැලසුමක් සහ සමාගම් දෙක ඒකාබද්ධ කිරීමට උචිත සැලසුමක් ද පිළියෙල කරන ලෙස කැබිනට් මණ්ඩල තීරණයක් මගින් ශ්‍රී ලංකා රජය සමාගමට නියෝග කරන ලදී.

අභියෝග මධ්‍යයේ වුවද ශ්‍රීලංකන් ගුවන් සමාගමේ අනාගත වර්ධනයටත් තිරසාර පැවැත්මටත් පදනම දැමීම සඳහා ඵලදායී ලෙස උපයෝගී කර ගත හැකි සුවිශේෂී ශක්තීන් සහ අවස්ථාවන් රාශියක් සමාගම සතු බව අපි හඳුනා ගත්තෙමු.

මෙම අභියෝගයන්, ශක්තීන් සහ අවස්ථාවන් සැලකිල්ලට ගෙන අප වසර තුනක් සඳහා වන ව්‍යාපාර සැලසුමකට පදනම පිළියෙල කළ අතර, එය ශ්‍රී ලංකා රජය විසින් ප්‍රතිපත්තිමය ලෙස අනුමත කර ඇත. මෙම සැලසුමේ මූලික ලක්ෂණ වනුයේ ආයතනය මූල්‍යමය වශයෙන් ප්‍රතිසංවිධිත කිරීමත් ගුවන් මාර්ග ජාලය සහ ගුවන්යානා ඇණිය ප්‍රශස්ථ මට්ටමකට ගෙන ඒමත් ය.

ව්‍යාපාරයේ වර්තමාන කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා අප විසින් ක්ෂණික පියවර කිහිපයක්ම ගන්නා ලද අතර, ප්‍රක්ෂිප්ත ඌණතාවය අඩුකරගැනීම අරභයා පිරිවැය සහ ආදායම් සම්බන්ධ ක්‍රියාමාර්ග රාශියක් හඳුන්වාදෙමින් 2015/16 සඳහා වූ පුරෝකතනයන් නැවත පිළියෙල කරන ලදී.

ශ්‍රී ලංකා රජය සමාගමෙන් අපේක්ෂා කළ පරිදිම නව අධ්‍යක්ෂ මණ්ඩලය සේවකයින් සහ සේවක කණ්ඩායම් සක්‍රියවම සම්බන්ධකරගන්නා ලද අතර, ව්‍යාපාර කටයුතුවල තත්ත්වය සහ ආයතනයේ අනාගතය පිළිබඳ වූ විකල්ප විවෘතව ඔවුන්ට සන්නිවේදනය කරන ලදී.

අලාභයෙන් ලාභයට (Red to black), ප්‍රයත්නයත් උසස් ගණයේ අදහස් (Bright ideas), ලබාගැනීමේ ප්‍රයත්නයත් ක්‍රියාවට නංවන ලද අතර, ඒවා දිගින් දිගටම ක්‍රියාත්මක වෙමින් පවතී. ඒවායේ ප්‍රතිඵල අපව අතිශයින්ම ධෛර්යයට පත්කරවන සුළුය. මෙම ප්‍රතිඵල ආයතනයේ මූල්‍ය කාර්යසාධනය වර්ධනය කිරීමටත් අර්ථාන්විත සහ තිරසාර වෙනසක් කරා ආයතනය යොමු කිරීමටත් සේවකයින් තුළ ඇති කැපවීම අධ්‍යක්ෂ මණ්ඩලයට මැනවින් ඔප්පු කර ඇත.

ඉදිරි වර්ෂයේදී අපි මගී සහ භාණ්ඩ ප්‍රවාහන ඵලදායීතාවය වර්ධනය කිරීම අරමුණුකරගත් ඉතා සමීපව අධීක්ෂණය කෙරෙනු ලබන සැලසුමක් ක්‍රියාවට නංවන්නෙමු.

අප විසින් සේවා සපයනු ලබන වෙළෙඳපලවල පාරිභෝගිකයින්ගේ ප්‍රියතම ගුවන් සේවය බවට ශ්‍රීලංකන් පත්වීම සඳහා ආර්ථික (Economy) සහ ව්‍යාපාරික (Business) යන වර්ග දෙකටම අතිවිශිෂ්ට යානාස්ථ මගී සේවාවක් සැපයීමෙන් පාරිභෝගිකයින්ගේ අත්දැකීම තවදුරටත් වර්ධනය කෙරෙනු ඇත.

අයවැය සමාලෝචන සහ විපරම් ක්‍රියාවලියේදී කොටස්හිමියාගේ බලාපොරොත්තු ඒ අයුරින්ම ඉටු කෙරෙන බව වගබලාගැනීම සඳහා එක් එක් අංශවල ක්‍රියාකාරීත්වය දැඩිලෙස විපරමට ලක්කෙරෙනු ඇත.

ගුවන් සමාගම අතිශයින් බලවත් අපේක්ෂා සහිත ගමනක යෙදී සිටී. එහෙත් එම ගමන සාර්ථකත්වය කරා යෑමට ඇති සාමූහික කැමැත්ත සහ පරීක්ෂාකාරී ලෙස පිලියෙල කරන ලද උපායමාර්ග මත රඳා පවතී. අධිෂ්ඨානයක් ඇති කල්හි සාමාන්‍යයෙන් ඒ සඳහා මගක්ද පවතී. ඉදිරි වර්ෂ අතිශයින්ම අභියෝගාත්මක වනු ඇති නමුත් තිරසාර මූල්‍යමය සමෘද්ධිය සහ වර්ධනය ළඟාකර ගැනීමට අවශ්‍ය සියළු මූලිකාංග අප සතුව ඇත.

අවසාන වශයෙන් අධ්‍යක්ෂක මණ්ඩලයට, ඉහළ කළමණාකාරීත්වයට සහ සේවක මණ්ඩලයේ සෑම සාමාජිකයකුටම ඔවුන්ගේ කැපවීම සහ උත්සාහවන්ත බව වෙන්වෙන් මගේ අවංක ස්තුතිය පුද කරමි.



**රඕිත ජයවර්ධන**
කාලීන ප්‍රධාන විධායක නිලධාරී
2015 අගෝස්තු මස 25 වන දින.

# අධ්‍යක්ෂවරුන් පිළිබඳ කෙටි හැඳින්වීමක්



**අජිත් නිශ්ශංක ඩයස් මහතා**

අජිත් නිශ්ශංක ඩයස් මහතා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට 2015 පෙබරවාරි මස 12 වන දින පත් කෙරුණු අතර ශ්‍රීලංකන් ගුවන් සමාගමේද, ශ්‍රීලංකන් කේටරින් සමාගමේද, සී/ස මිහින් ලංකා (පුද්ගලික) සමාගමේද සභාපතිවරයා වශයෙන් කටයුතු කරයි.

එක්සත් රාජධානියේ පේෂකර්ම ආයතනයේ ආශ්‍රය සාමාජිකයෙකු හා එක්සත් රාජධානියේ සැල්පොඩ් විශ්ව විද්‍යාලයේ වරලත් පේෂකර්ම තාක්ෂණවේදියෙකු වන ඩයස් මහතා 2015 වර්ෂය සඳහා වන එකී විශ්ව විද්‍යාලීය විද්‍යාර්ථ විශිෂ්ටතා සම්මානයකින් ද මෑතකදී පුද ලැබීය.

ඇඟළුම් කර්මාන්තයේ පුරෝගාමියෙකු වන ඩයස් මහතා බ්‍රැන්ඩික්ස් සමූහ ව්‍යාපාරයේ සම ප්‍රාරම්භකවරයෙකුද වන්නේය. ඒ මහතා ඒකාබද්ධ ඇඟළුම් සම්මේලන සංසදයේද, නිදහස් වෙළඳ කලාප කර්මාන්තකරුවන්ගේ සම්මේලනයේද, කොළඹ හිල්ටන් හෝටලය හිමි සමාගම වන සී/ස හොටෙල් ඩිවෙලොපර්ස් (පුද්ගලික) සමාගමේද සභාපතිවරයා ලෙස කටයුතුකර ඇත.

දැනට ඒ මහතා ඇඟළුම් අපනයනය, කෘෂිකර්මය හා විවේක සුව කර්මාන්තය යන ක්ෂේත්‍රවල ව්‍යාපාරික කටයුතුවල නියැලී සිටී.

**රකිත ජයවර්ධන මහතා**

2015 පෙබරවාරි මස 20 වන දින ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයටද 2015 මාර්තු මස 10 වන දින කාලීන ප්‍රධාන විධායක නිලධාරී ලෙසද පත් කෙරුණි.

සී/ස ශ්‍රීලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද, සී/ස මිහින් ලංකා (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ/කාලීන ප්‍රධාන විධායක නිලධාරී ලෙසද සේවය කරයි.

ජගත් ගුවන් සමාගම් කර්මාන්තයේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරි සහ සාමාන්‍යාධිකාරී වශයෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවල සේවයකර ඇති ජයවර්ධන මහතාට එම ක්ෂේත්‍රය තුළ වසර 30 කට වැඩි සේවා පළපුරුද්දක් හා ප්‍රගුණතාවක් ඇත.

ඇමෙරිකානු රටවල සිට යුරෝපය, ආසියා ශාන්තිකර කලාපය සහ අප්‍රිකාව දක්වා ගුවන් ගමන් කටයුතු මෙහෙයවූ විශාල ලෙගසි ගුවන් යානා සමාගම් සම්බන්ධයෙන්ද, කුලී ගුවන් සේවා හා අඩු වියදම් ගුවන් යානා සමාගම් සම්බන්ධයෙන්ද නිව්යෝක් (ඇ.එ.ජ.) සහ ලන්ඩන් (එ.රා.) යන නගරවල හා හොංකොං සහ ශ්‍රී ලංකාව යන රටවල සිට සේවය ඒ මහතා ලැබූ සේවා පළපුරුද්ද හා ප්‍රගුණතාව ඒ අතර විය.

රකිත ජයවර්ධන මහතා, ආසියා ශාන්තිකර කලාපය තුළ ගුවන් සමාගම් හා සම්බන්ධ වෙමින් විස්තෘත සංචාරක සේවා සමූහයක් සපයන හොංකොංහි පිහිටි කිං පවර් ට්‍රැවලර් කොම්පනි ලිමිටඩ් ආයතනයේ සභාපතිවරයාද වේ. එයාර් මැකෝ, එයාර් නියුගිනි, සේබු පැසිපික්, මයන්මා එයාවේස්, ඩ්‍රක් එයාර්, මෙගා මෝල්ඩිව්ස්, මොන්ගෝලියන් එයාර්ලයින්ස්, ගෝල්ඩන් මයින්මාර් එයාර්ලයින්ස්, වියට් ජෙට් එයාර්, බංගලාදේශ් එයාර්ලයින්ස්, පීජී එයාර්වේස්, එයාර් වනුවාටු සහ ජෙස්ටර් ජැපෑන් ඒ හා සම්බන්ධ සේවාලාභීන් අතරවේ.

ජයවර්ධන මහතා ලන්ඩනයේ අලෙවිකරණ ආයතනයේ පූර්ණ සාමාජිකයෙකුවේ.

## ලුතිනන් කර්නල් සුනිල් පීරිස්

2015 පෙබරවාරි මස 12 දින ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරුණු අතර, මානව සම්පත් විධායක අධ්‍යක්ෂවරයා ලෙස සේවය කරයි.

සී/ස ශ්‍රීලංකන් කේටරින් සමාගමේ සහ සී/ස මිහින් ලංකා (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි.

වසර 22 ක සේවා කාලයක් සහිත විශ්‍රාම ලත් යුද හමුදා නිලධාරියෙකි. පීරිස් මහතා විශිෂ්ට හමුදා සේවයකින් පසුව නියමිත කාලයට පෙර සේවයෙන් විශ්‍රාම ගියේය.

ලංකා දුම්කොළ සමාගමේ සේවයට බැඳුනු ඒ මහතා එම ව්‍යාපාර සමූහයේ අවදානම් හා ආරක්ෂක කළමනාකරු ලෙස කටයුතු කළ අතර, සී.ටී.සී. ට්‍රේඩිං කම්පනි ලිමිටඩ් ආයතනයේ සාමාන්‍යාධිකාරිවරයාද වූයේය. ඉන් පසුව රිච්ඩ් පීරිස් එක්ස්පෝර්ට්ස් ලිමිටඩ් ආයතනයේ විකුණුම් හා අලෙවි අධ්‍යක්ෂ වශයෙන්ද, රිච්ඩ් පීරිස් ඩිස්ට්‍රිබියුටර්ස් සහ රිච්ඩ් පීරිස්, කීල්ස් ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ් යන ආයතනවල අධ්‍යක්ෂ වශයෙන්ද සේවයකර ඇත. ඇමල්ගමේටඩ් ග්‍රෆයිට් (පුද්ගලික) සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස ඔහු සේවය කරන අතර ඒ මහතා ඕස්ට්‍රේලියා ප්ලාස්ටිපැක් ලිමිටඩ් ආයතනයේ සභාපතිවරයා ද, නිපොන් පේවර් පෝම්ස් (පුද්ගලික) සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයාද වූයේය.

## ජෝශප් බ්‍රිටෝ මහතා

2015 පෙබරවාරි මස 12 වන දින ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරුණි.

සී/ස ශ්‍රීලංකන් කේටරින් සමාගමේ සහ සී/ස මිහින් ලංකා (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කරයි.

ලන්ඩන් විශ්වවිද්‍යාලයේ නීතිවේදී උපාධිය හා ලන්ඩන් සිටි බිස්නස් ස්කූල් විද්‍යායතනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. ශ්‍රී ලංකාවේ සහ එංගලන්තයේ හා වේල්සයේ වරලත් ගණකාධිකාරී ආයතන දෙකෙහිම ආශ්‍රය සාමාජිකත්වය දරයි.

අධ්‍යයන ක්ෂේත්‍ර කිපයක දැනුම සහිතව ලන්ඩනයේ සහ ලෝක බැංකුවේ ප්‍රයිස්වෝටර්හවුස් ආයතනය ඇතුළු ජාත්‍යන්තර සංවිධාන ගණනාවක සේවයෙන් පසු ලබා ඇති වසර 35 ක ඉමහත් ජාත්‍යන්තර පළපුරුද්දක් බ්‍රිටෝ මහතා සතුය.

ඒට්කන් ස්පෙන්ස් පී.එල්.සී. ආයතනයේ සහ ඒට්කන් ස්පෙන්ස් හොටේල් හෝල්ඩිංග්ස් පී.එල්.සී. ආයතනයේ නියෝජ්‍ය සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස දැනට කටයුතු කරන බ්‍රිටෝ මහතා, ඇල්පිටිය ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී. ආයතනයේද සභාපතිවරයාවේ. තවද ඒ මහතා ඩී.එෆ්.සී.සී. බැංකුවේද, ඩී.එෆ්.සී.සී. වර්ධන බැංකුවේද, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේද සභාපති ධුරය උසුලා ඇත.

## චානක ද සිල්වා මහතා

2015 පෙබරවාරි මස 12 වන දින ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කෙරුණු අතර මීට පෙර 2002-2004 කාලය තුළ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේද සේවය කර ඇත.

සී/ස ශ්‍රීලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කරයි.

1992 වර්ෂයේදී කැළණි ටයර්ස් පී.එල්.සී. සමාගම පුද්ගලීකරණය කිරීමට පෙර එහි සභාපතිවරයා ලෙසද, 1998 දී බද්ධ ව්‍යාපාරයක් ලෙස සියැට් ශ්‍රී ලංකා ගෲප් සමූහ ව්‍යාපාරය ස්ථාපිත කළ දින සිටම එහි සභාපතිවරයා ලෙස සේවයකර ඇති සිල්වා මහතා දැනට විල්ස් ගෲප් ඔෆ් කොම්පනීස් ආයතනයේ සභාපතිවරයාවේ.

තමා විසින් පිහිටුවන ලද යූනියන් කොමඩිටීස් (පුද්ගලික) ආයතනයේ සභාපතිවරයා ලෙස 2013 දෙසැම්බර් මස 31 වන දින දක්වා සේවය කළ සිල්වා මහතා, මීට පෙර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේද, ට්‍රාන්ස් ඒෂියා හෝටලයේද, ක්ලබ් රොබින්සන් සහ යූනියන් බෑන්ක් ඔෆ් කලම්බෝ ලිමිටඩ් යන ආයතනවලද සභාපති ධුරය දරා ඇති අතර ඒෂියන් එලායන්ස් ඉන්ෂුවරන්ස්, ඩෙල්මේජ් ෆෝසයිත් ලිමිටඩ්, ලුවිස් බ්‍රවුන් ඇන්ඩ් කම්පනි ලිමිටඩ්, ඉන්ටකොන්ටිනන්ටල් හොටෙල් සහ ඔබරෝයි හොටෙල් යන ආයතනයන්හි අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතුකර ඇත.

## මහින්ද හරදාස මහතා

2015 පෙබරවාරි මස 12 වන දින ශ්‍රීලංකන් එයාර්ලයින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරුණු හරදාස මහතා මීට පෙර 2002-2004 කාලය තුළද සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවයකර ඇත.

ඒ මහතා සී/ස ශ්‍රීලංකන් කේටරින් සමාගමේ සහ සී/ස මිහින් ලංකා (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කරයි.

1985-2004 කාලය තුළ වාර්නර්ස් ලංකා නීති කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ හවුල්කරුවෙකු ලෙස කටයුතු කළ හරදාස මහතා දැනටද එහි ජ්‍යෙෂ්ඨ හවුල්කරුවකු වශයෙන් සේවය කරයි.

වෘත්තියෙන් නීතිවේදියෙකුවූ හරදාස මහතා, ශ්‍රී ලංකා නීතිඥ සංගමයේද, ජාත්‍යන්තර නීතිඥ සංගමයේද, ජාත්‍යන්තර සංවර්ධනය සඳහාවූ සමාජයේද, ජාත්‍යන්තර මූල්‍ය සංගමයේද සාමාජිකයෙකි. ජාත්‍යන්තර මූල්‍ය සංගමයේ ශ්‍රී ලංකා ශාඛාවේද, ආසියානු පේටන්ට් නීතිඥ සංගමයේ සහ අන්තර් ශාන්තිකර නීතිඥ සංගමයේද ප්‍රාරම්භක සාමාජිකයෙකි.

## නිරංජන් ද සිල්වා දේවා ආදිත්‍ය මහතා

2015 මැයි මස 26 වන දින ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරුණි.

ගුවන් ගමන් විද්‍යා ඉංජිනේරු වරයෙකු වන දේවා ආදිත්‍ය මහතා, ලූබරෝ විශ්ව විද්‍යාලයේ ගගන ඉංජිනේරු විද්‍යා ගෞරව උපාධිය ලබා සිටින රාජකීය ගුවන් ගමන් විද්‍යා සමාජයේ උපාධිධරයෙකුවේ.

කොන්සර්වැටිව් පක්ෂයේ සාමාජිකයෙකු වන ඒ මහතා, 1999 වර්ෂයේ සිට ඊශාන දිග එංගලන්තය නියෝජනය කරමින් යුරෝපා පාර්ලිමේන්තුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි. බ්‍රෙන්ට්ෆෝඩ් හා අයිල්වර්ත් යන මැතිවරණ කොට්ඨාශය නියෝජනය කරමින් 1992 සිට 1997 දක්වා කාලය තුළ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ (හවුස් ඔෆ් කොමන්ස්) මන්ත්‍රීවරයෙකු ලෙස මීට පෙර කටයුතුකර ඇති ඒ මහතා ස්කොට්ලන්ත කාර්යාලයේ බ්‍රිතාන්‍ය රජයේ සාමාජිකයෙකි. යටත් විජිත යුගයෙන් පසුව ආසියානු සම්භවයක් සහිතව බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට තේරී පත්වූ ප්‍රථමයා වන දේවා ආදිත්‍ය මහතා, යුරෝපා පාර්ලිමේන්තුවට කොන්සර්වැටිව් පක්ෂයේ සාමාජිකයෙකු වශයෙන් තේරී පත්වූ ප්‍රථම ආසියාතික සම්භවයක් සහිත තැනැත්තාද වූයේය. ඔහු ලෝඩ් ලෙප්ටිනන්සි සංසඳයේ නියෝජ්‍ය ලුතිනන්වරයෙකුද වන්නේය.

උතුරු හා දකුණු කොරියා දෙරාජ්‍ය අතර සාමය ඇතිකිරීමේ යුරෝපා සංගමය හා කොරියාව ඒකාබද්ධ දූත මණ්ඩලයේ සභාපතිවරයා ලෙස කටයුතු කළ දේවා ආදිත්‍ය මහතා එමගින් නැගෙනහිර ආසියාව තුළ සංහිඳියාව ඇති කළ කොරියානු අර්ධද්වීපය හා ජපානය අතර සාමයටද දායක විය.

## හරින්ද්‍ර බාලපටබැඳි මහතා

2015 ජූනි මස 26 වන දින ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරිණි.

ආරක්ෂිත මුද්‍රණය, වරලත් බැංකුකරණය යන ක්ෂේත්‍රවල සිට සුඛෝපභෝගී නිවාස සංවර්ධනය (ඕස්ට්‍රේලියානු) දක්වා විහිදුන ව්‍යාපාරික අංශවල වසර 20 කට අධික පළපුරුද්දක් සතු නිපුණ ව්‍යවසායකයෙකි. නයික් සහ රීබොක් යන වෙළෙඳ සන්නාම ශ්‍රී ලංකාවට හඳුන්වා දීමට දායකවූ ඔහු සිලෝන් ෂිපින් ලයින්ස් ආයතනයේ හිටපු විධායක අධ්‍යක්ෂවරයාද වූයේය. උපදේශක කාර්ය පැවරුම් සම්බන්ධයෙන් ප්‍රංශය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඔස්ට්‍රේලියාව, නෙදර්ලන්තය, චීනය සහ ඉන්දියාව වෙතින් බහු ජාතික සමාගම් මෙරටට ගෙන්වා සේවා සලසා ගැනීම සඳහා කටයුතුකර ඇත.

බාලපටබැඳි මහතා විසින්ම ආරම්භ කළ ඕපල් සමූහ ව්‍යාපාරයේ සභාපති/විධායක නිලධාරි ලෙස කටයුතු කරයි. ආරක්ෂිත කාඩ්පත් මුද්‍රණය, ඉදිකිරීම්, ජල පිරියම් කිරීම, විකල්ප බලශක්තිය හා තෙල් පිරිපහදු කිරීම (ආයෝජන මණ්ඩලය) යන ක්ෂේත්‍රවල මෙම ව්‍යාපාර සමූහය නියැලී සිටින අතර ශ්‍රී ලංකාව තුළ ඔබර්ත (ප්‍රංශය) සහ එච්.අයි.ඩී. (ඇ.එ.ජ.) යන ආයතනය නියෝජනය කරයි.

ශ්‍රී ලංකාව, ඇමරිකා එක්සත් ජනපදය සහ ඔස්ට්‍රේලියාව යන රටවල අධ්‍යාපනය හදරා ඇති මොහු, ව්‍යාපාර කළමණාකරණය පිළිබඳ උපාධියක් හ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති (එම්.බී.ඒ./ඔස්ට්‍රේලියා) උපාධියක් දරන අතර ව්‍යාපාර විධායක නිලධාරි සංගමයේ (එම්.ඊ.බී.ඊ./එක්සත් රාජධානිය) සාමාජිකයෙකුද වේ.

# මූල්‍ය ප්‍රකාශ


| | |
|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව | 14 |
| මණ්ඩලීය විගණන කමිටුවේ වාර්තාව | 19 |
| අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය | 20 |
| ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව | 21 |
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 22 |
| ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශය | 23 |
| සර්වව්‍යාපී ආදායම් ප්‍රකාශය | 24 |
| කොටස් ආයෝජනවල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය | 25 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 26 |
| ගිණුම් ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශනවලට සටහන් | 27 |

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව



සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වර්ෂ 2015 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්වකීය වාර්ෂික වාර්තාව මෙහි ලා ඉදිරිපත් කර සිටිනුයේ සතුටිනි.

## ප්‍රධාන කටයුතු හා ව්‍යාපාර කාර්ය සමාලෝචනය

සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික කාර්යයන් වනුයේ ශ්‍රී ලංකාවේ නම් කළ ගුවන් ප්‍රවාහකයා වශයෙන් ගුවන් මගීන්, ගුවන් භාණ්ඩ හා ගුවන් තැපැල් ප්‍රවාහනය සඳහා වන ජාත්‍යන්තර ගුවන් සේවා හා නිශ්චිතව කාල සටහන් ගත කළ/නොකළ ගුවන් සේවා ක්‍රියාත්මක කිරීමය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ හා මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ආශ්‍රිතව ගුවන් පර්යන්ත සේවා සැපයීම, ගුවන්යානා තුළ තීරුබදු රහිත භාණ්ඩ වර්ග විකිණීම සහ රට අභ්‍යන්තර හා ඉන් පරිබාහිර නිවාඩු ගත කිරීමේ සහනදායී සැලසුම් අලෙවි කිරීම යන කටයුතු සමාගමේ අනෙකුත් ප්‍රධාන කාර්යයන්හිලා ගැනේ. සමාගම විසින් ඉටු කරනු ලබන සහායක කර්තව්‍යයන් අතර, තෘතීය පාර්ශ්ව නඩත්තු කටයුතු සැපයීම, ගුවන්යානා මෙහෙයුම් සේවා සැපයීම හා ගුවන් සේවා ආශ්‍රිතව පුහුණු කටයුතු මෙහෙයවීම යනාදිය වේ.

සමාගමට අයත් කර්තව්‍යයන්හි ස්වභාවය සම්බන්ධයෙන්වූ වැදගත් වෙනස්කම් කිසිවක් මූල්‍ය වර්ෂය තුළ සිදු නොවීය.

ව්‍යාපාර සමූහය සමන්විත වනුයේ සමාගම සහ සමාගම විසින් පූර්ණ අයිතිය හොබවන අනුබද්ධ ආයතනයක්වූ සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම යන ආයතනද්වයෙනි. සී/ස ශ්‍රීලංකන් කේටරින් සමාගමට අයත් ප්‍රධාන කර්තව්‍යය වනුයේ ශ්‍රී ලංකාවේ කටුනායක පිහිටි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ හා මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ඔස්සේ ක්‍රියාත්මකවන ගුවන් සමාගම් සඳහා ගුවන් යානාස්ථ ආහාර පාන සැපයුම් සලසා දීමය. මහජනයා හා මාර්ගස්ථ මගීන් සඳහා අවන්හල් පවත්වාගෙන යෑම, ලොන්ඩරි සේවා සම්පාදනය හා මාර්ගස්ථ මගීන් සඳහා හෝටලයක් කළමනාකරණය කිරීම අනෙකුත් සහායක කර්තව්‍යයන්ට ඇතුළත් වේ.

## මූල්‍ය ප්‍රකාශ හා විගණකවරයාගේ වාර්තාව

මූල්‍ය අංශයේ ප්‍රධානියා සහ අධ්‍යක්ෂවරුන් විසින් විධිමත් පරිදි අත්සන් තබන ලද 2015 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ අඩංගු ලේඛන හා ඒ පිළිබඳව විගණකවරයාගේ වාර්තාව මේ වාර්තාවට අමුණා ඇත.

## ගිණුම් ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්ති, අංක 27-70 දක්වා වූ පිටුවල සඳහන් වේ.

## සමූහයේ පිරිවැටුම

සමූහයට අයත් පිරිවැටුම් ප්‍රමාණය රුපියල් මිලියන 134,316 ක් වශයෙන් ගණනය විය. (2013/14 - රුපියල් මිලියන 124,154) සමූහයේ පිරිවැටුම් පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් මූල්‍ය ප්‍රකාශවලට අදාළ 19 වන සටහනෙහි දැක්වේ.

සමාගම සහ සමාගමේ පූර්ණ අයිතිය හිමි අනුබද්ධ ආයතනයක්වූ සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම අතර සිදුවන ගනුදෙනු සාධාරණ වෙළෙඳපොළ මිල ගණන් අනුව ඉටුවේ.

## ප්‍රතිඵල

බදු ගෙවීමට පෙර සමූහයේ ප්‍රතිඵලය රුපියල් මිලියන 16,254 ක ඌනතාවයක් වශයෙන් ගණනය විය. (2013/14 - සමූහයේ ඌනතාවය රුපියල් මිලියන 31,298). බදු සඳහා රුපියල් මිලියන 75 ක ප්‍රමාණයක් (2013/14 - රුපියල් මිලියන 68) ගළපනු ලැබීමෙන් පසුව වර්ෂය සඳහා සමාගමේ ප්‍රතිඵලය රුපියල් මිලියන 16,330 කි. (2013/14 - සමූහයේ ඌනතාවය රුපියල් මිලියන 31,366 කි).

වසර සඳහා වූ ආදායම් ප්‍රකාශය පිටු අංක 23 හි දැක්වේ.

## සමූහයේ ආයෝජන

වසර තුළ සමූහය සඳහාවූ දේපළ, පිරියත සහ උපකරණ ආශ්‍රිත ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 2,897 ක් වශයෙන් ගණනය විය (2013/14 - රුපියල් මිලියන 3,202).

## දේපළ, පිරියත සහ උපකරණ

ශේෂ පත්‍රයේ දිනට සමූහයට අයත් දේපළ, පිරියත සහ උපකරණවල ශුද්ධ පොත් අගය රුපියල් මිලියන 12,336 ක් වශයෙන් ගණනය විය. (2013/14 - රුපියල් මිලියන 9,856). දේපළ, පිරියත සහ උපකරණ හා ඒවායේ සංචලනය පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශවලට අදාළ 3 වන සටහනෙහි දක්වා ඇත.

## ප්‍රකාශිත ප්‍රාග්ධනය

සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 51,617 ක් වශයෙන් ගණනය වේ (2013/14 - රුපියල් මිලියන 51,617).

## සංචිත

2015 මාර්තු මස 31 වන දිනට සමූහයේ මුළු සංචිත ප්‍රමාණය සෘණ රුපියල් මිලියන 118,910 ක් වශයෙන් ගණනය වේ. (2013/14 - සෘණ රුපියල් මිලියන 103,296) රුපියල් මිලියන 123,265 ක් වූ සමුච්චිත අලාභයක්ද (2013/14 - රුපියල් මිලියන 105,873), රුපියල් මිලියන 4,355 ක්වූ ප්‍රාග්ධන සංචිත ප්‍රමාණයක්ද (2013/14 - රුපියල් මිලියන 2,577) මෙහි අඩංගු වේ. මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වෙන කොටස් ආයෝජන වෙනස්කම් පිළිබඳ ප්‍රකාශයෙහි මෙම සංචිත ආශ්‍රිතව සිදුවූ සංචලනය නිරූපණය කර ඇත.

## ආයතනික ප්‍රදාන

වසර තුළ සමූහය විසින් රුපියල් මිලියන 3.65 ක් වූ මුදල් ප්‍රදානයක් සිදු කර ඇත.

## බදුකරණය

සමාගම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ එළඹ ඇති ස්වකීය ගිවිසුම අනුව 2013 මාර්තු මස 31 වන දින දක්වා බදු විරාමයක් භුක්ති වින්දේය. 2011 අංක 22 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනත මගින් සංශෝධිත 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව 2021 මාර්තු මස 31 වන දින දක්වා ස්වකීය සියලුම ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන්වූ සෑම බද්දකින්ම සමාගම නිදහස ලබා ඇත.

දැනට ශ්‍රී ලංකාව හා ද්විත්ව බදු ගිවිසුම් ක්‍රියාත්මක නොකරන රටවල්වලදී සිදුකෙරෙන ස්වකීය එතෙර මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් සමාගම බදු ගෙවනු ලැබීමට යටත් වේ.

සමාගමේ පූර්ණ අයිතිය සතු සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් අනුබද්ධ ආයතනය සම්බන්ධයෙන් සලකා බලන කල, එය යානාස්ථ මුළුතැන් ගෙවල්වලින් සහ මාර්ගස්ථ අවන්හල් වලින් උපයන ආදායම, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා බැඳුණු ගිවිසුම අනුව 2006 ජූනි මස 1 වන දින සිට ක්‍රියාත්මකවන පරිදි බද්දෙන් නිදහස්ය. වෙනත් ප්‍රභවයන් වෙතින් උත්පාදනයවන ආදායම සාමාන්‍ය බදු අනුපාත අනුව බදු ගෙවනු ලැබීමට යටත් වේ.

## කොටස් පිළිබඳ තොරතුරු

2015 මාර්තු මස 31 වන දිනට කොටස් හා සම්බන්ධ තොරතුරු පහත දැක්වේ:

| කොටස් අයිතිය | කොටස් ගණන | හිමිකම් ප්‍රතිශතය |
|---|---:|---:|
| ශ්‍රී ලංකා රජය | 490,986,328 | 95.12 |
| ලංකා බැංකුව | 12,115,571 | 2.35 |
| මහජන බැංකුව | 4,236,136 | 0.82 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 4,236,135 | 0.82 |
| සේවක අර්ථසාධක අරමුදල | 1,863,676 | 0.36 |
| වෙනත් | 2,736,509 | 0.53 |

## අවිනිශ්චිත බැරකම් හා ප්‍රාග්ධන බැඳීම්

2015 මාර්තු මස 31 වන දිනට පැවති අවිනිශ්චිත බැරකම් හා එදින වනවිට එළඹි බැඳීම් ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශවලට අදාළ 24 වන සටහනින් නිරූපණය වේ.

**ශේෂ පත්‍ර දිනයෙන් පසුව උද්ගතවූ සිදුවීම්**

මූල්‍ය ප්‍රකාශවලට අදාළ 26 වන සටහනින් හෙළිදරව් කර ඇති කරුණු හැරුණු විට ගැළපුම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන්නාවූ ශේෂ පත්‍ර දිනෙන් පසුව සිදුවූ කරුණු කිසිවක් උද්ගතවී නොමැත.

**සේවා නියුක්තිය පිළිබඳ ප්‍රතිපත්ති**

ව්‍යාපාර සමූහයට අයත් සේවා නියුක්තිය පිළිබඳ ප්‍රතිපත්තිවලින් පුද්ගල භාවය ගරුත්වයෙහි ලා සැලකෙන අතර, ස්ත්‍රී පුරුෂ භාවය, ජාතිය හෝ ආගම නොසලකා සැමට එක සමාන වෘත්තීය අවස්ථා උදාකර දෙනු ඇත. වසර අවසානයේ සමාගම සහ ඊට අනුබද්ධ ආයතන විසින් සේවයෙහි යොදවන ලද තැනැත්තන් සංඛ්‍යාව 7,870 ක් විය (2013/14 - 7,475).

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

සේවක සේවිකාවනට හා ශ්‍රී ලංකා රජයට අදාළ සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් අද දින දක්වා සිදුකර ඇති බවට තම උපරිම දැනුමේ හා විශ්වාසයට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්වෙයි.

**පාරිසරික ආරක්ෂාව**

සමූහයට අයත් ව්‍යාපාර කටයුතු මගින් පරිසරයට සෘජු හෝ වක්‍ර බලපෑම් එල්ල විය හැකිය. පරිසරයට සිදු විය හැකි අහිතකර බලපෑම් අවම මට්ටමක තබා ගැනීමත්, බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් අදාළ අණපනත්වලට අනුකූලව කටයුතු කිරීමත් සමූහයේ ප්‍රතිපත්තියයි.

**ආයතනික පාලනය/අභ්‍යන්තර පාලනය**

වර්තමාන ආයතනික ලෝකය තුළ යහපාලන විධි අනුගමනය කිරීම අත්‍යවශ්‍ය නියමයක් බවට පත්ව තිබේ.

සමූහයේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදය පිළිබඳව තමන් වගකීම දරණ බව අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනියි. වත්කම් ආරක්ෂා කිරීම, විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ගැනීම හා උත්පාදිත තොරතුරුවල විශ්වසනීයත්වය යන කාරණා අනෙකුත් කරුණුද අතර, සහතික කෙරෙනු පිණිස මෙම ක්‍රමවේදය නිර්මාණය කර ඇත. එසේ වුවද, වැරදි සිදුවීම් හා අක්‍රමිකතාවන් කිසියම් සාධාරණ කාලයක් තුළ වළක්වා ගන්නා බවට හෝ අනාවරණය කරගනු ලබන බවට එවැනි ක්‍රමවේදයක් තුළින් වගබලාගත හැක්කේ කිසියම් යුක්ති සහගත මට්ටමක් දක්වා පමණක්වන අතර, එහිලා පූර්ණ සහතිකවීමක් කළ නොහේ. අධ්‍යක්ෂ මණ්ඩලීය විගණන කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවට අයත් අංගයක් සේ සැකසී ඇත.

මූල්‍ය ප්‍රකාශ අත්සන් කරන ලද දිනය තෙක් කාල පරිච්ඡේදය සඳහාවූ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයේ සඵලත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත් වේ.

**අඛණ්ඩ පැවැත්ම**

අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇති පරිදි, අදාළ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමෙහි දී සමාගම අඛණ්ඩව සිය කටයුතු ක්‍රියාත්මකව පවත්වාගෙන යන ව්‍යාපාරයක්ය යන පදනම මත පිහිටා අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර ඇත.

**වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය**

සමාගමේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය පහත දැක්වේ:

අජිත් නිශ්ශංක ඩයස් මහතා
ජෝශප් බ්‍රිටෝ මහතා
මහින්ද හරදාස මහතා
චානක ද සිල්වා මහතා
රඛිත ජයවර්ධන මහතා
ලුතිනන් කර්නල් සුනිල් පීරිස් මහතා
නිරංජන් ද සිල්වා දේවා ආදිත්‍ය මහතා
හරින්ද්‍ර බාලපටබැඳි මහතා

අජිත් නිශ්ශංක ඩයස්, ජෝශප් බ්‍රිටෝ, මහින්ද හරදාස, ලුතිනන් කර්නල් සුනිල් පීරිස් සහ චානක ද සිල්වා යන මහත්වරුන් 2015 පෙබරවාරි මස 12 වන දින සී/ස ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරුන් ලෙස පත් කරන ලදි.

රබිත ජයවර්ධන මහතා 2015 පෙබරවාරි මස 20 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරුණි.

නිරංජන් ද සිල්වා දේවා ආදිත්‍ය සහ හරින්ද්‍ර බාලපටබැඳි යන මහත්වරුන් පිළිවෙළින් 2015 මැයි මස 26 වන දින හා ජූනි මස 26 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරුණි.

## හිටපු අධ්‍යක්ෂකවරුන්

පහත දැක්වෙන අධ්‍යක්ෂවරු 2015 පෙබරවාරි මස 12 වන දින සිට තම තනතුරුවලින් ඉල්ලා අස්වන තෙක් 2014 අප්‍රේල් මස 01 වන දින සිට 2015 පෙබරවාරි මස 11 වන දින දක්වා කාල පරිච්ඡේදය තුළ ස්වකීය අධ්‍යක්ෂ තනතුරු දැරූහ.

නිශාන්ත වික්‍රමසිංහ මහතා - සභාපති
නිහාල් ජයමාන්න මහතා, ජ.නී. - අධ්‍යක්ෂ
කපිල චන්ද්‍රසේන මහතා - අධ්‍යක්ෂ
ෂමීන්ද්‍ර රාජපක්ෂ මහතා - අධ්‍යක්ෂ
මනිලාල් ප්‍රනාන්දු මහතා - අධ්‍යක්ෂ
ලක්ෂ්මී සංගක්කාර මහත්මිය - අධ්‍යක්ෂ
සනත් උක්වත්ත මහතා - අධ්‍යක්ෂ
සුසන්ත රත්නායක මහතා - අධ්‍යක්ෂ

## වයස අවුරුදු 70 ට වැඩි අධ්‍යක්ෂවරයා පත් කිරීම

වාර්ෂික මහ සභා රැස්වීම අවසන් වූ තැන් සිට තවදුරටත් එක් වසරක කාල සීමාවක් සඳහා වයස අවුරුදු 70 ඉක්මවූ ආර්. චානක ද සිල්වා මහතා සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස නැවත පත් කළ යුතු බවත්, 2007 අංක 7 දරණ සමාගම් පනතේ 210 වන වගන්තිය මගින් නියම කර ඇති වයස් සීමාව අදාළ නොවිය යුතු බවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශය මත නිර්දිෂ්ට කෙරේ.

## ශ්‍රීලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය

ශ්‍රීලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ:

අජිත් නිශ්ශංක ඩයස් මහතා - සභාපති
ජෝශප් බ්‍රිටෝ මහතා - අධ්‍යක්ෂ
චානක ද සිල්වා මහතා - අධ්‍යක්ෂ
මහින්ද හරදාස මහතා - අධ්‍යක්ෂ
ලුතිනන් කර්නල් සුනිල් පීරිස් - අධ්‍යක්ෂ
රබිත ජයවර්ධන මහතා - අධ්‍යක්ෂ

අජිත් නිශ්ශංක ඩයස්, ජෝශප් බ්‍රිටෝ, මහින්ද හරදාස, චානක ද සිල්වා, ලුතිනන් කර්නල් සුනිල් පීරිස් සහ රබිත ජයවර්ධන යන මහත්වරුන් සී/ස ශ්‍රීලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට 2015 මාර්තු මස 10 වන දින අධ්‍යක්ෂවරුන් ලෙස පත් කරන ලදි.

පහත දැක්වෙන අධ්‍යක්ෂවරු 2015 මාර්තු මස 10 වන දින සිට තම තනතුරුවලින් ඉල්ලා අස්වන තෙක් 2014 අප්‍රේල් මස 01 වන දින සිට 2015 මාර්තු මස 09 වන දින දක්වා කාල පරිච්ඡේදය තුළ ස්වකීය අධ්‍යක්ෂ තනතුරු දැරූහ.

නිශාන්ත වික්‍රමසිංහ මහතා - සභාපති
නිහාල් ජයමාන්න මහතා, ජ.නී. - අධ්‍යක්ෂ
ෂමීන්ද්‍ර රාජපක්ෂ මහතා - අධ්‍යක්ෂ
කපිල චන්ද්‍රසේන මහතා - අධ්‍යක්ෂ
සුසන්ත රත්නායක මහතා - අධ්‍යක්ෂ*
ආචාර්ය නාලක ගොඩහේවා - අධ්‍යක්ෂ*
සනත් උක්වත්ත මහතා - අධ්‍යක්ෂ

** ස්වාධීන අධ්‍යක්ෂවරු*

**අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය**

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික පිළිබඳව මූල්‍ය ප්‍රකාශයෙහි 28 වන සටහන මගින් කරුණු අනාවරණය කර ඇත.

**අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකාරිත්වය**

තමන් දරණ තනතුරේ නිල බලය කරණකොටගෙන සභාපතිවරයා ඇතුළු ශ්‍රී ලංකා රජය විසින් නාම යෝජනා කරනු ලබන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක් සමාගමට අයත් සාමාන්‍ය කොටස් 03 ක හිමිකරුවෝ වෙති.

**අධ්‍යක්ෂවරුන් දරණ ගිවිසුම් සබඳතා**

සමාගමට අයත් කොන්ත්‍රාත්තුවල අධ්‍යක්ෂවරුන් දරණ සබඳතා මූල්‍ය ප්‍රකාශයෙහි 28 වන සටහන මගින් හෙළිදරව් කර ඇති අතර, ඒවා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ. සමාගමට අයත් යම් කොන්ත්‍රාත්තුවල හෝ යෝජිත කොන්ත්‍රාත්තු වල අධ්‍යක්ෂවරුන් මගින් දරණු ලබන ඍජු හෝ වක්‍ර සම්බන්ධතා කිසිවක් නොමැත.

**වාර්ෂික මහ සභා රැස්වීම**

2015 ඔක්තෝබර් මස 15 වන දින වාර්ෂික මහ සභා රැස්වීම පවත්වනු ලැබේ.

**විගණකවරු**

වරලත් විගණකවරුන්වන අර්න්ස්ට් ඇන්ඩ් යංග් සමාගම ශ්‍රීලංකන් ගුවන් සමාගමේ විගණකවරුන් වශයෙන් නැවත පත්කරනු ලැබීමේ යෝජනාවක් 2007 අංක 07 දරන සමාගම් පනත අනුව වාර්ෂික මහ සභා රැස්වීමට ඉදිරිපත් කෙරෙනු ඇත.

විගණකවරුන්ගේ ගාස්තු පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශවලට අදාළ 22 වන සටහනෙහි දක්වා ඇත. සමාගම සමඟ හෝ එහි අනුබද්ධ ආයතනය සමඟ (විගණකවරයෙකු වශයෙන් පවත්නා සම්බන්ධය හැරුණු විට) කිසිදු විගණකවරයෙකුගේ සබඳතාවක් නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

**ඩැල්රීන් තිරුකුමාර්**
සමාගමේ ලේකම්

අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ
2015 අගෝස්තු මස 25 වන දින

# මාණ්ඩලීය විගණන කමිටුවේ වාර්තාව



## කාර්යභාරය හා වගකීම්

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ මාණ්ඩලීය විගණන කමිටුවේ විෂය පථය හා වගකීම් පාලනය වනුයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මාණ්ඩලීය විගණන කමිටු ප්‍රඥප්තිය ප්‍රකාරවය. මාණ්ඩලීය විගණන කමිටුවේ මූලික කාර්යභාරය වනුයේ අභ්‍යන්තර පාලන පද්ධතිය, මූල්‍ය වාර්තාකරණ පද්ධතිය, ව්‍යාපාරික අදායම් කළමනාකරණය, අණපනත් හා රෙගුලාසිවලට අනුකූලතාව දැක්වීමේ සමාගම් ක්‍රියාවලිය, සමූහ රක්ෂණ හා උපදේශක සේවා කාර්යයේ කළමනාකරණය සහ බාහිර විගණක කර්තව්‍යයේ ස්වාධීනතාව යන කරුණු පිළිබඳව ස්වාධීන සමාලෝචනයක් සලසාදීම මගින් සිය රාජකාරි කටයුතු ඉටුකිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වීමයි.

## සංයුතිය සහ රැස්වීම්

2015 මාර්තු මස 31 වන දිනට මාණ්ඩලීය විගණන කමිටුවේ සාමාජිකයන් වූයේ ජෝශප් බ්‍රිටෝ (සභාපති), චානක ද සිල්වා (සාමාජික), මහින්ද හරදාස (සාමාජික) සහ ලුතිනන් කර්නල් සුනිල් පීරිස් (සාමාජික) යන මහත්වරුන්ය. 2015 පෙබරවාරි මස 12 වන දින විගණන කමිටුවට ඔවුන් පත් කෙරිණි. ආර්. ජයවර්ධන මහතා 2015 පෙබරවාරි මස 12 වන දින සිට මාර්තු මස 31 වන දින දක්වා මණ්ඩලීය විගණන කමිටුවේ සාමාජිකයකු විය. 2015 ජනවාරි මස 9 වන දින දක්වා සුසන්ත රත්නායක (සභාපති), නිහාල් ජයමාන්න, ජ.නි. (සාමාජික), ලක්ෂ්මී සංගක්කාර (සාමාජික) සහ සනත් උක්වත්ත (සාමාජික) යන මහත්ම මහත්මීන් සිව්දෙනෙකුගෙන් මාණ්ඩලීය විගණන කමිටුව සමන්විත විය. සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ නියෝජිතයා වන එස්.එම්. චන්ද්‍රපාල මහතා ස්වාධීන නිරීක්ෂකවරයා ලෙස කටයුතු කළේය.


2015 මාර්තු මස 31 වන දිනෙන් අවසන්වූ මූල්‍ය වර්ෂය තුළ මාණ්ඩලීය විගණන කමිටුව රැස්වීම් 4 කදී මුණගැසුණේය. නිශ්චිත කරුණු පිළිබඳව මාණ්ඩලීය විගණන කමිටුව දැනුවත් කිරීම සඳහා සමාගමේ කළමනාකරණ සාමාජිකයන් ඔවුන් වෙත ලැබෙන ආරාධනා පරිදි එකී රැස්වීම්වලට සහභාගි විය. මීට අමතර වශයෙන්, අභ්‍යන්තර විගණනයේ ස්වභාවය, විෂය පථය පිළිබඳ දැනුවත්වනු පිණිසත්, මූල්‍ය ප්‍රකාශ හා කළමනාකරණ වාර්තා සමාලෝචනයට භාජනය කිරීම පිණිසත් බාහිර විගණකවරුන් වන අර්න්ස්ට් ඇන්ඩ් යංග් විගණක සමාගම සමඟ මාණ්ඩලීය විගණන කමිටුව රැස්වීම් පැවැත්වීය.

## සමූහාරක්ෂණය සහ උපදේශක සේවා

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම යටතේ කටයුතු කරන සමූහ රක්ෂණ හා උපදේශක සේවා අංශය මාණ්ඩලීය විගණන කමිටුව වෙත ඍජුවම වාර්තා කරයි. ව්‍යවසාය අවදානම් කළමනාකරණ කාර්යරාමුව ක්‍රියාත්මක කිරීමෙහි ලා තොරතුරු පද්ධති/තොරතුරු තාක්ෂණ පාලනය හා පහසුකම් ඇතුළුව අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් භාවය, කාර්යක්ෂමතාව හා ක්‍රියාකාරිත්වය පිළිබඳ ස්වාධීන හා විෂය මූලික තක්සේරුවක් සමූහාරක්ෂණ හා උපදේශක සේවා අංශය මගින් සලසා දෙයි. අඛණ්ඩ ව්‍යාපාර කටයුතු කළමනාකරණ පද්ධතිය සම්බන්ධයෙන් කළමනාකරණය වෙත උපදේශක සේවා සැපයීමද මෙම අංශයෙන් සිදුවේ.

## මූල්‍ය වර්ෂය තුළ මාණ්ඩලීය විගණන කමිටුවේ ප්‍රධාන කර්තව්‍යයන්

- තොරතුරු පද්ධති/තොරතුරු තාක්ෂණ පාලනය සහ විගණන නිර්දේශවල තත්ත්වය ඇතුළුව අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳව විගණනය විසින් නිරාවරණය කළ කරුණු සමාලෝචනයට හසු කරන ලදි.
- ව්‍යාපාර අවදානම්වල බලපෑම් සමනය කරනු පිණිස කළමනාකරණය විසින් අනුගමනය කරනු ලබන ප්‍රධාන ආයතනික මට්ටමේ අවදානම් හා ක්‍රියා පරිපාටි සමාලෝචනය කිරීම.
- සියලුම අදාළ අණපනත් හා රෙගුලාසි අනුව කටයුතු කරන බවට නිශ්චය කරනු පිණිස කාර්තුමය පදනමක් මත සැකසූ සමාගමේ අනුකූලතා උපදෙස් සංග්‍රහය සමාලෝචනයට හසු කරන ලදි.
- එතෙර සේවා ස්ථානවල මනා පද්ධති පාලනය සඳහා වූ බාහිර සේවා ස්ථාන මූල්‍ය කාර්ය සංග්‍රහය සමාලෝචනය කර අනුමත කරන ලදි.
- ආයතනික අවදානම් වඩා හොඳින් නිරූපණය වනු පිණිස අවදානම් පිළිබඳ න්‍යාසය සහ ව්‍යවසාය අවදානම් කළමනාකරණ කාර්ය සංග්‍රහය සමාලෝචනය කර අනුමත කරන ලදි.
- ව්‍යාපාර බාධාවීම්/කඩා වැටීම් යනාදියෙන් සිදුවන බලපෑම් අවමකර ගනු සඳහා ISO 22301 දරණ ප්‍රමිතිය හා අනුකූල වන පරිදි ව්‍යුහගත කාර්ය රාමුවක් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම තුළ ස්ථාපනය වීම සහතික වනු පිණිස ව්‍යාපාර අඛණ්ඩව පවත්වා ගැනීමේ සැලසුම පිළිබඳ තත්ත්වය සමාලෝචනයට හසු කරන ලදි.
- බාහිර විගණක වාර්තාවේ ප්‍රතිඵල හා ඉස්මතු කර දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් කළමනාකරණයේ ප්‍රතිචාරය සමාලෝචනයට හසු කරන ලදි.



**අ/කළේ : ජෝශප් බ්‍රිටෝ**

සභාපති, මාණ්ඩලීය විගණන කමිටුව.

2015 මස අගෝස්තු වන දින 20

# අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය



සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශවලට අදාළ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් විගණකවරුන්ගේ වාර්තාවේ 53 වන පිටුවෙහි ගෙනහැර දක්වා ඇති විගණකවරුන්ගේ වගකීම්වලට වඩා වෙනස් වේ.

මූල්‍ය වර්ෂය අවසානයේදී සමාගමේ සහ සමූහයේ කටයුතුවල තත්ත්වය පිළිබඳ හා අදාළ මූල්‍ය වර්ෂය තුළ සමාගමේ සහ සමූහයේ ලාභය හෝ අලාභය පිළිබඳව සත්‍ය හා සාධාරණ මතයක් පිළිබිඹු වන පරිදි එක් එක් මූල්‍ය වර්ෂය වෙනුවෙන් වූ මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂවරුන් විසින් පිළියෙල කරනු ලැබිය යුතු බවට 2007 අංක 07 දරණ සමාගම් පනත මගින් නියම කර ඇත. මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමෙහි ලා ප්‍රශස්ත ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ඒවා සුසංගත අයුරින් යොදා ඇත. යුක්තයුක්ත වූද, විචක්ෂණශීලීවූද නිගමන හා ඇස්තමේන්තු එහිලා සිදුකර ඇත. අදාළ පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්තිද අනුගමනය කර ඇත.


ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවටත්, 2007 අංක 07 දරණ සමාගම් පනතින් නියම කර ඇති පරිදි අදාළ තොරතුරු සැපයෙන බවටත් සහතික වනු පිණිස සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය යුක්ති සහගත නිවැරදිතාවයකින් යුක්තව හෙළිදරව් කිරීම සඳහා අදාළ සමාගම් සහ අනුබද්ධ ආයතන ප්‍රමාණවත් ගිණුම් වාර්තා තබා ගත යුතු බවට වගබලා ගැනීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ. සමූහයට අයත් වත්කම් ආරක්ෂා කරගනු පිණිස යුක්ති සහගත ක්‍රියාමාර්ග ගැනීමේ වගකීමද ඔවුහු දරති. ඒ අනුව සලකන කළ වංචා හා අක්‍රමිකතා සිදුවීම වැළැක්වීමේ අටියෙන් සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපනය කිරීම සම්බන්ධයෙන්ද නිසි සැලකිල්ලක් ඔවුන් විසින් දැක්විය යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙහි ලා ක්‍රියාකාරී ව්‍යාපාර පදනම අනුගමනය කිරීම අධ්‍යක්ෂකවරුන් තව දුරටත් පවත්වාගෙන ගියේය. සමාගමට අයත් මූල්‍ය ප්‍රවාහය හා ණය ගැනුම් පහසුකම් ඇතුළු 2016 මාර්තු මස 31 වන දිනට අවසන් මූල්‍ය වර්ෂය සඳහා වන අයවැය ලේඛනය පිළිබදව විමසා බලා ඒ පිළිබඳව සමාලෝචනයක් කිරීමෙන් හා මෙහි මූල්‍ය ප්‍රකාශවල 2.1.2 වන සටහන යටතේ විස්තරාත්මකව දක්වා ඇති නව සම කොටස් ආයෝජන හා රාජ්‍ය ඇපකර ප්‍රතිපාදන ඇතුළු ශ්‍රී ලංකා රජය විසින් සිදු කරනු ලබන අමාත්‍යම මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ සැලකිය යුතු අරමුදල්කරණය ද ඇතුළත් නව ව්‍යාපාරික සැලැස්ම සැලකිල්ලට ගැනීමෙන් පසුව ස්වකීය මෙහෙයුම් කටයුතු කරගෙන යාමට සමාගම සන්තකයේ ප්‍රමාණවත් සම්පත් ප්‍රමාණයක් ඇතැයි අධ්‍යක්ෂවරු නිගමනය කරයි.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ ස්වකීය මතය ගොඩනගා ගැනීමට තමන්ට හැකිවනු පිණිස සුදුසු වේයැයි ඔවුන් සලකනු ලබන මොනයම් හෝ පරීක්ෂා කිරීමක් සිදු කිරීමට විගණකවරුන්ට සෑම අවස්ථාවක්ම සලසා දෙනු ලබන බවට සහතික වනු සඳහා අධ්‍යක්ෂවරුන් අවශ්‍ය පියවර ගෙන තිබේ.

ගිණුම් වාර්තා කරනු ලබන දිනට සමාගමට සහ එහි අනුබද්ධ ආයතනයට අදාළව පැවති සියලු බදු හා ගාස්තු මෙන්ම අනෙකුත් මූල්‍ය බැඳීම්ද ගෙවා ඇති බවත්, එසේ නැතහොත් ඒවා අදාළ මූල්‍ය ප්‍රකාශ මගින් ප්‍රතිපාදනය කර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය සිය උපරිම දැනුම අනුව තහවුරු කර සිටී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



**ඩැල්රින් තිරුකුමාර්**
සමාගමේ ලේකම්
2015 අගෝස්තු මස 25 වන දින.

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව



ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව ඉංග්‍රීසි මාධ්‍ය මූල්‍ය ප්‍රකාශයන් සඳහා පමණක් නිකුත් කරන ලදී. ඔබගේ අවශ්‍යතාවය සඳහා පමණක් මෙම තොරතුරු මෙහි පරිවර්ථනය කර ඇත. අත්සන් කරනු ලැබූ ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව ඉංග්‍රීසි මාධ්‍ය 2014/15 වාර්ෂික වාර්තාවේ අඩංගු වේ.

## ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ කොටස්හිමියන් වෙත

### මූල්‍ය ප්‍රකාශ පිළිබඳ වාර්තාව

2015 මාර්තු මස 31 වන දිනට පිළියෙල කළ පිටු අංක 27-70 හි නිරූපණය කරන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශවලින්ද, එදිනට අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශ, සර්වව්‍යාපී ආදායම් ප්‍රකාශ, කොටස් ආයෝජනයේ වෙනස්වීම් ප්‍රකාශ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ වලින්ද, වැදගත් ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳ සම්පිණ්ඩනයකින් හා කරුණු පැහැදිලි කිරීමේ වෙනත් සටහන් වලින්ද සමන්විත සී/ස ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාග මට ('සමාගම') අයත් මීට යාකර ඇති මූල්‍ය ප්‍රකාශ සහ එකී සමාගමට සහ එහි අනුබද්ධ සමාගමට අයත් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කරනු ලැබ තිබේ.

### මූල්‍ය ප්‍රකාශ සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශ ගෙනහැර දැක්වෙන පරිදි සකස් කිරීම සම්බන්ධවද, වංචා හා වැරදි හේතුකාරකව තිබුණද, නොතිබුණද, සැලකිය යුතු අවප්‍රකාශවලින් තොරවූ මූල්‍ය ප්‍රකාශ සැකසීමට හැකිවනු පිණිස මණ්ඩලය විසින් අවශ්‍ය වන්නේ යැයි නිශ්චය කරනු ලබන කවර හෝ අභ්‍යන්තර පාලන විධි සම්බන්ධවද අධ්‍යක්ෂ මණ්ඩලය ('මණ්ඩලය') වගකීම උසුලයි.

### විගණකවරුන්ගේ වගකීම

අපගේ වගකීම වන්නේ අප විගණනය පදනම්කර ගනිමින් මෙම මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මතයක් පළ කිරීමය. අප අපගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුව ඉටුකර ඇත. අදාළ මූල්‍ය ප්‍රකාශ සැලකිය යුතු අවප්‍රකාශවලින් තොරව පවතින්නේද නොපවතින්නේද යන කරුණු පිළිබඳව යුක්ති සහගත සහතිකයක් ලබා ගැනීම සඳහා අදාළ විගණනය අප විසින් ආචාර සම්පන්න නියමයනට අනුකූලව සැලසුම් කර ඉටුකරනු ලැබ තිබීම එකී ප්‍රමිතීන් තුළින් අපේක්ෂා කෙරේ.

මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන ගණන් ප්‍රමාණ සහ හෙළිදරව් කිරීම් පිළිබඳවත් විගණන සාක්ෂි ලබාගැනීම සඳහා වන ක්‍රියාකාරී කාර්ය පරිපාටි විගණනයකට අදාළ වේ.

මෙම තෝරාගත් කාර්ය පරිපාටි රඳා පවතිනුයේ, වංචා හා වැරදි හේතු කාරකව තිබුණද, නොතිබුණද මූල්‍ය ප්‍රකාශවල ඇති සැලකිය යුතු අවප්‍රකාශ හා සම්බන්ධ අවදානම් තක්සේරුවක්ද ඇතුළත් විගණකවරයාගේ නිශ්චයමතිය මතය. මෙම අවදානම් තක්සේරු සැකසීමෙහිලා, විගණකවරයා අදාළ ආයතනයේ අභ්‍යන්තර පාලනයෙහි ක්‍රියාකාරීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණ ඇතිව නොව අවස්ථානුකූලව ප්‍රශස්ත වන්නාවූ විගණන ක්‍රියා පරිපාටි සැලසුම් කිරීම සඳහා සත්‍ය සහ සාධාරණ මතයක් නිරූපණය කරන ආයතනයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට අදාළ අභ්‍යන්තර පාලනය සලකා බලයි. මණ්ඩලය විසින් භාවිතා කරන ලද ගිණුම් ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය හා ගිණුම් ඇස්තමේන්තුවල යෝග්‍යතාවය හා ගිණුම් ඇස්තමේන්තුවල යුක්ති සහගත බව ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරීම ඇගයීම ද විගණනයකට ඇතුළත් වේ.

අප විසින් ලබාගන්නා ලද විගණන සාක්ෂි අපගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම පිණිස ප්‍රමාණවත් හා යෝග්‍ය වන්නේ යැයි අපි විශ්වාස කරමු.

### මතය

අපගේ මතයට අනුව, 2015 මාර්තු මස 31 වන දිනට අදාළ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ එදිනට අවසන් වර්ෂය සඳහා වූ සමූහයේ මූල්‍ය තත්ත්වය පිළිබඳව සත්‍ය හා සාධාරණ දර්ශනයක් පිළිබිඹු කරන බවත්, එදිනට අවසන් වර්ෂය සඳහාවූ සමූහයේ මූල්‍ය කාර්යකරණය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රකාරව ඉදිරිපත්කර ඇති බවත් පෙන්නුම් කරයි.

### කරුණු අවධාරණය

අහිතකර මූල්‍ය තත්ත්වය, මෙම තත්ත්වයන් පිළිබඳ කළමනාකරණයේ තක්සේරුව සහ ලුහුකිරීමේ සාධක විස්තර වන මෙම මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇති 2.1.2 වන සටහනට අපගේ මතය හා කිසිදු බැඳීමකින් තොරව අපි ඔබගේ අවධානය යොමු කරන්නෙමු.

### වෙනත් නෛතික හා නියාමන කරුණු පිළිබඳ වාර්තාව

2007 අංක 7 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මගින් නියමකර ඇති පරිදි පහත සඳහන් කරුණු ගෙනහැර දක්වමු.

(අ) විගණන මතයේ පදනම, විෂය පථය හා සීමා ඉහත සඳහන් පරිදිය.

(ආ) අපගේ මතය අනුව,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා කරුණු පැහැදිලි කිරීම් අප විසින් ලබාගෙන ඇත්තෙමු. අපගේ පරීක්ෂණ මගින් පෙනීයන පරිදි සමාගම විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබ තිබේ.
- සමාගමේ මූල්‍ය ප්‍රකාශ 2015 මාර්තු මස 31 වන දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය පිළිබඳව හා එදිනට අවසන් වර්ෂය සඳහා වූ සමාගමේ කාර්යකරණය හා එහි මුදල් ප්‍රවාහය පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සත්‍ය සහ සාධාරණ දර්ශනයක් පිළිබිඹු කරයි.
- සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ 2007 අංක 7 දරන සමාගම් පනතේ 151 හා 153 වන වගන්තිවල නියමයන් හා සාරානුකූල වේ.

### කරුණු අවධාරණය

අහිතකර මූල්‍ය තත්ත්වය, මෙම තත්ත්වයන් පිළිබඳ කළමනාකරණයේ තක්සේරුව සහ ලුහුකිරීමේ සාධක විස්තර වන මෙම මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇති 2.1.2 වන සටහනට අපගේ මතය හා කිසිදු බැඳීමකින් තොරව අපි ඔබගේ අවධානය යොමු කරන්නෙමු.

**අර්න්ස්ට් ඇන්ඩ් යංග්, වරලත් ගණකාධිකාරිවරු**
2015 අගෝස්තු මස 25 වන දින.
කොළඹ.

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය



| *මාර්තු 31 දිනට* | සටහන | සමූහය 2015 රු. මිලියන | සමූහය 2014 රු. මිලියන | සමාගම 2015 රු. මිලියන | සමාගම 2014 රු. මිලියන |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| ජංගම නොවන වත්කම් | | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 3 | **12,336.15** | 9,855.74 | **9,809.97** | 8,371.32 |
| ගුවන්යානා ඇණවුම් කිරීමේ පූර්ව ගෙවීම් | 4 | **2,267.93** | 4,053.25 | **2,267.93** | 4,053.25 |
| ගුවන්යානා නඩත්තු සංචිතය | 5 | **6,069.40** | 7,350.71 | **6,069.40** | 7,350.71 |
| ගුවන්යානා හා අතිරේක එන්ජින් තැන්පතු | | **3,366.81** | 3,087.46 | **3,366.81** | 3,087.46 |
| අස්පෘෂ්‍ය වත්කම් | 6 | **1,285.07** | 2,313.21 | **1,280.23** | 2,307.29 |
| ආයෝජන | 7 | **0.40** | 0.40 | **42.44** | 42.44 |
| | | **25,325.76** | 26,660.77 | **22,836.78** | 25,212.47 |
| **ජංගම වත්කම්** | | | | | |
| ඉන්වෙන්ට්‍රි භාණ්ඩ | 8 | **5,397.87** | 5,040.23 | **5,078.20** | 4,749.74 |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු මුදල් | 9 | **32,818.75** | 17,091.66 | **32,114.66** | 15,959.49 |
| ගුවන්යානා නඩත්තු සංචිතය | 5 | **6,209.96** | 9,384.01 | **6,209.96** | 9,384.01 |
| ගුවන්යානා හා අතිරේක එන්ජින් තැන්පතු | | **1,559.26** | 603.67 | **1,559.26** | 603.67 |
| බැංකු හා මුදල් ශේෂ | 10 | **4,846.70** | 6,606.63 | **4,759.41** | 6,457.32 |
| | | **50,832.54** | 38,726.20 | **49,721.49** | 37,154.23 |
| **මුළු වත්කම්** | | **76,158.30** | 65,386.97 | **72,558.27** | 62,366.70 |
| | | | | | |
| **කොටස් ආයෝජන හා බැරකම්** | | | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 11 | **51,617.44** | 51,617.44 | **51,617.44** | 51,617.44 |
| සංචිත | 12 | **4,355.27** | 2,576.72 | **2,514.89** | 1,905.01 |
| සමුච්චිත අලාභය | | **(123,265.57)** | (105,872.85) | **(128,238.23)** | (110,743.40) |
| **මුළු කොටස් ආයෝජනය** | | **(67,292.86)** | (51,678.69) | **(74,105.90)** | (57,220.95) |
| **ජංගම නොවන බැරකම්** | | | | | |
| වරණීය කොටස් | 13 | **1,000.00** | 1,000.00 | **–** | – |
| පොලී දරන බැරකම් | 14 | **35,707.81** | 23,175.52 | **35,692.91** | 23,830.99 |
| වෙනත් දිගු කාලීන බැරකම් | 15 | **8,084.01** | 7,504.76 | **7,556.95** | 7,147.59 |
| | | **44,791.82** | 31,680.28 | **43,249.86** | 30,978.58 |
| **ජංගම බැරකම්** | | | | | |
| ගුවන් ප්‍රවාහන පූර්ව විකුණුම් | 16 | **18,166.28** | 17,037.51 | **18,166.28** | 17,037.51 |
| වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු මුදල් | 17 | **39,922.28** | 46,420.09 | **44,699.86** | 49,438.18 |
| ගෙවිය යුතු ආදායම් බදු | | **189.13** | 193.48 | **175.45** | 175.45 |
| පොලී දරන බැරකම් | 14 | **40,381.65** | 21,734.30 | **40,372.72** | 21,957.93 |
| | | **98,659.34** | 85,385.38 | **103,414.31** | 88,609.07 |
| **මුළු කොටස් ආයෝජනය හා බැරකම්** | | **76,158.30** | 65,386.97 | **72,558.27** | 62,366.70 |

මෙම මූල්‍ය ප්‍රකාශ 2007 අංක 07 දරන සමාගම් පනතේ නියමයන්ට අනුකූල වේ.

මූල්‍ය කළමනාකරණ අංශ ප්‍රධානී

අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර ඉදිරිපත් කිරීමේ වගකීම උසුලයි.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත අත්සන් තබමි.

අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ

අංක 27 සිට 70 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම අංගයක් නියෝජනය කරයි.
2015 අගෝස්තු 25 වන දින කොළඹ දීය.

# ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශය



| මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | සමූහය 2015 රු. මිලියන | සමූහය 2014 රු. මිලියන | සමාගම 2015 රු. මිලියන | සමාගම 2014 රු. මිලියන |
|---|---|---|---|---|---|
| **ආදායම්** | 19 | 134,316.22 | 124,154.62 | 131,922.13 | 121,585.83 |
| **වියදම්** | | | | | |
| ගුවන්යානා ඉන්ධන පිරිවැය | | (53,451.02) | (59,946.90) | (53,451.02) | (59,946.90) |
| සේවක පිරිවැය | | (10,186.63) | (9,102.15) | (9,213.90) | (8,352.93) |
| ගුවන්තොටුපළ, මාර්ගස්ථ හා ගුවන් මගී වියදම් | | (20,091.51) | (20,296.42) | (22,214.10) | (21,959.90) |
| ගුවන් යානා සඳහා බදු කුලී | | (16,315.67) | (14,555.03) | (16,315.67) | (14,555.03) |
| ගුවන්යානා නඩත්තු හා පිරිවැඩියා වියදම් | | (11,605.42) | (17,356.23) | (11,605.42) | (17,356.23) |
| ක්ෂයවීම්/ක්‍රමක්ෂය කිරීම් | | (2,555.60) | (1,886.63) | (2,275.98) | (1,602.79) |
| විකුණුම්, අලෙවි සහ ප්‍රචාරණ වියදම් | | (11,828.85) | (10,250.27) | (11,828.85) | (10,250.27) |
| සේවක පිරිස් වියදම් | | (10,643.54) | (8,992.43) | (10,643.54) | (8,992.43) |
| වෙනත් මෙහෙයුම් වියදම් | | (9,215.25) | (8,007.25) | (8,434.87) | (7,372.98) |
| **මෙහෙයුම් අලාභය** | 21 | (11,577.27) | (26,238.69) | (14,061.22) | (28,803.63) |
| වෙනත් ආදායම් සහ ලාභ | 20 | 292.47 | 260.50 | 2,525.59 | 1,673.46 |
| මූල්‍ය ආදායම් | 22.1 | 124.95 | 974.81 | 112.06 | 969.11 |
| මූල්‍ය පිරිවැය | 22.2 | (5,094.68) | (6,294.26) | (5,009.46) | (6,196.92) |
| **බදු පූර්ව අලාභය** | | (16,254.53) | (31,297.64) | (16,433.03) | (32,357.98) |
| ආදායම් බදු වියදම් | 23 | (75.37) | (68.19) | (61.63) | (50.36) |
| **වර්ෂය සඳහා අලාභය** | | (16,329.90) | (31,365.83) | (16,494.66) | (32,408.34) |

අංක 27 සිට 70 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම අංගයක් නියෝජනය කරයි.

# සර්වව්‍යාපී ආදායම් ප්‍රකාශය



| මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | සමූහය 2015 රු. මිලියන | සමූහය 2014 රු. මිලියන | සමාගම 2015 රු. මිලියන | සමාගම 2014 රු. මිලියන |
|---|---|---|---|---|---|
| **වර්ෂය සඳහා අලාභය** | | (16,329.90) | (31,365.83) | (16,494.66) | (32,408.34) |
| **වෙනත් සර්වව්‍යාපී ආදායම/(අලාභය)** | | | | | |
| **පසු කාල සීමාවලදී ලාභයට හෝ අලාභයට ප්‍රතිවර්ගීකරණය නොකළ යුතු වෙනත් සර්වව්‍යාපී ආදායම/(අලාභය) (බදු රහිත)** | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත ජීව ගණක ලාභය/(අලාභය) | 15.2 | (1,116.89) | 512.66 | (1,054.24) | 548.19 |
| දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය | | 1,906.85 | – | 663.95 | – |
| ප්‍රත්‍යාගණන, වත්කම් මත විලම්බිත බදු බැරකම් | | (74.23) | – | – | – |
| | | 715.73 | 512.66 | (390.29) | 548.19 |
| **ලොහයට හෝ අලාභයට ප්‍රතිවර්ගීකරණය කළ යුතු වෙනත් සර්වව්‍යාපී ආදායම/(අලාභය) (බදු රහිත)** | | | | | |
| විකුණුම් ආයෝජන සඳහා ඇති දෑ මත ශුද්ධ ලාභය | | – | 1,027.30 | – | 1,027.30 |
| | | – | 1,027.30 | – | 1,027.30 |
| **වර්ෂය සඳහා බදු රහිත මුළු වෙනත් සර්වව්‍යාපී ආදායම/(අලාභය)** | | 715.73 | 1,539.96 | (390.29) | 1,575.49 |
| **වර්ෂය සඳහා බදු රහිත මුළු සර්වව්‍යාපී ආදායම/(අලාභය)** | | (15,614.17) | (29,825.87) | (16,884.95) | (30,832.85) |

අංක 27 සිට 70 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම අංගයක් නියෝජනය කරයි.

# කොටස් ආයෝජනවල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය



| *මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා* | සටහන | සමූහය<br>ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන | ප්‍රත්‍යාගණන සංචිතය රු. මිලියන | විකුණුම් සංචිතය සඳහා පවත්නා රු. මිලියන | ආදායම් සංචිතය රු. මිලියන | පොදු සංචිතය රු. මිලියන | සමුච්චිත අලාභය රු. මිලියන | එකතුව රු. මිලියන |
|---|---|---|---|---|---|---|---|---|
| **2013 අප්‍රේල් 1 වන දිනට ශේෂය** | | 32,032.75 | 2,522.65 | (1,027.30) | 0.63 | 53.44 | (75,019.68) | (41,437.51) |
| වර්ෂය සඳහා අලාභය | | – | – | – | – | – | (31,365.83) | (31,365.83) |
| වෙනත් සර්වව්‍යාපී ආදායම | | – | – | 1,027.30 | – | – | 512.66 | 1,539.96 |
| මුළු සර්වව්‍යාපී ආදායම/(අලාභය) | | – | – | 1,027.30 | – | – | (30,853.17) | (29,825.87) |
| කොටස් ප්‍රාග්ධනය සඳහා අත්තිකාරම් | 11.2 | 19,584.69 | – | – | – | – | – | 19,584.69 |
| **2014 මාර්තු 31 වන දිනට ශේෂය** | | 51,617.44 | 2,522.65 | – | 0.63 | 53.44 | (105,872.85) | (51,678.69) |
| පැවරූ සංචිත* | | – | – | – | (0.63) | (53.44) | 54.07 | – |
| වර්ෂය සඳහා අලාභය | | – | – | – | – | – | (16,329.90) | (16,329.90) |
| වෙනත් සර්වව්‍යාපී ආදායම | | – | 1,832.62 | – | – | – | (1,116.89) | 715.73 |
| මුළු සර්වව්‍යාපී ආදායම/(අලාභය) | | – | 1,832.62 | – | – | – | (17,446.79) | (15,614.17) |
| **2015 මාර්තු 31 වන දිනට ශේෂය** | | 51,617.44 | 4,355.27 | – | – | – | (123,265.57) | (67,292.86) |

| *මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා* | සටහන | සමාගම<br>ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන | ප්‍රත්‍යාගණන සංචිතය රු. මිලියන | විකුණුම් සංචිතය සඳහා පවත්නා රු. මිලියන | ආදායම් සංචිතය රු. මිලියන | පොදු සංචිතය රු. මිලියන | සමුච්චිත අලාභය රු. මිලියන | එකතුව රු. මිලියන |
|---|---|---|---|---|---|---|---|---|
| **2013 අප්‍රේල් 1 වන දිනට ශේෂය** | | 32,032.75 | 1,850.94 | (1,027.30) | 0.63 | 53.44 | (78,883.25) | (45,972.79) |
| වර්ෂය සඳහා අලාභය | | – | – | – | – | – | (32,408.34) | (32,408.34) |
| වෙනත් සර්වව්‍යාපී ආදායම | | – | – | 1,027.30 | – | – | 548.19 | 1,575.49 |
| මුළු සර්වව්‍යාපී ආදායම/(අලාභය) | | – | – | 1,027.30 | – | – | (31,860.15) | (30,832.85) |
| කොටස් ප්‍රාග්ධනය සඳහා අත්තිකාරම් | 11.2 | 19,584.69 | – | – | – | – | – | 19,584.69 |
| **2014 මාර්තු 31 වන දිනට ශේෂය** | | 51,617.44 | 1,850.94 | – | 0.63 | 53.44 | (110,743.40) | (57,220.95) |
| පැවරූ සංචිත* | | – | – | – | (0.63) | (53.44) | 54.07 | – |
| වර්ෂය සඳහා අලාභය | | – | – | – | – | – | (16,494.66) | (16,494.66) |
| වෙනත් සර්වව්‍යාපී ආදායම | | – | 663.95 | – | – | – | (1,054.24) | (390.29) |
| මුළු සර්වව්‍යාපී ආදායම/(අලාභය) | | – | 663.95 | – | – | – | (17,548.90) | (16,884.95) |
| **2015 මාර්තු 31 වන දිනට ශේෂය** | | 51,617.44 | 2,514.89 | – | – | – | (128,238.23) | (74,105.90) |

** පිළිවෙළින් රු. මිලියන 0.63 ක් සහ රු. මිලියන 53.44 ක් වශයෙන් ගණනය වන ආදායම් සංචිත හා පොදු සංචිත ප්‍රමාණයක් උපයෝගීකර නොගෙන සැලකිය යුතු කාලපරිච්ඡේදයක් පුරා පැවති අතර, මෙම සංචිත උපයෝජනය පිණිස කළමනාකරණයට සැලැස්මක් නැත. මෙම සංචිත වසර තුළ සමුච්චිත අලාභ සංචිතය කරා මාරු කර ඇත.*

අංක 27 සිට 70 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම අංගයක් නියෝජනය කරයි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය



| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2015 රු. මිලියන | 2014 රු. මිලියන | 2015 රු. මිලියන | 2014 රු. මිලියන |
| **මෙහෙයුම් කටයුතුවලින් ලැබූ/(යොදාගත්) මුදල් ප්‍රවාහ** | | | | | |
| ආදායම් බදු වියදම් පූර්ව අලාභය | | (16,254.53) | (31,297.64) | (16,433.03) | (32,357.98) |
| ගැළපුම්කළා: | | | | | |
| ක්ෂයවීම/ක්‍රමක්ෂය කිරීම් | | 2,521.76 | 1,886.63 | 2,238.82 | 1,602.79 |
| මූල්‍ය පිරිවැය | 22.2 | 5,094.68 | 6,294.26 | 5,009.46 | 6,196.92 |
| දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය ව්‍යපහරණ (ලාභය)/අලාභය | 20 | (5.08) | (9.08) | (2.47) | (9.08) |
| මූල්‍ය ආදායම් | 22.1 | (124.95) | (974.81) | (112.06) | (969.11) |
| ලැබිය යුතු මුදල් දුබලතා (ප්‍රතිවර්තනය)/ප්‍රතිපාදනය | | 230.32 | 97.51 | 225.55 | 118.75 |
| මන්දගාමීව චලනය වන ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ප්‍රතිපාදනය | 8.1 | 279.85 | 303.83 | 264.83 | 302.78 |
| නඩත්තු සංචිත දුබලතා ප්‍රතිපාදනය | | 4,024.42 | 3,061.11 | 4,024.42 | 3,061.11 |
| උපලබ්ධි නොවූ විනිමය (ලාභයේ)/අලාභයේ බලපෑම | | 503.23 | 318.47 | 753.48 | 656.77 |
| පූර්ව විකුණුම් ආපසු ලිවීම | | (1,269.28) | (1,357.28) | (1,269.28) | (1,357.28) |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 15.2 | 591.36 | 544.48 | 528.54 | 492.17 |
| කාරක ප්‍රාග්ධන වෙනස්කම් පූර්ව මෙහෙයුම් අලාභය | | (4,408.22) | (21,132.52) | (4,771.74) | (22,262.16) |
| ඉන්වෙන්ට්‍රි භාණ්ඩ වැඩිවීම | | (637.50) | (322.21) | (593.29) | (387.63) |
| පූර්ව ප්‍රවාහන විකුණුම් වැඩිවීම | | 2,398.05 | 339.49 | 2,398.05 | 339.49 |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු මුදල් (වැඩිවීම)/අඩුවීම | | (3,390.28) | 187.36 | (3,813.59) | 487.89 |
| වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු මුදල් වැඩිවීම/(අඩුවීම) | | (1,461.62) | 19,433.95 | 43.91 | 19,975.02 |
| නඩත්තු සංචිත (වැඩිවීම)/අඩුවීම | | (4,498.15) | (3,635.17) | (4,498.15) | (3,635.17) |
| ගුවන්යානා ආරක්ෂක තැන්පතු වැඩිවීම | | (1,155.50) | (448.90) | (1,155.50) | (448.90) |
| මෙහෙයුම් කටයුතුවලින් ජනනයවූ/(යොදාගත්) මුදල් | | (13,153.22) | (5,578.00) | (12,390.31) | (5,931.46) |
| ගෙවූ මූල්‍යන පිරිවැය | | (4,512.68) | (3,920.77) | (4,427.45) | (3,765.51) |
| ගෙවූ පාරිතෝෂික | 15.2 | (231.50) | (194.53) | (201.69) | (179.76) |
| ගෙවූ ආදායම් බදු | | (18.09) | (54.29) | – | – |
| **මෙහෙයුම් කටයුතුවල යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | (17,915.49) | (9,747.59) | (17,019.45) | (9,876.73) |
| **ආයෝජන කටයුතුවලින් ලැබූ/(යොදාගත්) මුදල් ප්‍රවාහ** | | | | | |
| ලැබූ පොළිය | | 124.95 | 974.81 | 112.06 | 969.11 |
| දේපළ, පිරියත හා උපකරණ අත්කර ගැනීම | | (1,977.32) | (1,770.87) | (1,893.30) | (1,725.90) |
| දේපළ, පිරියත හා උපකරණ මත අත්තිකාරම් ප්‍රතිවර්තනය | | – | 51.77 | – | – |
| ගුවන්යානා පූර්ව බෙදාහැරීමේ ගෙවීම් | | 2,035.12 | (6,799.00) | 2,035.12 | (6,799.00) |
| අස්පෘෂ්‍ය වත්කම් අත්කර ගැනීම් | | (273.68) | (706.42) | (273.26) | (700.28) |
| දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘෂ්‍ය වත්කම් ව්‍යපහරණයෙන් ලත් මුදල් | | 13.44 | 15.94 | 7.12 | 15.94 |
| **ආයෝජන කටයුතුවල යෙදවූ ශුද්ධ මුදල්** | | (77.49) | (8,233.77) | (12.26) | (8,240.13) |
| **මූල්‍යන කටයුතුවලින් ලැබූ/(යොදාගත්) මුදල් ප්‍රවාහ** | | | | | |
| පොළී දරණ බැරකම් ආපසු ගෙවීම | | (24,032.91) | (31,117.71) | (24,983.43) | (31,090.39) |
| භාණ්ඩාගාර බැඳුම්කර ව්‍යපහරණයෙන් ලත් මුදල් | | – | 22,477.99 | – | 22,477.99 |
| පොළී දරණ ණය සහ ණය ගැනුම්වලින් ලත් මුදල් | | 40,926.58 | 28,740.00 | 40,977.85 | 28,739.98 |
| **මූල්‍යන කටයුතුවලින් ශුද්ධ මුදල්** | | 16,893.67 | 20,100.28 | 15,994.42 | 20,127.58 |
| **මුදල් හා මුදල් සාම්‍යයන්හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | (1,099.31) | 2,118.92 | (1,037.29) | 2,010.72 |
| **වසරාරම්භ මුදල් හා මුදල් සමාන දෑ** | 10 | (2,419.11) | (4,538.03) | (2,568.42) | (4,579.14) |
| **වසරාවසාන මුදල් හා මුදල් සමාන දෑ** | 10 | (3,518.42) | (2,419.11) | (3,605.71) | (2,568.42) |

අංක 27 සිට 70 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම අංගයක් නියෝජනය කරයි.

# ගිණුම් ප්‍රතිපත්ති හා මූල්‍යමය ප්‍රකාශනවලට සටහන්

*2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය*



## 1. ආයතනික තොරතුරු

### 1.1 සාමාන්‍ය

සමාගම

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ් ('සමාගම') ආයතනය ශ්‍රී ලංකාව තුළ සංස්ථාගතව හා නිවස්නගතව ඇති සීමිත වගකීම් සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය හා ප්‍රධාන ව්‍යාපාර ස්ථානය ගුවන් සමාගම් මධ්‍යස්ථානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ, කටුනායක, ශ්‍රී ලංකාව යන ලිපිනයෙහි පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන කර්තව්‍යයන් හා මෙහෙයුම් කටයුතුවල ස්වභාව

සමාගම

මගීන්, ගුවන් භාණ්ඩ හා ගුවන් තැපෑල් ප්‍රවාහනය සඳහා ජාත්‍යන්තර වශයෙන් නිශ්චිත කාලසටහන් සහිතව සහ රහිතව ශ්‍රී ලංකාව තුළ නම් කළ ගුවන් බඩු ප්‍රවාහකයා වශයෙන් ගුවන් සේවා ක්‍රියාත්මක කිරීම සමාග මේ ප්‍රධාන කර්තව්‍යයන් වේ. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ සහ මත්තල රාජපක්ෂ ගුවන් තොටුපළේ ගුවන් ගමන් පර්යන්ත සේවා සැපයීමත් ගුවන්යානා තුළ තීරුබදු රහිත භාණ්ඩ විකිණීමත්, අභ්‍යන්තර හා බාහිර සංචාරක නිවාඩු පැකේජ අලෙවි කිරීමත් සමාගමේ අනෙකුත් ප්‍රධාන කටයුතු අතර වේ. සමාගමේ සහායක සේවා කටයුතු සමන්විත වනුයේ තෘතීය පාර්ශවවලට නඩත්තු සේවා සැපයීමත් ගුවන්යානා මෙහෙයුම් සේවා සලසා දීමත් ගුවන් සේවා ආශ්‍රිත පුහුණු වැඩසටහන් මෙහෙයවීමත් යනාදියෙනි.

අනුබද්ධ සමාගම – ශ්‍රීලංකන් කේටරින් ලිමිටඩ්

ශ්‍රීලංකන් කේටරින් ලිමිටඩ් ('අනුබද්ධ සමාගම')ආයතනයේ ප්‍රධාන කර්තව්‍ය වනුයේ ණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සහ මත්තල රාජපක්ෂ ගුවන් තොටුපළ ඔස්සේ ක්‍රියාත්මක වන ගුවන් සමාගම්වලට ගුවන්යානාස්ථ ආහාර පාන සැපයුම් සේවා සලසාදීමය. සමාගමේ සහායක සේවා, පොදු හා ගුවන් මගී මාර්ගස්ථ අවන්හල් ක්‍රියාත්මක කිරීම, ලොන්ඩරි සේවා සැපයීම හා ගුවන් ගමන් මගී මාර්ගස්ථ හෝටලය කළමනාකරණය යනාදී කටයුතුවලින් සමන්විත වේ.

### 1.3 නිකුතුව සඳහා බලය පවරන ලද දිනය

2015 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහවූ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සම්බන්ධයෙන් 2015 අගෝස්තු මස 25 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය පවරා දෙන ලදී.

## 2. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 පිළියෙල කිරීමේ පදනම

සාධාරණ වටිනාකමක් මත අගයනු ලැබ ඇති ඉඩම් හා ගොඩනැගිලි සහ ගුවන්යානාස්ථ මුළුතැන්ගෙයි උපකරණ හැරුණු විට සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලැබ ඇත්තේ උපචිත පදනමක් මත සහ ඓතිහාසික පිරිවැය සම්මුතියට යටත්වය.

වෙනත් අයුරකින් සඳහන් කර නොමැති විට හැර, සියලුම මුදල් අගය න් ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලැබ ආසන්නතම රුපියල් දස ලක්ෂයට (මිලියනයට) වටරවුම් කර ඇත.

#### 2.1.1 අනුකූලතා ප්‍රකාශය

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අනුව පිළියෙල කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරන සමාගම් පනත හා අනුකූල වේ.

#### 2.1.2 ක්‍රියාත්මක ව්‍යාපාර තත්ත්වය

ප්‍රවර්තන වර්ෂය තුළ සමාගම රුපියල් මිලියන 16,494.66 ක අලාභයක් (2014 - රුපියල් මිලියන 32,408.34) අත්විඳ ඇති අතර සමුච්චිත අලාභය රුපියල් මිලියන 128,238.23 ක් වූයේය (2014 - රුපියල් මිලියන 110,743.40). තවද, සමාගමේ ජංගම බැරකම් රුපියල් මිලියන 53,692.82 කින් (2014 - රුපියල් මිලියන 51,454.84) එහි ජංගම වත්කම් ඉක්මවන ලද අතර, ගිණුම් වාර්තා කිරීමේ දිනයට සමාගමේ මුළු කොටස් ආයෝජන ප්‍රමාණය රුපියල් මිලියන 74,105.90 ක්වූ ඍණ අගයක් දක්වා පහත වැටී ඇත. (2014 -ඍණ රුපියල් මිලියන 57,220.95).

කළමණාකරණය විසින් ගනු ලැබූ උපායමාර්ගික මුලපිරීම් හේතුවෙන් මෙන්ම විශේෂයෙන් මූල්‍ය වර්ෂයේ අග භාගයේදී ජාත්‍යන්තර ඉන්ධන මිලෙහි සිදුවූ පහත වැටීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමාගමේ කාර්ය සාධනය පසුගිය මූල්‍ය වර්ෂය හා සසඳන කල සැලකිය යුතු අයුරින් වර්ධනය විය. එසේ වුවද එම තත්ත්වය සමමිතික ව්‍යාපාර මට්ටමක් කරා ළඟා වීමට තරම් ප්‍රමාණවත් එකක් නොවූ අතර, කොටස් ආයෝජන නික්ෂේපණ මගින් හා ණය මූල්‍යකරණය සලසා ගැනීම සඳහා වූ රාජ්‍ය ඇපකර මගින් වූ අරමුදල් මෙහෙයුම්කරණ ඔස්සේ ස්වකීය ප්‍රමුඛ කොටස්හිමියා වූ ශ්‍රී ලංකා රජයේ සානුබලය මත සමාගම තවදුරටත් යැපෙමින් සිටී.

2015 ජනවාරි මස සිදුවූ ආණ්ඩු වෙනසින් පසුව පත් වූ නව අධ්‍යක්ෂ මණ්ඩලය අලාභ අවමකර ගැනීම සඳහා තව දුරටත් ගතයුතු වූ ඉදිරි ක්‍රියාමාර්ග වලට අවතීර්ණ වීම පිණිස අවශ්‍ය පියවර ගන්නා ලද අතර ඊළඟ මූල්‍ය වර්ෂය සඳහා වූ වාර්ෂික අයවැය ලේඛනය ඒ අනුව ප්‍රතිශෝධනයට භාජනය කළේය. එමෙන්ම අමාත්‍ය මණ්ඩලයද, ඵලදායි හා පරිපූර්ණ සැලැස්මක් පිළියෙල කරන ලෙස අධ්‍යක්‍ෂ මණ්ඩලයෙන් ඉල්ලා සිටි අතර, අධ්‍යක්ෂ මණ්ඩලය ඒ අනුව ප්‍රතිශෝධිත ව්‍යාපාර සැලැස්මක් ඉදිරිපත් කළ අතර ඒ සඳහා 2015 ජූනි මාසයේදී අනුමැතිය ලැබිණි. ස්වකීය මෙහෙයුම් ප්‍රතිඵලය වර්ධනය කරගනු සඳහාත්, නුදුරු අනාගතයේදී මෙහෙයුම් අලාභ පියවා ගැනීම පිණිස කොටස්හිමියා මත රඳා පැවතීමට සිදුවීම ක්‍රමයෙන් අවම කරගනු සඳහාත් නව ව්‍යාපාර සැලැස්ම මගින් ගුවන් සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමේ කර්තව්‍යයක් ඉදිරිපත් කරනු ඇත.

පාඩු ලබන ගුමන් මාර්ග ආශ්‍රිතව ගුවන් ගමන් අඩුකිරීම හෝ ඉන් ඉවත් වීම හා වර්ධනය සඳහා වැඩි ඉඩකඩක් ඇති ගුවන් මාර්ග සංවර්ධනය කිරීම වැනි කාර්යයන් මගින් ගුවන් ගමන් ජාල සේවය ප්‍රති ඇගයුමට ලක් කිරීමත් ප්‍රතිශෝධිත ගුවන් ගමන් ජාල සේවය සමග ගුවන්යානා ඇණිය සමායෝජනය කිරීමත් වියදම් අවම කිරීමත් ආයෝජන විධිමත් කිරීමත් සමූහයට අයත් උපායමාර්ගික ව්‍යාපාර ඒකකවල (ශ්‍රී ලංකන් කේටරින්, ගුවන් තොටුපළ සේවා, ඉංජිනේරු කටයුතු, පුහුණු කටයුතු) පූර්ණ සේවා ධාරිතාව සලසා ගැනීමත් සමූහයේ උපායමාර්ගික ව්‍යාපාර ඒකකයක් ලෙස මිහින් ලංකා ගුවන් සමාගම පරිවර්තනය කිරීමේ අරමුණ ඇතිව එය ප්‍රතිව්‍යුහගත කිරීමත් ශ්‍රී ලංකා රජයේ සමකොටස් නික්ෂේපණ/ඇපකර යන දෙයාකාර මූලාශ්‍ර භාවිතාකර සමාගම වෙත මූල්‍යකරණය සලසා ගැනීමත් අදාළ ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනේ ප්‍රධාන අංගවලට ඇතුළත් වේ.

2015/16 සිට 2016/17 දක්වා කාලය සඳහා වූ නව ව්‍යාපාර සැලැස්ම මත පදනම්ව අමාත්‍ය මණ්ඩලය ඇ. ඩො. මිලියන 225 ක මුළු කොටස් නික්ෂේපණයක් (කලින් අනුමතකර තිබූ ඇ. ඩො. මිලියන 500 ක් අවසාන මුදල් කොටසෙහි 2014/15 වර්ෂය සඳහා ලැබීමට නියමිත ඇ. ඩො. මිලියන 125 ක්ද ඇතුළත්ව) අනුමත කළේය. තවද ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැසුම් ක්‍රියාත්මක කරන තෙක් හා ශ්‍රී ලංකා රජයේ සම කොටස් නික්ෂේපණය සිදුවන තෙක් ගුවන් සමාගම වෙත සහය දැක්වීමේ අරමුණු ඇතිව සමාගමේ පරිශේෂව පවත්නා ගෙවීම් පියවා ගැනීමටත් ජෙට් ඉන්ධන ඉදිරි කාලය තුළ මිලදී ගැනීම සඳහාත් සැලකිය යුතු කෙටිකාලීන පහසුකම් ලබා ගැනීම උදෙසා ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාණ්ඩාගාරය විසින් 'සහන පත්' නිකුත් කරනු ලැබ ඇත.

අදාළ ප්‍රතිව්‍යුගතකරණ සැලසුමෙහි ප්‍රධාන අංගයක් වන වියදම් අවම කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම, තෙවසරක කාලපරාසයක් තුළ මෙහෙයුම් වියදම් අඩුකරගැනීමේ අභිප්‍රාය පෙරදැරිව, දැනටමත් ආරම්භ කරනු ලැබ තිබේ.

ශ්‍රී ලංකා රජය විසින් සපයා දෙනු ලබන අඛණ්ඩ සහය සහ සමාගමේ නව ව්‍යාපාර සැලැස්ම/උපාය මාර්ගික මූලාරම්භ මත පදනම්ව නුදුරු අනාගතයේදී සමාගමේ මූල්‍ය තත්ත්වය දියුණු වනු ඇතැයිද, සඵල ව්‍යාපාරයක් ලෙස එහි කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යනු ඇතැයිද යනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාසය පළ කරයි. එමෙන්ම සමාගම විසින් අත්කරගනු ලැබ ඇති ශක්තිමත් හා සුපතළව පිළිගත් වෙළෙඳ සන්නාමය ආශ්‍රිත වැදගත් වටිනාකමත්, ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රවාහකයා ලෙස නම් දරා සිටින ශ්‍රීලංකන් ගුවන් සමාගම සතුව දැනටමත් පවත්නා ද්විපාර්ශවික ගුවන් සේවා ගිවිසුම් විදේශීය ගුවන් තොටුපළවල ගුවන් යානා ගොඩබෑමේ අයිතියද සහිතව උපයෝගිකරගත හැකිවීමත් ඉතා වැදගත් කොටස්හිමිකාරිත්ව අගයක් ආරෝපණය කරන බවද අධ්‍යක්ෂ මණ්ඩලය සලකයි.

### 2.1.3 ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්කම්

2014 ජනවාරි මස 01 වන දිනයන් හෝ ඊට පෙර ආරම්භ වන වාර්ෂික කාලපරිච්ජේද සඳහා ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති 10, 11, 12 සහ 13 අදාළ වෙමින් ක්‍රියාත්මක වූ අතර, ඒ අනුව, මෙම ගිණුම් ප්‍රමිති ව්‍යාපාර සමූහයේ ප්‍රවර්තන මූල්‍ය වර්ෂය සඳහා බලපැවැත්වේ. එසේ වුවද අදාළ ගිණුම් ප්‍රතිපත්තිවල හා මෙහි 3 වන සටහනෙහි විධිමත් ලෙස දක්වා ඇති සහේතුක වර්ධිත හෙළිදරව් කිරීම් හැරුණු විට මෙම නව ගිණුම් ප්‍රමිති සමූහයේ මූල්‍ය ප්‍රකාශ කෙරෙහි සැලකිය යුතු බලපෑමක් සිදු නොකළේය.

### 2.1.4 සංසන්දනාත්මක තොරතුරු

සමූහය විසින් අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්ති හා ඇස්තමේන්තු ඉකුත් වර්ෂයේ ගිණුම් ප්‍රතිපත්ති හා ඇස්තමේන්තු සමග අනුකූල වේ.

ප්‍රවර්තන වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීම හා අනුකූලවන පරිදි අවශ්‍ය අවස්ථාවලදී ඉකුත් වර්ෂයේ සංඛ්‍යා හා වැකි ඛණ්ඩ නැවත සකසනු ලැබ තිබේ.

## 2.2 ඒකාබද්ධ කිරීමේ පදනම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවල සමාගමට හා එහි අනුබද්ධ ආයතනයට අයත් 2015 මාර්තු මස 31 වන දින දක්වා වූ මූල්‍ය ප්‍රකාශ අඩංගු වේ. ආයෝජන ලාභියා සමග සමූහය විසින් පවත්වාගෙන යනුලබන ස්වකීය ව්‍යාපාර කටයුතු නිසා උද්ගතවන විචල්‍ය ලාභ විෂයයෙහි සමූහය නිරාවරණය වන හෝ ඒ විෂයයෙහි අයිතිය ලබන කල්හී සහ ස්වකීය බලය මගින් අදාළ ආයෝජනලාභියා ඉක්මවා යමින් එකී ලාභය කෙරෙහි බලපෑමට සමූහය හැකියාව ලබන කල්හී පාලනය සලසාගත හැකිය. ව්‍යාපාර සමාගම සතුව පහත සඳහන් දෑ ඇත්නම්, නැතහොත් ඇත්නම් පමණක් සමාගම විසින් ආයෝජනලාභියෙකු නිශ්චිතවම පාලනය කරනු ලබයි.

- ආයෝජනලාභියා සම්බන්ධ බලය/(එනම්, ආයෝජනලාභියාගේ අදාළ කටයුතු මෙහෙයවීම සඳහා සමාගමට ප්‍රවර්තන හැකියාව ලබාදෙන වර්තික අයිතිවාසිකම්).
- ආයෝජනලාභියා සමග කෙරෙන ස්වකීය ව්‍යාපාර කටයුතු නිසා උද්ගතවන විචල්‍ය ලාභ කෙරෙහි නිරාවරණය හෝ අයිතිවාසිකම්.
- එකී ලාභ කෙරෙහි බලපෑම සඳහා ආයෝජනලාභියා සම්බන්ධයෙන් බලතල භාවිත කිරීමේ හැකියාව.

පාලන මූලාංග තුනෙන් එකකට හෝ ඊට වැඩි ගණනකට වෙනස්කම් සිදුව ඇති බව අදාළ කරුණු කාරණා හෝ අවස්ථානුගත තත්ත්වයන් මගින් හැඟවේ නම්, තමා විසින් ආයෝජනලාභියෙකු පාලනයකරන්නේද නොකරන්නේද යනුවෙන් සමූහය ප්‍රතිඇගැයුමක් කරයි. සමූහය අනුබද්ධ සමාගමක පාලනය ලබාගත් කල්හී අනුබද්ධ සමාගමේ ඒකාබද්ධ වීම ආරම්භවන අතර, සමාගමට අනුබද්ධ සමාගම සම්බන්ධයෙන් පවත්නා පාලනය අහිමි වූ විට ඒකාබද්ධ වීම නතර වෙයි.

ලාභය හෝ අලාභය සහ වෙනත් සර්වව්‍යාපී ගිණුමට අයත් එක් එක් අංග සමාගමේ කොටස්හිමියන් වෙත ආරෝපණය කෙරේ. අවශ්‍ය අවස්ථාවන්හිදී, සමූහයේ ගිණුම් ප්‍රතිපත්ති ඔවුන්ගේ ගිණුම් ප්‍රතිපත්ති හා සමානුරූප වන පිණිස අනුබද්ධ සමාගමේ මූල්‍ය ප්‍රකාශවලට ගැළපුම් සිදුකෙරේ. සියලු අන්තර් සමූහ වත්කම් හා බැරකම්, කොටස් ආදායම්, වියදම් හා සමූහයට අයත් සමාජික සාමාජිකාවන්ගේ ගණුදෙනුවලට අදාළ මුදල් ප්‍රවාහ ඒකාබද්ධ කිරීමේ කාර්යයේදී සම්පූර්ණයෙන්ම ඉවත් කෙරේ.

පාලනය අහිමි වී යාමකින් තොරව අනුබද්ධ සමාගමක අයිතිය ආශ්‍රිත සබැඳියාවේ යම් වෙනස්කමක් කොටස් ගනුදෙනුවක් ලෙස ගණනය කරනු ලැබේ.

සමූහයට අනුබද්ධ සමාගමක පාලනය අහිමි වේ නම්, අදාළ වත්කම්, බැරකම් හා කොටස්හී වෙනත් අංග පිළිනොගන්නා අතර, ඒ නිසා උද්ගතවන යම් ලාභයක් හෝ අලාභයක් වෙතොත් ඒවා ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනා ගැනේ. රඳවා ගනු ලබන ආයෝජනයක් වෙතොත්, එය සාධාරණ අගයක් මත පිළිගැනේ.

## 2.3 වැදගත් ගිණුම් ඇස්තමේන්තු, උපකල්පන හා නිගමන

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ වාර්තාවූ ගණන් ප්‍රමාණ කෙරෙහි හා අදාළ රපෝර්තු දිනයට සිදුවූ හෙළිදරව් කිරීම් කෙරෙහි බලපෑ හැකි නිගමනයන්ට, ඇස්තමේන්තුවලට හා උපකල්පනයන්ට එළැඹීමට කළමනාකරණයට සිදුවේ. ප්‍රධාන නිගමනයන්, ඇස්තමේන්තු හා ඒ හා බැඳුනු උපකල්පනයන් නිරන්තරව ක්‍රියාත්මක වන පදනමක් මත ඇගයීමට ලක් වන අතර, ඒවා ඓතිහාසික අත්දැකීම් මතද, අවස්ථානුගතව සාධාරණ යැයි විශ්වාස කරන අනාගත සිදුවීම්වල මතු අපේක්ෂාද ඇතුළත් වෙනත් සාධක මතද පදනම් වේ.

විෂයික වන්නාවූ මෙන්ම මූල්‍ය ප්‍රකාශ තුළ හඳුනා ගැනෙන මුදල් ප්‍රමාණ මත වැදගත් බලපෑමක් ඇති කරන්නාවූද, අනෙකුත් කරුණු අතර පහත දැක්වෙන නිගමන ඇස්තමේන්තු හා උපකල්පන යෙදේ:

### (අ) නිගමන

#### i. ක්‍රියාත්මක ව්‍යාපාර තත්ත්වය

2.1.2 වන සටහටනෙහි හෙළිදරව් කර ඇති පරිදි මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ ව්‍යාපාරය ක්‍රියාත්මක තත්ත්වයේ පවතී යයි යන පදනම මත පිහිටාය.

#### ii. අවිනිශ්චිත බැරකම් - නඩු කටයුතු

24 වන සටහනෙහි හෙළිදරව් කර ඇති පරිදි ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේ අවසානය වන විට විවිධ පාර්ශවකරුවන් සමඟ සමූහය නඩු කටයුතු ගණනාවකට එළැඹ තීන්දු අපේක්ෂාවෙන් සිටියේය. අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ නීතිඥයන්ගේද උපදෙස් විමසා බැලීමෙන් අනතුරුව එක් එක් නඩු කෘත්‍යයේ යුක්තයුක්ත බව ඇගයුමට ලක් කරන අතර, අනාගතයේදී සිදුවිය හැකි සම්පත් විගලනයක් පවතී යැයි නිශ්චය කළ හොත් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදනද සිදු කරනු ලබයි.

#### iii. මූල්‍ය හා ක්‍රියාකාරී කල්බදුකර

සියලු අවදානම් දැරීම් හා ඒවායේ ඵලවිපාකවල අයිතිය සැලකිය යුතු අයුරින් සමාගම වෙත පවරා දෙනු ලබන කල්හී කිසියම් කල්බදුකරයක් වර්ගීකරණය කෙරෙනුයේ මූල්‍ය කල්බදුකරයක් ලෙසය. ප්‍රශස්ත වර්ගීකරණය නිශ්චය කිරීමෙහි ලා සලකා බැලෙනුයේ අදාළ ගනුදෙනුවෙහි ආකෘතිය නොව එහි හරයයි. පහත සඳහන් සාධක එහිලා අන්තර්ගත වන අතර, එම සාධක එකී  කරුණුවලට පමණක් සීමාවී නැත.

වත්කමෙහි අයිතිය කල්බදුකරය විසින් කල්බදුකර කාලසීමාව අවසානයේදී කල්බදු ලාභියා වෙත පවරා දී ඇත්ද යන වග, වත්කමෙහි අභ්‍යාසීය දිනය මත සාධාරණ අගයට වඩා ප්‍රමාණවත් අයුරින් අඩුවෙතැයි අපේක්‍ෂිත මිලකට වත්කම මිලදී ගැනීම සඳහා කල්බදු ලාභියා වෙත විකල්පයක් ඇත්ද යන වග, වත්කමෙහි හිමිකම පවරා නොමැති වුවද එහි ආර්ථික ආයුකාලයෙහි වැඩි ප්‍රමාණය සඳහා කල්බදුකරය පවතින්නේද යන වග සහ කල්බදුකරය ආරම්භයේදී කල්බදුකර ගෙවීම් හී වත්මන් අවම වටිනාකම කල්බදුගත සියලු වත්කම්හී සාධාරණ අගය මත යටත් පිරිසෙයින් ප්‍රමාණවත් පරිදි හෝ ගණනයවේද
යන වග.

### (ආ) ඇස්තමේන්තු

#### i. දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් ක්‍ෂයවීම/ක්‍රමක්‍ෂයවීම

දේපළ, පිරියත හා උපකරණ යන වත්කම්වල අපේක්ෂිත ප්‍රයෝජනය හා ආර්ථික ආයුකාලය පදනම්කර ගනිමින් ඒවාට යම් ප්‍රයෝජ්‍ය ආයුකාලයක් හා අවශේෂ වටිනාකමක් කළමනාකරණය විසින් පවරා දෙනු ලබයි. දේපළ, පිරියත හා උපකරණ යනාදියට අයත් අවශේෂ අගය සහ ප්‍රයෝජ්‍ය ආයුකාලයද එක් එක් රපෝර්තු දිනට ඒවායේ ක්ෂයවීම් ක්‍රමයද කළමනාකරණය විසින් සමාලෝචනය කරන අතර, මෙම වත්කම්හි පූර්ව ඇස්තමේන්තු හා ඒවායේ අයිතමයන් තුළ අඩංගු ආර්ථික ප්‍රතිලාභවල පරිභෝජන රටාව සමග එය සුසංගත වන බවටද වග බලා ගනියි. මෙම වත්කම්වල ප්‍රයෝජ්‍ය ආයුකාලය හා අවශේෂ වටිනාකම් අතර වෙනස්කම් අනාගත ක්ෂය අයකිරීම්හි සමාලෝචනවලට හේතු විය හැකිය.
(2.4.3 (ආ) සහ 2.4.4 ප්‍රතිපත්තිය බලන්න).

### ii. නිරන්තර පියාසර වැඩසටහන

බැර ප්‍රදාන ආදායමෙහි වෙනමම හඳුනාගත හැකි අංගයක් ලෙස ගිණුම්ගත කෙරේ. අදාළ ප්‍රතිෂ්ඨා ඒවායේ සාධාරණ අගය මත පදනම්ව වෙන්කරනු ලබන අතර, ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි බැරකමක් (විලම්බිත ආදායමක්) ලෙස ගිණුම්ගත කෙරේ.

සැතපුම් බර ප්‍රමාණ වටිනාකමෙහි සාධාරණ අගය නිශ්චය කිරීම සඳහා ඇස්තමේන්තුකරණයේ ශිල්ප ක්‍රම භාවිතා කරන අතර, එක් අංශයකට ගාස්තුව තුළින් ගුවන් ගමන් උත්ශ්‍රේණි හා හවුල්කරු ප්‍රදාන වැනි සාධක ගණනාවකට අයත් බරතැබූ සාමාන්‍යයක් නිරූපණය වේ. සාධාරණ අගය ගණනයට අදාළ පදනම වශයෙන් ඓතිහාසික ප්‍රවනතාව යොදා ගැනේ.

සාමාජික සාමාජිකාවන් විසින් නිදහස් කරගනු ලැබෙතැයි අපේක්ෂිත සැතපුම් සඳහාද කල් ඉකුත් සැතපුම් සඳහා ද සැතපුම් හී සාධාරණ අගය අළලා ගැළපුම් සිදුකෙරේ.

සැතපුමෙහි සාධාරණ අගය නිශ්චය කිරීමෙහි ලා කෙරෙන යෙදවුම්වල විවිධත්වය කරණකොටගෙන එහි නිශ්චයමතිය පිළිබඳ යම් මට්ටමක් කළමනාකරණය විසින් ක්‍රියාවට නංවනු ලැබේ.

### iii. නඩත්තු සංචිතය

නඩත්තු සම්බන්ධයෙන් වූ එකඟත්වයට පත් කොන්දේසි මත පදනම්ව, මෙහෙයුම් බදුකර යටතේ පවත්නා ගුවන්යානා හා එන්ජින් කීපයක් වෙනුවෙන් අදාළ බදුකරුවන්ට සමාගම ගෙවීම් සිදු කරයි. මෙම මාසික ගෙවීම් පදනම් වනුයේ පියාසර කරන ලද පැය සහ චක්‍ර ගණන අනුවය. ආපසු අයකර ගත යුතු මෙම මුදල් ප්‍රමාණවල වඩාත් යෝග්‍ය ඇස්තමේන්තු මත පදනම්ව එකී ගෙවීම් ආපසු අය කර ගැනීමට ඇති හැකියාව පිළිබඳව කළමනාකරණය කලින්කල ඇගයීම් සිදු කරයි. ආපසු අයකර ගැනීමේ හැකියාව අඩමාන වේ නම් ප්‍රතිපාදන වෙන් කරනු ලබයි. කිසියම් වත්කමක ඉදිරියට ගෙන යන මුදල එහි ආපසු අයකර ගත හැකි මුදල ඉක්මවන විට එම වත්කම දුබලත්වයට පත්වූ සේ සලකා එහි ආපසු අයකර ගත හැකි මුදල් වටිනාකමට ලියා දැක්වේ. (5 වන සටහන බලන්න.)

### iv. ගුවන්යානා නඩත්තු සහ පිරිවැඩියා වියදම් සඳහා ප්‍රතිපාදනය

නඩත්තු කටයුතු විෂයයෙහි එකඟත්වයට පත් කල්බදු ගිවිසුම් කොන්දේසිවලට අනුව ගුවන්යානා කඳ, ගුවන්යානා එන්ජින් හා ඒවායේ ගොඩබෑසුම් උපකරණ සම්බන්ධ බර නඩත්තු කටයුතු ඉටු කිරීමට සමාගම බැඳී සිටී. බර නඩත්තු කටයුතු ආශ්‍රිත පිරිවැය සඳහා වන ප්‍රතිපාදනය ගුවන් පියාසර පැය ගණන හෝ ගුවන් ගමන් චක්‍ර මත පදනම්ව මූල්‍ය ප්‍රකාශ තුළ ක්‍රමික වශයෙන් වෙන් කෙරේ. මෙම ප්‍රතිපාදනය නිගමනය කිරීමෙහිලා, අදාළ පරික්ෂා කිරීම සිදු කිරීමේ අවස්ථාවේ දී පවත්නා වත්කම් හී ඇස්තමේන්තු කළ තත්ත්වය මතත් යෙදවිය යුතු ද්‍රව්‍ය හා දැරිය යුතු පොදු කාර්ය වියදම් මතත් අදාළ පරික්ෂා කිරීම් සිදු කළ යුතු වන්නාවූ අවස්ථාව මතත් සුදුසු උපකල්පනවලට එළැඹේ. මෙම උපකල්පනවලට එළැඹෙනුයේ අතීත අත්දැකීම් මත වන අතර, ඒවා දළ මට්ටමේ සිට සත්‍ය මට්ටම දක්වාවූ උපකල්පන බවට වගබලා ගැනෙනු පිණිස අඛණ්ඩව සමාලෝචනයට ලක් කෙරේ. ප්‍රතිපාදන කෙරෙහි සැලකිය යුතු අයුරින් බලපෑම් ඇතිවන ලෙස එකී උපකල්පන හා ඇස්තමේන්තු කිරීම් තුළ සිදුවන යම් වෙනස්කම් මූල්‍ය ප්‍රකාශ තුළ ප්‍රලෝකනාත්මකව ගළපනු ලැබේ.

### v. ගුවන් ප්‍රවාහන සේවා ආශ්‍රිත ඍජු මෙහෙයුම් වියදම් සඳහා ප්‍රතිපාදන

ගුවන් ප්‍රවාහන සේවාවන්හි මෙහෙයුම් කාර්යය විෂයයෙහි ඉන්ධන ගාස්තු, යානා බිම් මෙහෙයුම් ගාස්තු ගොඩබෑම් හා ගාල්කර තැබීමේ ගාස්තු, යානාස්ථ ආහාර පාන/ප්‍රවේශපත් වෙන්කරවා ගැනීමේ පද්ධති/ගුවන් ගමන් වෙන්කරවා ගැනීමේ ගාස්තු සහ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත ගාස්තු වැනි ඍජු වියදම් සම්බන්ධයෙන්වූ විවිධ ප්‍රතිපාදන වෙන්කිරීමට අනිවාර්යයෙන්ම සිදු වේ. ඊට අදාළ ඇස්තමේන්තු හා ඒ ආශ්‍රිතව යොදා ගැනෙන උපකල්පන අතීත අත්දැකීම් මතත් අවස්ථාවෝචිත පරිදි සාධාරණ වේ යැයි විශ්වාස කෙරෙන බෝහෝ අනිකුත් සාධක මතත් පදනම් වේ. ඉන් උද්ගත වන ප්‍රතිඵල, වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදයේ අවසානයට ඉදිරියට ගෙන යන බැරකම්වල අගය මත ප්‍රතිපාදන වෙන් කිරීමේහිලා අදාළ වන්නාවූ පදනම සකසයි.

### vi. ඉන්වෙන්ට්‍රි භාණ්ඩ

ඉන්වෙන්ට්‍රි භාණ්ඩවල පැවැත්ම හා ප්‍රයෝජ්‍යතාවය නිත්‍ය ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ගණනය කිරීමේ පදනමක පිහිටා සමාගම සමාලෝචනය කරයි. එම භාණ්ඩවල ආපසු අයකර ගත හැකි වටිනාකමෙහි අඩුකිරීමක් ලෙස යල් පිනූ තොග සහ/හෝ වත්කම් සම්බන්ධයෙන් කළමනාකරණය නිගමනය කළ විට ඒ සඳහා ප්‍රතිපාදන සැපයේ.

### vii. මුල්‍යනොවන වත්කම් දුබලතාවයට පත්වීම

යම් මූල්‍ය වත්කමක් දුබලත්වයට පත්වී ඇති බවට යම් සාක්ෂි තිබේදැයි එක් එක් රපෝර්තු දිනට සමූහය තක්සේරු කරයි. අඩමාන ණය පරිශේෂව පවත්නා කාල සීමාවත්, ඒවා ආපසු අයකර ගැනීමට ඇති හැකියාවේ අවිනිශ්චිත භාවය සම්බන්ධයෙන් පවත්නා කළමනාකරණයද දන්නා වෙනත් සාධකත් එම දුබලතා ඇස්තමේන්තු කිරීමෙහි ලා ස්වකීය නිශ්චයමතිය තුළ පිහිටා කළමනාකරණය විසින් පාවිච්චි කරනු ලබයි.

### viii. මූල්‍ය වත්කම් දුබලතාවයට පත්වීම

යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් දුබලත්වයට පත්වී ඇති බවට වාස්තවික සාක්ෂි තිබේදැයි එක් එක් රපෝර්තු දිනට සමූහය තක්සේරු කරයි. අඩමාන ණය පරිශේෂව පවත්නා කාල සීමාවත්, ඒවා ආපසු අයකර ගැනීමට ඇති හැකියාවේ අවිනිශ්චිත භාවය සම්බන්ධයෙන් පවත්නා කළමනාකරණයද දන්නා වෙනත් සාධකත් එම දුබලතා ඇස්තමේන්තු කිරීමෙහි ලා ස්වකීය නිශ්චයමතිය තුළ පිහිටා කළමනාකරණය විසින් පාවිච්චි කරනු ලබයි.

## (ඇ) උපකල්පන

### i. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

ශ්‍රී ලංකාවේ සිට සේවය කරන කාර්ය මණ්ඩලවලට අයත් විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මෙහි පිරිවැය නිශ්චය කෙරෙනුයේ ආයුගණක තක්සේරුවක් යොදා ගනිමිනි. එම ආයුගණක තක්සේරුව පදනම් වනුයේ පොලී අනුපාතය, වැටුප් වර්ධක අනුපාතය, විශේෂ වාරික මුදල, විශ්‍රාම ගැනීමේ වයස හා සමාගම ව්‍යාපාරිකව ක්‍රියාත්මක වීමේ තත්ත්වය යන කරුණුවලට අදාළ උපකල්පන මතය. සැලසුමෙහි පවත්නා දිගුකාලීන ස්වභාවය හේතුවෙන් එබඳු ඇස්තමේන්තු සැලකිය යුතු මට්ටමේ අවිනිශ්චිතතා වලට යටත් වේ. (2.4.15 වන සටහන බලන්න.)

### ii. ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය

ස්වාධීන සුදුසුකම් ලත් තක්සේරුකරුවෙකුගේ සේවය ලබා ගනිමින් ප්‍රත්‍යාගණනිත අගය මත ඉඩම් සහ ගොඩනැගිලිවල වටිනාකම ගණන් බලනු ලැබේ. සාධාරණ අගයක් නිශ්චය කිරීම පිණිස එකී තක්සේරුකරු උපකල්පන සහ තක්සේරු ශිල්ප ක්‍රම භාවිතා කරයි. අදාළ තක්සේරු කිරීමේ පදනම 3 වන සටහනෙහි හෙළිදරව් කර ඇත.

## 2.4 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

### 2.4.1 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

සමාගමේ ව්‍යාපාරික කටයුතු ඉටුකිරීමේ හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත. විදේශ ව්‍යවහාර මුදලින් සිදුවන ගනුදෙනු, ඒවා සිදුවන දිනයට වලංගු ප්‍රායෝගික ව්‍යවහාර මුදල් අනුපාතයට අනුව මූලික වශයෙන් සටහන් කෙරේ. විදේශ ව්‍යවහාර මුදලින් ගණනය වන මූල්‍ය වත්කම් හා බැරකම් රපෝර්තු දිනයට වලංගුව පවත්නා ප්‍රායෝගික ව්‍යවහාර මුදල් අනුපාතයට නැවත පරිවර්තනය කරනු ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස උද්ගත වන ලාභ සහ අලාභ ආදායම් ප්‍රකාශය මගින් හඳුනා ගැනේ. විදේශ ව්‍යවහාර මුදලක ඓතිහාසික පිරිවැය ප්‍රකාරව ගණනය කෙරෙන මූල්‍යමය නොවන අයිතම අදාළ මුල් ගනුදෙනුව සිදුවූ දිනයේ පැවති විනිමය අනුපාත භාවිතයට ගනිමින් පරිවර්තනය කරනු ලැබේ.

### 2.4.2 බදුකරණය

#### i. ප්‍රවර්තන ආදායම් බදු

**සමාගම**

(අ) දේශීය බදුකරණය

2011 පෙබරවාරි මාසයේදී ස්වකීය සියලුම ව්‍යාපාරික කටයුතු සඳහා 2011 අප්‍රේල් 1 සිට 2021 මාර්තු 31 දක්වා ක්‍රියාත්මක වන දස අවුරුදු බදු නිදහස් කාලයක් 2011 අංක 22 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනතින් සංශෝධිත 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ සමාගම වෙත ලැබුණි.

(ආ) එතෙර බදුකරණය

ද්විත්ව බදු ගිවිසුම් ක්‍රියාත්මක නොවන රටවල් තුළ ස්වකීය විදේශීය ව්‍යවහාර මෙහෙයුම් කටයුතු මත සමාගම බදු ගෙවනු ලැබීමට යටත් වේ. කෙසේ වුවද, සමාගම අත්විඳි ඉදිරියට ගෙන ගිය බදු අලාභ හේතුවෙන් ප්‍රවර්තන වර්ෂය තුළ සමාගම සම්බන්ධ කිසිදු බදු බැඳියාවක් නොමැත.

**අනුබද්ධ සමාගම - ශ්‍රීලංකන් කේටරින් ලිමිටඩ්**

ආදායම් බදු වියදම්හි ප්‍රවර්තන හා විලම්බිත බදු අඩංගු වේ. කොටස් ආයෝජනයන් තුළ සෘජුවම හඳුනා ගැනෙන අයිතමයන්ට ලාභය හෝ අලාභය අදාළ වන තාක් දුරට හැරුණු විට ආදායම් බදු වියදම ලාභය හෝ අලාභය තුළ හඳුනා ගැනේ. එහිලා එය හඳුනා ගැනෙනුයේ කොටස් ආයෝජනය තුළය.

ප්‍රවර්තන බදු යනු රපෝර්තු දිනයට පනවා ඇති හෝ ස්ථාවරව පනවා ඇති බදු අනුප්‍රමාණ උපයෝගී කර ගනිමින් වර්ෂය සඳහා වූ බදුවන ආදායම් මත ගෙවිය යුතු අපේක්ෂිත බද්ද සහ ඉකුත් වර්ෂ සම්බන්ධයෙන් ගෙවිය යුතු බදු වෙනුවෙන් සිදු කරනු ලබන යම් ගැළපුම් වේ.

ආයෝජන මණ්ඩලය සමග ඇතිකර ගත් ගිවිසුම අනුව, යානාස්ථ මුළුතැන් ගෙවල්වලින් හා ගුවන් මගී මාර්ග ස්ථ අවන්හලෙන් උද්ගත වන ආදායම 2021 මැයි මස 31 වන දින දක්වා ආදායම් බද්දෙන් නිදහස් වේ. වෙනත් ප්‍රභවයන් වෙතින් උද්ගත වන ආදායම සාමාන්‍ය බදු අනුප්‍රමාණ අනුව බද්දට යටත් වේ.

#### ii. විලම්බිත ආදායම් බදු

වත්කම් හා බැරකම් බදු මූලයන් හා ඒවායේ මූල්‍යමය වාර්තාකරණ කාර්යයන් සඳහා ඉදිරියට ගෙනයනු ලබන ගණන් ප්‍රමාණ අතර රපෝර්තු දිනට පවත්නා තාවකාලික වෙනස්කම් පිළිබඳව බැරකම් ක්‍රමවේදය භාවිතා කරමින් විලම්බිත ආදායම් බදු ප්‍රතිපාදනය කෙරේ.

### 2.4.3 දේපළ, පිරියත හා උපකරණ

#### (අ) පිරිවැය හා තක්සේරු කිරීම

දේපළ, පිරියත හා උපකරණ යනාදී සියලුම අයිතම ප්‍රාරම්භක වශයෙන් සටහන් කෙරෙනුයේ ගත් මිලටය. අත්කර ගැනීම් හෝ ඉදිකිරීම්හි ලා සෘජුව ආරෝපනය කළ හැකි වියදම් පිරිවැයට ඇතුළත් වේ. දේපළ, පිරියත හා උපකරණ යනාදී අයිතම පසුව ප්‍රත්‍යාගණනය කිරීමේදී ඒවා පසු අවස්ථාවක සිදුවන යම් ක්ෂයවීම් හා දුබලතා ඌණ ප්‍රත්‍යාගණිත ගණන් ප්‍රමාණ මත ඉදිරියට ගෙන යනු ලැබේ. අනෙකුත් සියලු දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම් හා/හෝ උපචිත දුබලතා අලාභ වෙතොත් ඒවාද අඩුකළ ඓතිහාසික පිරිවැය මත ප්‍රකාශ කෙරේ.

ඉඩම් හා ගොඩනැගිලි සහ ගුවන් යානාස්ථ මුළුතැන්ගෙයහි උපකරණ, කලින් ලාභහෝඅලාභ ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබ තිබූ එම වත්කමට අයත් ප්‍රත්‍යාගණන අඩුවීමක් කරා එය ප්‍රතිවර්තනය වනතාක් දුරකට හැරුණු විට, වෙනත් සර්වව්‍යාපී ආදායම් තුළ සහ එහි කොටස් ආයෝජන ලෙස සමුච්චිතවූ වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය තුළ හඳුනාගැනුනු ප්‍රත්‍යාගණන අතිරික්ත කිසිවක් සමග මානනය කෙරේ. එහිලා අදාළ වැඩිවීම ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ හඳුනා ගැනේ. ප්‍රත්‍යාගණන ඌණතාවයක් ලාභ හෝ අලාභ ප්‍රකාශ තුළ හඳුනා ගැනෙනුයේ, වත්කම් ප්‍රත්‍යාගණන සංචිත තුළ හඳුනා ගනු ලැබ ඇති එම වත්කමේම දැනටමත් පවත්නා අතිරික්තයක් එය හිලවු කරනතාක් දුරකටය.

ප්‍රත්‍යාගණනිත වත්කමක සාධාරණ අගය එහි ඉදිරියට ගෙන යනු ලබන වටිනාකමෙහි විශාල වෙනසක් සිදුනොකරන බවට සහතික වනු පිණිස වත්කම් ආගණන කටයුතු ප්‍රමාණවත් කාලාන්තරයක් තුළ සිදු කෙරේ. ඉන්පසු උද්ගත වන පිරිවැයක් වේනම් එය අදාළ වත්කමෙහි ඉදිරියට ගෙනයන වටිනාකම තුළ අවස්ථාවෝචිත පරිදි අන්තර්ගත කෙරේ. එසේ නැතහොත් වෙනමම වත්කමක් ලෙස හඳුනා ගැනේ. මෙවැන්නක් සිදුවනුයේ අදාළ අයිතමය ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලාඒම අනුමාන වන කල්හිත් අදාළ පිරිවැය විශ්වාසදායක අයුරින් මැනිය හැකි කල්හිත් පමණි.

අලුත්වැඩියා හා නඩත්තු පිරිවැය ඒවා සිදුවන කාලපරිච්ඡේදය තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශයට අයගත කෙරේ.

දේපළ, පිරියත හා උපකරණවලට පහත සඳහන් දෑ අනෙකුත් කරුණු අතර ඇතුළත් වේ:

i. **ගුවන්යානා භ්‍රමණමය අමතර කොටස්**

ස්පෘෂ්‍ය වත්කම් ලෙස සැලකෙන ගුවන්යානා භ්‍රමණමය අමතරකොටස් ප්‍රාරම්භක වශයෙන් ගත්මිළ අනුව සටහන් කර එහි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය එල්ලේ ක්ෂය කරනු ලබයි. මෙම අයිතමය ගුවන්යානා ආශ්‍රිත උපකරණ යටතේ කාණ්ඩ ගතකර ඇත.

ii. **කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ**

කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ ගත්මිළ අනුව සටහන් කෙරේ. ඒවා අත්කරගත් දිනයේ සිට වැඩ ස්ථාපන දිනය දක්වා දරණ සියලු වියදම් ඊට ඇතුළත් වේ. වැඩ ස්ථාපනය කළ විට කෙරෙමින් පවත්නා වැඩ දේපළ, පිරියත හා උපකරණ යටතේ සුදුසු කාණ්ඩය වෙත මාරු කර එහි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය එල්ලේ ක්ෂය කරනු ලැබේ.

(ආ) ක්ෂයවීම

සින්නක්කර ඉඩම් හැරුණු විට සියලුම දේපළ, පිරියත හා උපකරණ යනාදියෙහි පිරිවැය හෝ තක්සේරුව මත සරල මාර්ග ක්‍රමය යොදා ගනිමින් පහත දැක්වෙන ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාල වකවානු පුරා දිවෙන පරිදි සමාන වාරිකවලින් එකී ගණන් ප්‍රමාණ කපා හැරීමේ අටියෙන් ක්ෂයවීම් සඳහා වූ ප්‍රතිපාදන ආගණනය කරනු ලැබේ:

| | | |
|---|---|---|
| ගුවන්යානා ආශ්‍රිත අමතර කොටස් | - | වසර 08 ක් හෝ කල්බදු කාලසීමාව යන කාල දෙකෙන් අඩු කාලය මුළුල්ලේ |
| පිරියත හා උපකරණ | - | උපකරණයේ වර්ග මත පදනම්ව වසර 3-10 දක්වා කාල පරිච්ඡේද මුළුල්ලේ |
| ගොඩනැගිලි | - | උපරිම වශයෙන් වසර 15-50 කට යටත්ව අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයුකාලය මුළුල්ලේ |
| ක්‍රියාකාරී කල්බදුකරමත ගුවන්යානා වැඩිදියුණු කිරීම් | - | වසර 10 ක් හෝ කල්බදු කාලසීමාව යන කාල දෙකෙන් අඩු කාලය මුළුල්ලේ |

අවශේෂ අගය, ප්‍රයෝජ්‍ය ආයුකාලය හා ක්ෂය කිරීමේ ක්‍රමය යන කරුණු එක් එක් රපෝර්තු දිනට සමාලෝචනයට භාජනයකර සුදුසු අවස්ථාවලදී ප්‍රලෝකනාත්මකව ගලපනු ලැබේ.

ඉහත සඳහන් ක්ෂය අනුප්‍රමාණ ඉදිරිපත් කෙරෙන සියලු කාලපරිච්ඡේදවලට අදාළ වේ:

(ඇ) හඳුනා නොගැනීම

කිසියම් දේපළ, පිරියත හා උපකරණ අයිතමයක භාවිතයෙන් හෝ ව්‍යපහරණයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අත්නොවන කල්හී එම අයිතමය එහි ව්‍යපහරණයෙන් පසුව හඳුනාගනු නොලැබේ. යම් වත්කමක් එසේ හඳුනාගනු නොලැබීමෙන් උද්ගත වන ලාභයක් හෝ අලාභයක් වෙතොත් එය (ව්‍යපහරණයෙන් ලත් ශුද්ධ මුදල සහ වත්කමේ ඉදිරියට ගෙනයන වටිනාකම අතර වෙනස ලෙස ආගණනය කරන ලද) අදාළ වත්කම හඳුනා නොගන්නා වර්ෂයට අයත් මූල්‍ය ප්‍රකාශයෙහි අන්තර්ගත කෙරේ.

### 2.4.4 අස්පෘෂ්‍ය වත්කම්

කිසියම් වත්කමක් නිසා උද්ගතවන අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලාඒම සහ එබඳු යම් වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස ගණනය කළ හැකිවීම යන කරුණු අනුමාන වශයෙන් සළකනු ලබන්නේ නම් ඒවා අස්පෘෂ්‍ය වත්කම් ලෙස හඳුනා ගැනේ. ඒ අනුව මෙම වත්කම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සඳහන් කෙරෙනුයේ සමුච්චිත හිලව්කිරීම් හා සමුච්චිත දුබලතා අලාභ වෙතොත් ඒවාද ඌණ වූ ගත්මිල මතය.

අදාළ දෘඩාංග අයිතමයකින් වෙන්කර ගතහැකි පරිගණක මෘදුකාංගයක් අත්කර ගැනීමේ හෝ වැඩිදියුණු කිරීමේ වියදම වෙන් වශයෙන් ප්‍රාග්ධනනය කරනු ලබන අතර, එය සරල මාර්ග පදනම මත වසර 05 ක් නොඉක්මවන කාලයක් මුළුල්ලේ හිලව් කිරීමටද කටයුතු කෙරේ. හිලව් කිරීමේ කාලපරිච්ඡේදය හා හිලව් කිරීමේ ක්‍රමය එක් එක් රපෝර්තු දිනට සමාලෝචනයට භාජනය කෙරේ. මෙම වත්කමේ ඉදිරියට ගෙන යන අගය ආපසු අයකරගතහැකි විය නොවන්නක් බව යම් අවස්ථාගත සිදුවීම් හා වෙනස්කම් අනුව පෙනී යන්නේ නම් එකී අගය වත්කම් දුබලතා එල්ලේ කලින්කල සමාලෝචනය කෙරේ.

### 2.4.5 කල්බදුකර

අ. ක්‍රියාකාරී කල්බදුකර

කල්බදුකරයේ කාලසීමාව තුළ සන්තකභාවයට අයත් සියලු අවදානම් හා ප්‍රතිලාභ කල්බදුකරු විසින් සැළකිය යුතු යෝග්‍ය අයුරකින් රඳවා ගැනෙන බදුකර ක්‍රියාකාරී බදුකර ලෙස සැළකේ. වෙනත් ක්‍රමවත් පදනමක් පරිශීලක ප්‍රතිලාභයේ කාලරටාව සම්බන්ධයෙන් වැඩි නියෝජනයක් නොකරන්නේ නම් මිස ක්‍රියාකාරී බදුකර ගෙවීම් හඳුනා ගැනෙනුයේ, ලාභය හෝ අලාභය පිළිබඳ ප්‍රකාශය තුළ කල්බදුකර කාල සීමාව මුළුල්ලේ පවතින මෙහෙයුම් වියදමක් ලෙස වූ සරල මාර්ග පදනමක් මතය.

ක්‍රියාකාරී බදුකර යටතේ වත්කම් ප්‍රතිවින්‍යාසගත කිරීමේ වියදම්, ප්‍රාග්ධනනය කරනු ලැබූ ප්‍රයෝජ්‍ය ආයුකාලය හා ඉතිරිව පවත්නා බදුකර කාලය යන දෙකෙන් අඩු කාලසීමාව එල්ලේ හිලව් කරනු ලැබේ.

2.4.3 දරණ ගිණුම් ප්‍රතිපත්තිය බලන්න.

(ආ) මූල්‍ය බදුකර

බදු දුන් අයිතමයේ සියලුම අවදානම් හා එහි සන්තකභාවයේ අනුෂංගික වූ දේපළෙහි සාධාරණ අගය හෝ ඊට වඩා අඩු අගයක් ගන්නේ නම්, අවම බදුකර ගෙවීම්වල වටිනාකම අනුව බදුකරයේ සමාරම්භක අවස්ථාවේදීම ප්‍රාග්ධනනය කෙරේ. බැරකම්හි ඉතිරිව පවත්නා ශේෂය මත සංගත පොලී අනුපාතයක් අත්කර ගැනීමට හැකිවන පරිදි කල්බදුකර ගෙවීම් මූල්‍ය ගාස්තු සහ බදුකර බැඳියාවේ අඩු කිරීමේ ප්‍රමාණය අතර විභාජනය කෙරේ.

ප්‍රාග්ධනිත බදු දුන් වත්කම්, දේපළ, පිරියත හා උපකරණ යනුවෙන් අනාවරණය කරන අතර, බදු දුන් විෂයාංග ක්ෂය කෙරේ.

2.4.3 දරණ ගිණුම් ප්‍රතිපත්තිය බලන්න.

(ඇ) විකිණීම හා ආපසු බදුදීම

විකුණුම් හා ආපසු බදුදීම් සම්බන්ධ ගනුදෙනු නිසා ජනනය වන ක්‍රියාකාරී බදුකරයක් මත උද්ගත වන ලාභ, එකී විකුණුම්වලින් ලැබෙන මුදල් අදාළ වත්කම්වල සාධාරණ අගය නොඉක්මවන තාක් දුරට ආසන්න මට්ටමකින් ලාභය හෝ අලාභය පිළිබඳ ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

### 2.4.6 ඉන්වෙන්ට්‍රි භාණ්ඩ

ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ගණනය කරනු ලබන්නේ යල්පිනූ හා මන්දගාමීව චලනය වන අයිතමවලට නිසි ප්‍රතිපාදන සැපයීමෙන් පසුව ගණනය වන පිරිවැය අගය හා ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු අගය මතය. සියලුම ඉන්වෙන්ට්‍රි භාණ්ඩ බරතැබූ සාමාන්‍ය පිරිවැය පදනම මත ගණනය කෙරේ.

### 2.4.7 මූල්‍යමය නොවන වත්කම් දුබලවීම

කිසියම් වත්කමක් දුබලතාවයට පත්වූ බවට සඳහනක් ඇත්දැයි සමූහය එක් එක් රපෝර්තු දිනයේදී ඇගයුමක් කරයි. එබඳු යම් සඳහනක් වෙතොත් හෝ යම් වත්කමක් සඳහා වාර්ෂික දුබලතා පරීක්ෂණයක් අවශ්‍ය වන කල්හි හෝ වත්කමෙහි ආපසු අයකර ගතහැකි මුදල පිළිබඳව සමූහය ඇගයීමක් කරයි. වත්කමක ඉදිරියට ගෙන ගිය හැකි වටිනාකමේ ප්‍රමාණය එය ආපසු අයකර ගත හැකි ගණනෙහි ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම දුබලත්වයට පත්ව ඇතැයි සලකනු ලබන අතර, එය ආපසු අයකර ගත හැකි වටිනාකම දක්වා කපා හැරේ.

### 2.4.8 සාධාරණ අගය මැනීම

සමූහය සිය ඉඩම් හා ගොඩනැගිලි සහ ගුවන් යානාස්ථ මුළුතැන්ගෙයි උපකරණ මනිනුයේ සාධාරණ අගය අනුවය. සාධාරණ අගය ආශ්‍රිත හෙළිදරව් කිරීම් 3 වන සටහනෙහි හෙළිකර ඇත.

සාධාරණ අගය යනු එය මනිනු ලබන දිනයට අලෙවි සහභාගි වන්නන් දෙදෙනෙකු අතර ක්‍රමවත් පරිදි විකිණීම සඳහා ලබාගන්නා වත්කම් හෝ බැරකම් පැවරීම සඳහා ගෙවනු ලබන මිල ගණනයි. සාධාරණ අගය මැනීම පදනම් වනුයේ, පහත දැක්වෙන ස්ථානයක යම් වත්කම් විකිණීමට හෝ යම් බැරකම් පැවරීමට හෝ තැබෙතැයි යන උපකල්පනය මතය:

- වත්කම හෝ බැරකම සඳහා නියෝජක වෙළඳපොළකදී හෝ;
- නියෝජක වෙළඳ පොළක් නොමැති විට අදාළ වත්කම හෝ බැරකම සඳහා වන වඩාත් වාසිසහගතම වෙළෙඳපළ,

සමූහය විසින් නියෝජක වෙළෙඳපොළ හෝ වඩාත් වාසි සහගතව වෙළඳපොළ වෙත ප්‍රවේශය සලසා ගත යුතුය.

එබඳු වත්කම්වල සාධාරණ අගය ගණනය කරනුයේ තම හොඳම ආර්ථික අභිලාෂයන් තුළ වෙළෙඳපළ සහභාගි වන්නන් ක්‍රියාකරතැයි සිතමින් අදාළ වත්කම හෝ බැරකම මිලකිරීමේදී ඔවුන් කටයුතු කරනු ලැබෙතැයි යන උපකල්පනය භාවිතා කරමිනි.

වත්කමෙහි ඉහළම සහ හොඳම ප්‍රයෝජනය භාවිතා කිරීම මගින් හෝ එකී වත්කමෙහි ඉහළම සහ හොඳම ප්‍රයෝජනය භාවිතයට ගනු ලබන වෙනත් අලෙවි සහභාගි වන්නෙකු හට විකිණීම මගින් හෝ යම් ආර්ථික ප්‍රතිලාභයක් උත්පාදනය කිරීමෙහි ලා අලෙවි සහභාගි වන්නෙකුට ඇති හැකියාව මූල්‍ය නොවන වත්කමක් සතු සාධාරණ අගය මිනීමක් තුළින් සැලකිල්ලට යොමු කරයි.

අදාළ පරිදි නිරීක්ෂණය කළ හැකි යම් යෙදවුම් උපරිම තත්ත්වයට ගෙනඒම මගින්ද, නිරීක්ෂණය කළ නොහෙන යම් යෙදවුම් අවම තත්ත්වයට ගෙන ඒම මගින්ද අවස්ථානුකූලව උචිත වන්නාවූ සහ අදාළ සාධාරණ අගය මැනීම සඳහා අවශ්‍ය දත්ත පවතින්නාවූ තක්සේරු ශිල්පක්‍රම සමූහය විසින් යොදා ගනු ලබයි.

පහත විස්තර කර ඇති පරිදි සමස්තයක් වශයෙන් සාධාරණ අගයේ මානනය විෂයයෙහි වැදගත්වන අඩුම මට්ටමේ යෙදවුම මත පදනම්ව සාධාරණ අගය මනිනු ලබන මේ සියලු වත්කම් වර්ග සාධාරණ අගය ආශ්‍රිත ධූරක්‍රමය තුළ වර්ගීකරණය කෙරේ:

1 වන මට්ටම - සමාන වත්කම් හෝ බැරකම් සඳහා සක්‍රිය වෙළඳ පොළවල් තුළ දක්නා ලයිස්තුගත (නොගැළපූ) අලෙවි මිල ගණන්.

2 වන මට්ටම - සාධාරණ අගය මානනය පිණිස අඩුම මට්ටමේ යෙදවුම් සඳහා ඍජුව හෝ වක්‍රව නිරීක්ෂණය කළහැකි තක්සේරු ශිල්පක්‍රම.

3 වන මට්ටම - සාධාරණ අගය මානනය පිණිස අඩුම මට්ටමේ යෙදවුම් සඳහා නිරීක්ෂණය කළ නොහෙන තක්සේරු ශිල්පක්‍රම.

පුනරාවර්තී පදනමක් මත මූල්‍ය ප්‍රකාශවල හඳුනා ගැනෙන වත්කම් හා බැරකම් සඳහා ධූර ක්‍රමයෙහි දැක්වෙන මට්ටම් අතර පැවරුම් සිදුවී ඇත්ද යන්න එක් එක් වාර්තා කිරීමේ කාලපරිච්ඡේදයන් හී අවසානයේදී අදාළ වර්ගීකරණය (සමස්තයක් වශයෙන් සාධාරණ අගය මානනය විෂයෙහි වැදගත්වන අඩුම යෙදවුම් මට්ටම මත පදනම්ව) ප්‍රති අගැයුම් කිරීම මගින් සමූහය විසින් නිශ්චය කරනු ලබයි.

පුද්ගල ආරක්ෂක උපකරණ වැනි සැළකිය යුතු වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා බාහිර තක්සේරුකරුවන් සම්බන්ධවේ. බාහිර තක්සේරුකරුවන් තෝරා ගැනීම සඳහාවූ නිර්ණායකවලට වෙළඳපොළ දැනුම, කීර්තිමත්භාවය, ස්වාධීනත්වය යන ගුණාංගද ඔවුන් අධි වෘත්තීය සම්මතයන් අනුව සිය කටයුතු ඉටු කරමින් පවත්වාගෙන යනු ලබන්නේද යන කරුණුද ඇතුළත් වේ. බාහිර තක්සේරුකරුවන් සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව එක් එක් කාරණය සම්බන්ධයෙන් කුමන ශිල්ප ක්‍රමය සහ යෙදවුම භාවිතයට ගැනෙන්නේද යන්න සමූහය තීරණය කරයි.

සාධාරණ අගය හෙළිදරව් කිරීමේ කාර්යයන් සඳහා ඉහත විස්තරකර ඇති පරිදි වත්කමට හෝ බැරකමට අදාළ ස්වභාවය, ගති ලක්ෂණ හා අවදානම් සහ සාධාරණ අගයේ ධූර ක්‍රමයේ මට්ටම යන කරුණු මත පදනම්ව සමූහය විසින් වත්කම් හා බැරකම් විෂයයෙහි පංති නිශ්චය කරනු ලැබ තිබේ.

### 2.4.9 මූල්‍ය සාධනපත් - මූලික හඳුනා ගැනීම සහ පසු මානනය

#### 2.4.9.1 මූල්‍ය වත්කම්

මූල්‍ය සාධන පත්‍රයෙහි ගිවිසුම්ගත ප්‍රතිපාදන කෙරෙහි ව්‍යාපාර සමූහය පාර්ශ්වකරුවකු වන විට පමණක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මූල්‍ය වත්කම් හඳුනා ගැනේ. ලාභ හෝ අලාභ ඔස්සේ ගණනය වන සාධාරණ අගය ලෙසත්, ණය මුදල් හා ලැබීම් නියමිත ලෙසත්, පරිණත ආයෝජන ලෙස යොදවා ඇති මුදල් ලෙසත්, විකුණුම් සඳහා පවත්නා දේවල් ලෙසත් සුදුසු පරිදි මූල්‍ය වත්කම් වර්ගීකරණයට හසු කෙරේ. කළමනාකරණය ස්වකීය මූල්‍ය වත්කම්හි වර්ගීකරණය එහි ආරම්භක හඳුනා ගැනීමේදී නිශ්චය කරන අතර එම වර්ගීකරණය රඳා පවතිනුයේ වත්කමෙහි ස්වභාවයත්, වත්කම් අත්කර ගනු ලැබූ අරමුණත් මතය.

සියලුම මූල්‍ය වත්කම් මූලික වශයෙන් හඳුනා ගැනෙනුයේ ඒවායේ සාධාරණ අගය අනුවය.

විකුණුම් සඳහා පවත්නා දෑ ලෙස වර්ගීකරණය කරන ලද ණය හා ලැබීම් නියමිතවලින් සහ ආයෝජන වලින් සමාගමේ වත්කම් සංයුක්තවේ. එබඳු අයිතම පසු මානනය, දුබලතාව සහ හඳුනා නොගැනීම පිළිබඳ ව්‍යාපාර සමූහයේ ප්‍රතිපත්තිය පහත දැක්වේ:

**(අ) ණය සහ ලැබීම් නියමිත**

ණය මුදල් හා ලැබීම් නියමිත යනු, සක්‍රීය වෙළෙඳපොළක් තුළ ලැයිස්තු ගත නොකළ ස්ථිර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවූ මූල්‍ය වත්කම්ය. එබඳු වත්කම් ආරම්භක මානනයෙන් පසු දුබලතා අගය ඌණ සඵල පොළී අනුපාතය යොදා ගනිමින් හිලව් කළ මිලට දෙවනුව මානනය කෙරේ. හිලවු කළ මිළ ආගණනය කරනු ලබන්නේ, අත්කර ගැනීම් මත ලැබූ වට්ටම් හෝ අධිමිල සහ සඵල පොළී අනුපාත ක්‍රමයේ අවශ්‍යම අංගයක් වන ගාස්තු හා පිරිවැය සැලකිල්ලට ගනිමිනි. ලාභය හෝ අලාභය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය අදායමට හිලව් කිරීම් ඇතුළත් කෙරේ.

**(ආ) විකුණුම් සඳහා පවත්නා මූල්‍ය වත්කම්**

විකුණුම් සඳහා පවත්නා මූල්‍ය වත්කම්වලට කොටස් ආයෝජනය හා ණය සුරැකුම්පත් අන්තර්ගතවේ. විකුණුම් සඳහා පවතිය යනුවෙන් වර්ගීකරණයකර ඇති කොටස් ආයෝජන, අලෙවිය සඳහා තැබෙන්නාවූ යනුවෙන් වර්ගීකරණය නොකළ හෝ ලාභ හෝ අලාභ එල්ලේ සාධාරණ අගය මත පවතින්නාවූ යනුවෙන් නම් නොකළ ඒවාය. මෙම වර්ගීකරණයෙහිලා ණය සුරැකුම්පත් යනු, අනිශ්චිත කාල සීමාවක් සඳහා දරනු ලැබීමට අපේක්ෂිතව පවත්නාවූ හෝ ද්‍රවශීලතා අවශ්‍යතා මත හෝ වෙළෙඳපොළ තත්ත්වයන්ගේ වෙනස්කම් මත උද්ගතවන ප්‍රතිචාරය අනුව විකිණිය හැකි වන්නාවූ ඒවාය.

විකුණුම් සඳහා පවත්නා මූල්‍ය වත්කම්, ආයෝජනය හඳුනා නොගැනෙන තෙක් විකුණුම් සඳහා පැවති සංචිතවලවූ වෙනත් සර්වව්‍යාපී ආදායම් ලෙස හඳුනා ගැනෙන උපලබ්ධි නොවූ අලාභ හෝ ලාභ සමග සාධාරණ අගයක් මත, සමුච්චිත අලාභය, විකුණුම් සඳහා පවත්නා සංචිතයේ සිට මූල්‍ය පිරිවැයට ලාභය හෝ අලාභය පිළිබඳ ප්‍රකාශය තුළ ප්‍රතිවර්ගීකරණය කිරීමේදී, වෙනත් මෙහෙයුම් ආදායම්හි සමුච්චිත ලාභය හෝ අලාභය හඳුනා ගනු ලබන හෝ ආයෝජනය දුබලත්වයට පත්වන්නේ යයි නිගමනය කරනු ලබන අවස්ථාවේදී පසු මානනයට හසු කරනු ලබන්නේය. විකුණුම් සඳහා පවත්නා මූල්‍ය ආයෝජන දරමින් උපයා ගන්නා ලද ලාභය සඵල පොලී අනුපාතය යොදා ගනිමින් පොලී ආදායම ලෙස සටහන් කෙරේ.

**(ඈ) හඳුනා නොගැනීම**

පහත දැක්වෙන් අවස්ථාවලදී මූල්‍ය වත්කම් හඳුනා ගනු නොලැබේ:

- වත්කම්වලින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිවාසිකම් අවසන්වී ඇති විට.
- වත්කම්වලින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ ස්වකීය අයිතිවාසිකම් සමූහ ව්‍යාපාරය විසින් පවරා දෙනු ලැබ ඇති හෝ ලැබූ මුදල් ප්‍රවාහ යම් පැවරුම් වැඩ පිළිවෙළක් යටතේ සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව තෙවන පාර්ශ්වයකට සම්පූර්ණයෙන් ගෙවීම සඳහා යම් බැඳියාවකින් බැඳෙනු ලැබ ඇති විට සහ (අ) වත්කම නිසා උද්ගතවන සියලු අවදානම් හා වාසි සමූහ ව්‍යාපාරය විසින් සැලකිය යුතු අයුරින් පවරා දෙනු ලැබ ඇති විට හෝ (ආ) වත්කමේ සියලු අවදානම් හා වාසි සමූහ ව්‍යාපාරය විසින් සැලකිය යුතු අයුරින් පවරා දෙනු ලැබ හෝ රඳවා ගනු ලැබ නොමැති මුත් අදාළ වත්කමේ පාලනය පවරා දෙනු ලැබ ඇති විට.

**(ඇ) මූල්‍ය වත්කම් දුබලත්වයට පත්වීම**

යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් දුබලත්වයට පත්වන වාස්තවික සාක්ෂි කිසිවක් පවතීදැයි එක් එක් රපෝර්තු දිනයට ව්‍යාපාර සමූහය තක්සේරුවක් කරයි. වත්කමෙහි මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව හටගත් සිදුවීම් එකක් හෝ කිහිපයක් (දරණ ලද පාඩු සිදුවීමක්) හේතුවෙන් හෝ එකී පාඩු සිදුවීම මගින් විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තුගත අරමුදල් ගලනය කෙරෙහි බලපෑම් ඇතිවීම හේතුවෙන් වත්කමක් දුබල වේයැයි යනුවෙන්වූ කිසියම් වාස්තවික සාක්ෂි පැවතියහොත් පමණක්, එම මූල්‍ය වත්කම හෝ මූල්‍ය වත්කම් සමූහය දුබලත්වයට පත්ව ඇතැයි සලකනු ලැබේ.

සැලකිය යුතු මූල්‍ය අපහසුතාවලටත්, ගෙවීම් ප්‍රමාද කිරීම්වලටත්, බංකොලොත්භාවය හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධාන වෙත නැඹුරුවීමේ සම්භාවිතාවලටත් ණය ගැතියන් හා ණය ගැති පිරිස් මුහුණ දී ඇති බව හැඟවෙන ලක්ෂණ පහළවීම හා අනාගත ඇස්තමේන්තුගත මුදල් ගලනයන්හි සැලකිය යුතු අඩුවීමක් ඇති බවට දත්ත අනුසාරයෙන් නිරීක්ෂණයවීම යන කරුණු වත්කම් දුබලතාවයට ලක්වීමේ සාක්ෂි තුළ තිබෙන්නට පුළුවන.

i. හිලව් කරන ලද පිරිවැය එල්ලේ ගෙන ගිය මූල්‍ය වත්කම්

කිසියම් දුබලතා අලාභයක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි පවතී නම්, එම පාඩුවට අදාළ මුදල් වටිනාකම මානනය කරනු ලබන්නේ, වත්කමෙහි ඉදිරියට ගෙන යන මුදල හා අනාගත ඇස්තමේන්තුගත මුදල් ගලනයන්හි වත්මන් අගය අතර වෙනසය. අනාගත ඇස්තමේන්තුගත මුදල් ගලනයන්හී වත්මන් අගය මූල්‍ය වත්කමේ මුල් සඵල පොලී අනුපාතය එල්ලේ වට්ටම්ගත කෙරේ.

වත්කමෙහි ඉදිරියට ගෙන යන මුදල් වටිනාකම දීමනා ගිණුමක් යොදා ගැනීම මගින් අඩු කෙරේ. අලාභයේ මුදල් වටිනාකම ලාභය හෝ අලාභය පිළිබඳ ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

පසුව එළඹෙන වර්ෂයකදී, දුබලතාව හඳුනා ගනු ලැබීමෙන් අනතුරුව හටගත් සිදුවීමක් හේතුවෙන් ඇස්තමේන්තුගත අලාභයේ වටිනාකම වැඩි හෝ අඩුවේ නම්, දීමනා ගිණුම ගැළපීම මගින් කලින් හඳුනාගනු ලැබූ දුබලතා අලාභය වැඩි හෝ අඩු කිරීම සිදු කෙරේ. පසුව යම් කපා හැරීමක් මගින් ආපසු පියවා ගැනීම සිදු කළහොත්, එකී ආපසු පියවා ගැනීම ලාභය හෝ අලාභය පිළිබඳ ප්‍රකාශයෙහි මූල්‍ය පිරිවැයට බැර කෙරේ.

ii. විකුණුම් සඳහා පවතින මූල්‍ය වත්කම් විකුණුම් සඳහා පවතින මූල්‍ය වත්කම් ආයෝජන, යම් ආයෝජනයක් හෝ ආයෝජන සමූහයක් දුබලතාවයට පත්වී ඇති බවට වාස්තවික සාක්ෂි කිසිවක් තිබේදැයි දැනගනු පිණිස රපෝර්තු දිනයට ව්‍යාපාර සමූහය විසින් තක්සේරු කරනු ලබයි.

කොටස් ආයෝජන විකුණුම් සඳහා පවතීයැයි වර්ගීකරණයකර තිබීම සම්බන්ධයෙන් වන විට, ආයෝජනයෙහි සාධාරණ අගයට අඩු එහි පිරිවැය තුළ විද්‍යාමාන වන සැලකිය යුතු හෝ කල්ගතවූ පහත වැටීම්, වාස්තවික සාක්ෂිවල අන්තර්ගත වනු ඇත. දුබලතාව සම්බන්ධයෙන් සාක්ෂි නිරූපණය වන අවස්ථාවකදී, කලින් ලාභය හෝ අලාභය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබූ එකී ආයෝජනය ආශ්‍රිත දුබලතා අලාභ කිසිවක් වේ නම්, ඒවා අඩු කළ ආයෝජන අත්කර ගැනීමේ පිරිවැය හා ඒවායේ වර්තමාන සාධාරණ අගය අතර වෙනස ලෙස මානනය කළ සමුච්චිත අලාභය වෙනත් සර්වව්‍යාපී ආදායම් වෙතින් ඉවත්කර ලාභය හෝ අලාභය පිළිබඳ ප්‍රකාශය තුළ හඳුනා ගැනේ. කොටස් ආයෝජන මත දුබලතා අලාභ ආදායම් ප්‍රකාශය හරහා ප්‍රතිවර්තනය නොකෙරේ. දුබලතාවයෙන් පසු ඒවායෙහි ඇතිවන සාධාරණ අගය ආශ්‍රිත වැඩිවීම් වෙනත් සර්වව්‍යාපී ආදායම තුළ ඍජුව හඳුනා ගැනේ.

විකුණුම් සඳහා පවතීයැයි වර්ගීකරණයකර ඇති ණය සාධන පත්‍ර සම්බන්ධයෙන් වන විට, හිලව් කරන ලද පිරිවැය එල්ලේ මූල්‍ය වත්කම් ඉදිරියට ගෙන ගිය සමාන නිර්ණායක මතම පදනම්ව දුබලතා තක්සේරු කෙරේ. කෙසේ වුවද, දුබලතාව සඳහා සටහන් කරන ලද මුදලේ ප්‍රමාණය යනු, කලින් ලාභය හෝ අලාභය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබූ එකී ආයෝජනය ආශ්‍රිත දුබලතා කිසිවක්වේ නම්, ඒවා අඩු කල හිලවු කරන ලද පිරිවැය හා වත්මන් පිරිවැය අතර වෙනස ලෙස මානනය කරන ලද සමුච්චිත අලාභයයි.

### 2.4.9.2 මූල්‍ය බැරකම්

ශ්‍රී ලං.ගි.ප්‍ර. 39 යටතේ වන විෂය පථය තුළ මූල්‍ය බැරකම් වර්ගීකරණය කෙරෙනුයේ ලාභය හෝ අලාභය හෝ ණය හෝ ණය ගැනුම් හරහාවූ සාධාරණ අගය එල්ලේ මූල්‍ය බැරකම් ලෙසය. ව්‍යාපාර සමූහය, ආරම්භක හඳුනා ගැනීමේ අවස්ථාවේදී ඒවායේ මූල්‍ය අගය පිළිබඳ වර්ගීකරණය නිගමනය කරයි.

සියලුම මූල්‍ය බැරකම් ආරම්භක අවස්ථාවේදී හඳුනා ගැනෙනුයේ සාධාරණ අගයට අනුව වන අතර ණය හා ණය ගැණුම් සම්බන්ධයෙන් වන විට, ඒවා හඳුනා ගැනෙනුයේ, ගනුදෙනුවල වියදම මත ඍජුවමය.

ව්‍යාපාර සමූහයේ මූල්‍ය බැරකම්වලට වෙළෙඳ හා වෙනත් ගෙවීම් නියමිත, බැංකු අයිරා, ණය හා ණය ගැණුම් සහ මූල්‍ය ඇපකර කොන්ත්‍රාත්තු යනාදිය ඇතුළත් වේ.

පහත විස්තරකර ඇති පරිදි මූල්‍ය බැරකම්වල පසු මානනය රඳා පවතිනුයේ ඒවායේ වර්ගීකරණය මතය:

**(අ) පසු මානනය**

මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව පොලී දරණ ණය හා ණය ගැණුම් පසු මානනයට ලක් කෙරෙනුයේ සඵල පොලී අනුපාත ක්‍රමය යොදා ගනිමින් හිලව් කරන ලද මිලටය. බැරකම් හඳුනාගනු නොලබන අවස්ථාවේදී ආදායම් ප්‍රකාශය තුළ මෙන්ම සඵල පොලී අනුපාත ක්‍රියාවලිය ඔස්සේද ලාභ සහ අලාභ හඳුනා ගැනේ.

අත්කර ගැනීම් මත වන්නාවූ යම් වට්ටමක් හෝ අධි මිලක් සහ සඵල පොලී අනුපාතයේ අවශ්‍යම අංගයක් වන ගාස්තු හා පිරිවැය සැලකිල්ලට ගනිමින් හිලව් කරන ලද පරිවැය ආගණනය කෙරේ. සඵල පොලී අනුපාත හිලවුකරණය ආදායම් ප්‍රකාශය තුළ මූල්‍ය පිරිවැයට ඇතුළත් කෙරේ.

**(ආ) හඳුනා නොගැනීම**

යම් මූල්‍ය වත්කමක බැඳියාව නිදහස් කරනු හෝ අවලංගු කරනු හෝ අවසන් කරනු ලබන විට එහි බැරකම හඳුනා නොගැනේ.

දැනටමත් පවත්නා මූල්‍ය බැරකමක් වෙනුවට සැලකියයුතු වෙනස්කම් සහිත කොන්දේසි මත එකම ණය දෙනුවා ගෙන්ම වන වෙනත් මූල්‍ය බැරකමක් ප්‍රතියෝජනයවේ නම් හෝ දැනටමත් පවත්නා බැරකමක කොන්දේසි සැලකිය යුතු ලෙස ප්‍රතිශෝධනයවේ නම්, එබඳු හුවමාරුවක් හෝ ප්‍රතිශෝධනය කිරීමක් මුල් බැරකම හඳුනා නොගැනීමක් ලෙසත්, නව බැරකමක් හඳුනා ගැනීමක් ලෙසත් සලකනු ලැබේ. අදාළ ඉදිරියට ගෙනයනු ලබන මුදල් ප්‍රමාණවල වෙනස ලාභය හෝ අලාභය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනා ගැනේ.

**(ඇ) මූල්‍ය සාධන පත්‍ර පාඩු පියවීම**

මූල්‍ය වත්කම් හා බැරකම් සම්බන්ධ පාඩු හිලව් කරනු ලබන අතර හඳුනාගත් මුදල් ප්‍රමාණ හිලව් කිරීම සඳහා දැනට බලාත්මක කළ හැකි යම් නෛතික අයිතිවාසිකමක් හෝ ශුද්ධ පදනමක් මත බැරකම් එකවර බේරුම් කිරීමට හෝ වත්කම් උපලබ්ධිකර බැරකම් පියවීමට යම් අභිප්‍රායක් තිබේ නම් පමණක් ශුද්ධ මුදල් ප්‍රමාණ, ආදායම් තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වාර්තා කළ හැකිය.

## 2.4.10 ගුවන්යානා නඩත්තු සංචිතය

ක්‍රියාත්මකව පවත්නා කල්බදු ගිවිසුම් අනුව ගුවන්යානා එන්ජින්, ගුවන්යානා සැකිලි සහ ගුවන්යානා අංගෝපාංග යනාදියෙහි පිරිවැඩියා සඳහා මාසික පදනමක් මත කල්බදුකරුවන් වෙත කරන ලද ගෙවීම්වලින් ගුවන්යානා නඩත්තු සංචිතය සමන්විත වේ. ගුවන්යානා එන්ජින්, ගුවන්යානා සැකිලි සහ ගුවන්යානා අංගෝපාංග පිරිවැඩියා සඳහා දරණ ලද වියදම අදාළ නඩත්තු කටයුතු නිමවීමෙන් පසුව එකී සංචිත හරහා කල්බදුකරුවන් වෙතින් සමාගම ආපසු අයකර ගනී.

ගුවන්යානා නඩත්තු සංචිතය එහි අදාළ ස්වභාවය මත පදනම්ව ණය සහ ලැබීම් නියමිත යටතේ වර්ගීකරණයකර ඇති අතර, මෙම මූල්‍ය වත්කම් කාණ්ඩය සඳහා අදාළ වන්නාවූ ගිණුම් ප්‍රතිපත්තිය ඉහත 2.4.9.1 (අ) සටහනෙහි සඳහන් කර ඇත.

## 2.4.11 වෙළෙඳ හා වෙනත් ලැබීම් නියමිත

අනුබද්ධ සමාගමට අයත් මුදල් ප්‍රමාණද ඇතුළත් වෙළෙඳ ණයගැතියන්, තැන්පතු සහ වෙනත් ණයගැතියන් (ගත් මිලට මානනය කරනු ලබන තැන්පතු හා වෙනත් ලැබීම් නියමිත යටතේ වර්ගීකරණය කරන ලද මූල්‍ය නොවන වත්කම් හැර) වර්ගීකරණයකර ගිණුම් ගත කෙරෙනුයේ ණය සහ ලැබීම් නියමිත වශයෙනි. අදාළ ස්වභාවය මත පදනම්ව මෙම කාණ්ඩයට අයත් මූල්‍ය වත්කම් සඳහා අදාළ වන ගිණුම් ප්‍රතිපත්තිය ඉහත 2.4.9.1 (අ) සටහනෙහි සඳහන්කර ඇත.

## 2.4.12 ආයෝජන

### i. අනුබද්ධ සමාගමේ ආයෝජනය

සමාගමේ මූල්‍ය ප්‍රකාශ තුළ, අනුබද්ධ සමාගම ආශ්‍රිතව සිදු කෙරුණු ආයෝජන ගත් මිලට ගිණුම්ගත කර ඇත. එය, තාවකාලික අගය හීනවීම් නොවන අගය හීනවීම් කිසිවක් සඳහාවූ යම් ප්‍රතිපාදනවලින් තොරය.

## 2.4.13 මුදල් හා මුදල් සාම්‍යයන්

මුදල් හා මුදල් සමාන දෑ ගෙනහැර දක්වනුයේ බැංකුවේ ඇති මුදල්, අතැති මුදල් හා නිවේදිත තැන්පතු වශයෙනි. ඒවා, දන්නා මුදල් ප්‍රමාණවලට වහා පරිවර්තනය කළ හැකි හා වටිනාකම් වෙනස්කම්වලට නොවැදගත්, අවදානම්වලට යටත් කෙටි කාලීන අධි ද්‍රවශීල ආයෝජන වශයෙන්ද ගෙන හැර දැක්වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුදල් හා මුදල් සාම්‍යයන්ට බැංකුවේ හා අතැති මුදල්ද, හිඟහිට ඇති බැංකු අයිරා රහිත බැංකුවේ ඇති නිවේදිත තැන්පත්ද ඇතුළත්වේ. කෙටි කල් පිරීමේ කාලයක් සහිත ආයෝජනද (එනම්, අත්කර ගැනීමේ දිනයේ සිට තෙමසක කාලයක් හෝ ඊට අඩු) මුදල් සමාන දෑ ලෙස සැලකේ. බැංකු අයිරා අනාවරණය කෙරෙනුයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ බැරකම් දරණ පොලී යටතේය.

## 2.4.14 ප්‍රතිපාදන

### i. සාමාන්‍ය

ප්‍රතිපාදන හඳුනා ගැනෙනුයේ සමාගම විසින් වගකිය යුතු කිසියම් ප්‍රවර්තන බැඳීමක් බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත යම් සම්පත් විගණනයක් අවශ්‍ය වෙතැයි හෝ එකී බැඳීමේ වටිනාකම අදාළ විශ්වාසදායක ඇස්තමේන්තුවක් සෑදීමට ඇති වෙතැයි අනුමාන කරන කිසියම් අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමාගම සතුව එබඳු යම් ප්‍රවර්තන බැඳීමක් (නෛතික හෝ සම්ප්‍රයුක්ත) පවතින අවස්ථාවකදීය. ප්‍රතිපාදන සමහරක් හෝ සියල්ලම ප්‍රතිපූරණය කළ යුතු යැයි ව්‍යාපාර සමූහය අපේක්ෂා කරන්නේ නම්, වෙනමම වත්කමක් ලෙස එකී ප්‍රතිපූරණය හඳුනා ගැනෙන මුත්, එය එසේ කෙරෙනුයේ අදාළ ප්‍රතිපූරණය සැබැවින්ම නිශ්චිතවූ විට පමණි. මොනයම් හෝ ප්‍රතිපාදනයකට අදාළ වියදම් ප්‍රතිපූර්ණ කිසිවකින් තොරව ආදායම් ප්‍රකාශය තුළ ගෙන හැර දැක්වේ.

### ii. ගුවන්යානා නඩත්තු සහ පිරිවැඩියා වියදම්

ගුවන්යානා සහ පිරිවැඩියා වියදම් (බර නඩත්තු කටයුතු පරීක්ෂා කිරීමට යාම්ඊම් වෙනුවෙන් හා ගුවන්යානා එන්ජින්වලට සහ ගොඩබැසුම් උපකරණාවලට කෙරෙන පිරිවැඩියා කිරීම් වෙනුවෙන් දරණ වියදම් හැර) සමූහය විසින් හඳුනාගැනෙනුයේ ඒ සඳහා වියදම් දැරූ පදනමක් මතය. කාර්යයෙහි ස්වභාවය මත රඳා පවතින එහි උපයෝජනය හා ඊට ගතවන කාලය මත පදනම්වන අයුරින් මූල්‍ය ප්‍රකාශ තුළ අදාළ පිරිවැඩියා ක්‍රමිකව වෙන් කෙරේ. අදාළ ගිවිසුම් කාලසීමාව මුළුල්ලේ පැය ගණනට අනුව ගණනය කර එකඟත්වයටපත් ස්ථිර මිල ප්‍රමාණයක් අනුවවූ වියදමක්, ‘පැය ගණනට අනුව බලශක්තිය’ සැපයීමෙන් තෙවන පාර්ශව නඩත්තු ගිවිසුම් මඟින් ආවරණයවන එන්ජින් පිරිවැඩියා සඳහා දරණු ලැබේ.

## 2.4.15 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

### (අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම – පාරිතෝෂිකය

පාරිතෝෂිකය අදාළ අණපනත් ප්‍රකාරව සමාගම සහ අනුබද්ධ සමාගම විසින් ගෙවිය යුතු නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක්වන ප්‍රතිඥාත පාරිතෝෂික විශ්‍රාම ප්‍රතිලාභවල ප්‍රවර්තන අගය සෑම වසරකම ජීවගණකඥවරයෙකුගේ උපදෙස් සහිතව ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය යොදා ගනිමින් සමාගම විසින් ගණනය කරනු ලබයි.

ව්‍යාපාර සමූහය, සර්වව්‍යාපී අදායම් ප්‍රකාශයෙහි දැක්වෙන නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වලට අදාළ වෙනත් සර්වව්‍යාපී ආදායම් හා වියදම් තුළ පවත්නා නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වලින් උද්ගතවන ජීවගණක ලාභ/අලාභ හඳුනා ගනියි.

පාරිතෝෂිත බැරකම් බාහිර ලෙසින් අරමුදල් ලබා නොගනී. මෙම අයිතම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වෙනත් විලම්බිත බැරකම් යටතේ කාණ්ඩගතකර ඇත. එතෙර ස්ථානගතව රැකියාවේ නිරත සේවක සේවිකාවන් ආවරණය වනුයේ ඔවුන් පදිංචි රටවලට අදාළ සමාජ ආරක්ෂණ යෝජනාක්‍රම යටතේය.

### (ආ) නිශ්චිත දායකත්ව සැලසුම් – සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල

ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත සේවා නියුක්තිකයන් අදාළ අණපනත් හා රෙගුලාසි ප්‍රකාරව සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සුදුසුකම් ලබා සිටී. සේවක දළ පාරිශ්‍රමික ප්‍රමාණයෙන් 15% ක් හා 3% ක ප්‍රමාණයක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සමාගම විසින්ද, 12% ක් හා 3% ක්වූ ප්‍රමාණය අනුබද්ධ සමාගම විසින්ද දායක කරයි.

## 2.4.16 නිරන්තර පියාසර වැඩසටහන

‘ෆ්ලයිස්මයිල්ස්’ යනුවෙන් හඳුන්වනු ලබන නිරන්තර පියාසර වැඩසටහනක් සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර, එමඟින් වැඩසටහනේ සාමාජිකයන්ට සමුච්චිත සැතපුම් ප්‍රමාණය පදනම්කර ගනිමින් සංචාරක සම්මාන ප්‍රදාන පිරිනමයි. මෙම ‘ෆ්ලයිස්මයිල්ස්’ වැඩසටහනේ ප්‍රතිලාභවලට අදාළ මගී ආදායමෙන් කොටසක්, ඒවා උපයෝජනයට ගනුලබන තෙක් විලම්බනයකර තැබේ. මේවා විලම්බිත ආදායම් යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි අන්තර්ගත කෙරේ.ආදායම් විලම්බනය ඇස්තමේන්තු කෙරෙනුයේ අදාළ බැර ප්‍රදාන නිදහස්කර ගැනීමේ ඓතිහාසික ප්‍රවනතාවයේ පදනම මත පිහිටා වන අතර එය එකී ප්‍රතිලාභවලට අදාළ අපේක්ෂිත උපයෝජනය පුරෝකථනය පිණිස යොදා ගැනේ. ප්‍රදානය කරනු ලබන බැරෙහි සාධාරණ වටිනාකම ඇස්තමේන්තු කෙරෙනුයේ ප්‍රදානය කරනු ලබන බැර නිදහස්කර ගත හැකි සේවාවල බරතැබූ සාමාන්‍ය අගයට සැඳහුම් දක්වමිනි. මෙම ඇස්තමේන්ත එක් එක් රපෝර්තු දිනට සමාලෝචනය කරනු ලබන අතර අදාළ බැරකම් ඒ අනුව ගළපනු ලැබේ. වැඩසටහන් හවුල්කරුවන්ගේ සේවා උපයෝගී කරගනිමින් උපචිත වන්නාවූ සහ සහභාගිකාර හවුල්කරුවන් විසින් ගෙවනු ලබන සැතපුම් ප්‍රමාණද ඒවා උපයෝගීකරග නු ලබනතෙක් විලම්බිත ආදායම ලෙස ගණනය කෙරේ. කල් ඉකුත්වීම අපේක්ෂිත සැතපුම් ප්‍රමාණ සඳහා බැරකම් හඳුනා නොගැනේ.

## 2.4.17 ආදායම් හඳුනා ගැනීම

ව්‍යාපාර සමූහය වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා එන්නේදැයි අවිනිශ්චිත වන්නාවූ හා ආදායම විශ්වාසදායක ලෙස මානනය කළ හැකි වන්නාවූ දුරකට, අදාළ ගෙවීම් සිදු කරනුයේ කෙදිනකද යන්න නොසලකා, ආදායම හඳුනා ගැනේ. ලද හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය අනුව ආදායම මානනය කෙරේ.

(අ) ගුවන් සමාගමේ ආදායම

ප්‍රධාන වශයෙන් ආදායම ජනනයකර ගැනෙනුයේ මගී ප්‍රවාහනය, ගුවන් බඩු හා තැපැල් ප්‍රවාහනය, ගුවන් තොටුපළ පර්යන්ත සේවා සැපයීම, ඉංජිනේරු සේවා සැපයීම, ගුවන් යානා කුලී පදනම මත සපයාදීම හා ඒ ආශ්‍රිත සේවා යනාදිය මඟිනි.

i. ගුවන් මගී ගුවන් බඩු විකුණුම් හඳුනා ගැනෙනුයේ අදාළ ප්‍රවාහනය සපයන අවස්ථාවලදී උද්ගතවන මෙහෙයුම් ආදායම් වශයෙනි.

ii. භාවිතයට නොගත් ගුවන් ප්‍රවේශ පත්‍ර හා ගුවන් මාර්ග බිල්පත්වල අගය ප්‍රවාහන පූර්ව විකුණුම් ලෙස ජංගම බැරකම්හි ඇතුළත් කෙරේ. අභාවිත හා ගුවන් මාර්ග බිල්පත්වල අගය හඳුනා ගැනෙනුයේ එක් වසරකට පසුව භාවිතයට නොගෙන පවතින්නේ නම්, ආදායම වශයෙනි.

iii. ගුවන් තොටුපළ පර්‍යන්ත සේවා සැපයීමෙන් අත්වන ආදායම හඳුනා ගැනනුයේ අදාළ සේවා ඉටු කිරීමෙන් පසුවය.

iv. තෘතීය පාර්ශව නඩත්තු සේවා සැපයීමෙන් අත්වන ආදායම හඳුනා ගැනෙනුයේ එකී කටයුතු නිමවීමෙන් අනතුරුවය.

v. ගුවන් ගමන් මෙහෙයුම් සේවා සැපයීමෙන් අත්වන ආදායම හඳුනා ගැනෙනුයේ අදාළ සේවා ඉටුකිරීමෙන් පසුවය.

(ආ) ගුවන් සමාගමේ ආහාරපාන සේවාවලින් ආදායම

**භාණ්ඩ විකිණීම**

සන්තකභාවයට අදාළ සැලකිය යුතු අවදානම් හා ලැබීම් දීමනා ගැනුම්කරු වෙත පවරනු ලැබ ඇතිවිට ආදායම හඳුනා ගැනේ. අගය එකතු කළ විකුණුම් බදු ආදායමට අන්තර්ගත නොවන අතර, ආදායම නිශ්චය කරනුයේ වෙළෙඳ වට්ටම් අඩු කිරීමෙන් පසුවය. ප්‍රතිෂ්ඨා මුදල්, අදාළ වියදම් හෝ සිදුවිය හැකි භාණ්ඩ හැරවුම් ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන් හා භාණ්ඩ පිළිබඳ අඛණ්ඩ කළමනාකරණය සම්බන්ධයෙන් සැලකිය යුතු අවිනිශ්චිතතා වේනම් ආදායම් කිසිවක් හඳුනා නොගැනේ.

(ඇ) ලාභාංශ ආදායම

කොටස්හිමියන් අදාළ ගෙවීම් ලැබීමට ඇති ඔවුන්ගේ අයිතිය තහවුරු කරනු ලැබූ විට ලාභාංශ ආදායම ගිණුම්ගත කෙරේ.

(ඈ) කුලී ආදායම

කුලී ආදායම හඳුනා ගැනෙනුයේ උපචිත පදනමක් මතය.

(ඉ) පොලී ආදායම

හිලව් කරන ලද පිරිවැය අනුව මානනය කළ සියලුම සාධන පත්‍ර, පොලී ආදායම හෝ වියදම සටහන් කරනුයේ සඵල පොලී අනුපාතය යොදා ගනිමිනි.

(ඊ) වෙනත් ආදායම්

වෙනත් ආදායම් හඳුනා ගැනෙනුයේ උපචිත පදනම මතය.

### 2.14.18 වියදම් හඳුනා ගැනීම

නිශ්චිත ආදායම් අයිතමවල දරණ ලද පිරිවැය හා ඉපයුම් අතර පවත්නා ඍජු සබඳතාවක පදනම මත පිහිටා ලාභය හෝ අලාභය පිළිබඳ ප්‍රකාශය තුළ වියදම් හඳුනා ගැනේ. කාර්යක්ෂම තත්ත්වයන් යටතේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපළ, පිරියත හා උපකරණ නඩත්තු කිරීම යන කාර්යයන්හිලා දරණ ලද සියලු වියදම් ආදායම් ප්‍රකාශයට අයගත කෙරේ. ලාභය හෝ අලාභය පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා, 'වියදම්හි ස්වභාවය' නැමැති ක්‍රමය අනුගමනය කර ඇත. එසේ එම ක්‍රමය අනුමනයකර ඇත්තේ, සමූහයේ කාර්ය සාධනය පිළිබඳව මූලාංශ එමඟින් සාධාරණ අයුරින් ගෙනහැර දැක්වෙතැයි යන පදනම මතය.

### 2.4.19 ණය ගැනුම් පිරිවැය

ණය ගැනුම් පිරිවැය හඳුනා ගැනෙනුයේ, කිසියම් වත්කමක් අත්කර ගැනීමක්, ඉදිකිරීමක් හෝ නිපදවීමක් එහි අපේක්ෂිත භාවිතය හා විකිණීම පිණිස සූදානම් කෙරෙන සැළකිය යුතු කාලසීමාවක් දක්වා එලෙස යම් වත්කමක් අත්කර ගැනීමට, ඉදිකිරීමට හෝ නිපදවීමට සෘජුවම අදාළ වන පරිදි එකී ණය ගැනුම් පිරිවැය උද්ගතවනතාක්වූ දුර හැරුණු විට ඒවා එලෙස දරණු ලබන කාලසීමාව දක්වාවූ දුරකට ගැනෙන වියදමක් වශයෙන් වන අතර එය එකී වත්කමෙහි කොටසක් ලෙස ප්‍රාග්ධනනය කරනු ලැබේ.

### 2.4.20 ඛණ්ඩමය වාර්තාකරණය

ඛණ්ඩයක් යනු ව්‍යාපාර සමූහය සම්බන්ධයෙන් හඳුනාගනු ලැබිය හැකි එක්තරා අංශයකි. අනෙකුත් අංශවලට වඩා වෙනස් ස්වරූපයක් ගත් අවදානම් හා ලැබුම් දීමනාවලට යටත් විශේෂිත ආර්ථික පරිසරයක් තුළ සේවා සැපයීමේ කාර්යන්හිලා එම අංශය නිරතවේ.

සමාගමේ අවදානම් හා ලාභ අත්කර ගැනීමේ අනුපාතය කෙරෙහි සමාගම විවිධ රටවල් තුළ ස්වකීය ක්‍රියාකාරකම් ඉටුකරන්නේය යන සාධකය ප්‍රබල ලෙස බලපෑම් ඇති කරන්නක් හෙයින් එකී මෙහෙයුම් කටයුතුවල භූගෝලීය පැතිරයාම මත පදනම්ව අදාළ මූලික ඛණ්ඩ නිශ්චය කරනු ලැබේ. විකුණුම් උත්පාදනය මගින් සලසා ගැනෙන පිරිවැටුමෙහි විශ්ලේෂණය ලබා ගැනෙනුයේ විකුණුම සිදුකළ කලාපය වෙත ආදායම වෙන්කිරීම මගිනි. කිසියම් විශේෂ ඛණ්ඩයකට යටත් කොට සෘජුවම හඳුනාගත නොහැකි වියදම් වෙන්කර දක්වමින් හෙළිදරව් කිරීමක් සිදු නොවේ.

භූගෝලීය ඛණ්ඩ වෙත වත්කම් හා අදාළ බැරකම් වෙන්කරදීම යෝග්‍ය පදනමක් මත නොපවතී යයි කළමනාකරණය හඟියි. ඒ අනුව ඛණ්ඩමය වත්කම්, ඛණ්ඩමය බැරකම් සහ ගෝලීය ඛණ්ඩ ආශ්‍රිත තොරතුරු යනාදිය සම්බන්ධයෙන් හෙළිදරව් නොකෙරේ.

ව්‍යාපාරික ඛණ්ඩය අනුව ද්විතීයික වාර්තාකරණය පදනම් වනුයේ සමූහය විසින් සලසනු ලබන සේවාවන්හි ස්වභාවය මතය. සමූහය ප්‍රධාන ව්‍යාපාර ඛණ්ඩද්වයක නිරතව සිටියි. එනම්, ගුවන් ප්‍රවාහන කටයුතුවල සහ සිය අනුබද්ධ සමාගම ඔස්සේ ගුවන්යානාස්ථ ආහාරපාන සේවා සැපයීමේ කටයුතුවල නියැලීමයි.

## 2.5 නිකුත්කළ මුත් මේ දක්වා ක්‍රියාත්මක නොවන ගිණුම්කරණ ප්‍රමිති

නිකුත්කර ඇති නමුත් මෙම මූල්‍ය ප්‍රකාශ නිකුත් කරනු ලැබූ දිනය දක්වා ක්‍රියාත්මකව නොමැති ගිණුම්කරණ ප්‍රමිති පහත දක්වා ඇත. මෙම ප්‍රමිති බලාත්මකවූ විට ව්‍යාපාර සමූහය විසින් ඒවා අනුගමනය කරනු ඇත. සවිස්තරාත්මක සමාලෝචනයක් අපේක්ෂිත හෙයින් මෙම ප්‍රමිතිවල මූල්‍ය බලපෑම යුක්තියුක්ත ලෙස තක්සේරු කළ නොහේ.

ශ්‍රී ලං.මූ.රේ.ප්‍ර.9 – මූල්‍ය සාධන පත්‍රः වර්ගීකරණය සහ මානනය

මෙම ප්‍රමිතිය 2018 ජනවාරි මස සිට හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික කාලපරිච්ජේද සඳහා මුලින් ක්‍රියාත්මකව පැවතියේය. කෙසේ වුවද, එකි ක්‍රියාත්මකවන දිනය පසුව කල්දමා ඇත.

ශ්‍රී ලං. ගි. ප්‍ර. 15 – ගණුදෙනුකරුවන් සමඟ ගිවිසුම් ආදායම

ගණුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් උද්ගත වන ආදායමට අදාළ වන්නාවූ නව පියවර පහකින් සමන්විත ආකෘතියක් ශ්‍රී ලං. ගි. ප්‍ර. 15 මගින් ස්ථාපනය කරයි. ශ්‍රී ලං. ගි. ප්‍ර. 15 යටතේ, ගණුදෙනුකරුවෙකුට භාණ්ඩ හෝ සේවා පැවරීමට හුවමාරු වශයෙන් ආයතනයක් විසින් ඊට හිමිවෙතැයි අපේක්ෂා කරන ප්‍රතිෂ්ඨා නිරූපනය වන මුදල් ප්‍රමාණයකට ආදායම් හඳුනා ගැනීම පිණිස වඩාත් ව්‍යුහගත ප්‍රවේශයක් සලසා දෙයි.

මෙම නව ආදායම් ප්‍රමිතිය සියලුම ආයතනවලට අදාළ වන අතර ශ්‍රී ලං. ගි. ප්‍ර. 15 යටතේ පවත්නා ප්‍රවර්තන ආදායම් හඳුනාගැනීමේ සියලු නියමයන් අභිබවා යයි. කලින් පිළිපදිනු ලැබීමටද අවසරය සහිතව 2018 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික කාලපරිච්ජේද සඳහා පූර්ණ හෝ ප්‍රතිශෝධිත ලෙස අතීතයටද ක්‍රියාත්මක වන පරිදි යොදා ගැනීමක් මේ සඳහා අවශ්‍යවේ.

## 3. දේපළ, පිරියත සහ උපකරණ

### 3.1 සමූහය

| | ඉඩම් සහ ගොඩනැගිලි රු. මිලියන | පිරියත සහ උපකරණ රු. මිලියන | මෙහෙයුම් බදුකර මතවූ ගුවන්යානා වැඩිදියුණු කිරීම් රු. මිලියන | ගුවන් යානා ආශ්‍රිත උපකරණ රු. මිලියන | බදුකර පිරියත හා උපකරණ රු. මිලියන | අත්තිකාරම්/ සක්‍රිය ප්‍රාග්ධන රු. මිලියන | එකතුව රු. මිලියන |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය/ප්‍රත්‍යාගණනය** | | | | | | | |
| **2014.04.01 දිනට ශේෂය** | 3,971.43 | 6,102.96 | 3,201.69 | 6,892.60 | 2,639.61 | 76.71 | 22,885.00 |
| අත්කරගැනීම්/පිළිසකර කිරීම්/ප්‍රත්‍යාගණන* | 649.14 | 302.27 | 636.10 | 969.55 | 402.91 | 431.52 | 3,391.49 |
| පැවරුම්/ගැළපුම් | 44.39 | (42.47) | – | (1.00) | 22.87 | (74.99) | (51.20) |
| ව්‍යපහරණ/විසුම් ගැන්වීම් | (8.34) | (23.13) | (1,258.62) | (2.53) | – | (1.58) | (1,294.20) |
| **2015.03.31 දිනට ශේෂය** | 4,656.62 | 6,339.63 | 2,579.17 | 7,858.62 | 3,065.39 | 431.66 | 24,931.09 |
| **සමුච්චිත ක්ෂය** | | | | | | | |
| **2014.04.01 දිනට ශේෂය** | 760.10 | 4,572.68 | 2,044.81 | 5,276.75 | 374.92 | – | 13,029.26 |
| වර්ෂය සඳහා අයකිරීම් | 299.83 | 525.49 | 647.01 | 363.44 | 380.72 | 3.33 | 2,219.82 |
| පැවරුම්/ගැළපුම්/ප්‍රත්‍යාගණන | (512.97) | (865.35) | – | 0.01 | 7.64 | – | (1,370.67) |
| ව්‍යපහරණ/විසුම් ගැන්වීම් | (6.33) | (15.99) | (1,258.62) | (2.53) | – | – | (1,283.47) |
| **2015.03.31 දිනට ශේෂය** | 540.63 | 4,216.83 | 1,433.20 | 5,637.67 | 763.28 | 3.33 | 12,594.94 |
| **2015.03.31 දිනට ශුද්ධ පොත් අගය** | 4,115.99 | 2,122.80 | 1,145.97 | 2,220.95 | 2,302.11 | 428.33 | 12,336.15 |
| 2014.03.31 දිනට ශුද්ධ පොත් අගය | 3,211.33 | 1,530.28 | 1,156.88 | 1,615.85 | 2,264.69 | 76.71 | 9,855.74 |

**ඉහත සඳහන් ප්‍රත්‍යාගණන ගැළපුම, ලාභය හෝ අලාභය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබ ඇති දුබලතාවට පත් ගොඩනැගිලිවලට අදාළ රුපියල් මිලියන 37.8 ක මුදල් ප්‍රමාණය රහිතවය.*

**3.2** (අ) ස්වාධීන තක්සේරුකරුවකුවූ රන්ජන් ජේ. සමරකෝන් මහතා (ඒ.අයි.වී/ශ්‍රී ලංකා - ආයතනික තක්සේරුකරු) සහ ස්වාධීන තක්සේරුකරුවෙකුවූ පී.බී. කළුගලගෙදර මහතා ප්‍රත්‍යාගණනය කිරීමක අනුසාරයෙන් ඉකුත් මූල්‍ය වර්ෂය තුළ පිළිවෙළින් සමූහයට අයත් ඉඩම් හා ගොඩනැගිලිවල සහ අනුබද්ධ සමාගමේ ගුවන් යානාස්ථ මුළුතැන්ගෙයි උපකරණවල සාධාරණ අගය නිශ්චය කරන ලදී. එම ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵල 2015 මාර්තු මස 31 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම මූල්‍ය ප්‍රකාශ තුළ අන්තර්ගත කර ඇත. ප්‍රත්‍යාගණනයෙන් උද්ගතවූ අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයක් වෙත මාරු කරන ලදී.

තක්සේරු කළ අගයට දක්වා ඇති සමූහයේ ඉඩම්, ගොඩනැගිලි සහ වෙනත් පිරියත හා උපකරණ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වත්කම් | තක්සේරු ක්‍රමය | තක්සේරුවේ ක්‍රියාත්මක දිනය | වැදගත් නිරීක්ෂණය කළ නොහෙන යෙදවුම් | නිරීක්ෂණය කළ නොහෙන යෙදවුම්වලට සාධාරණ අගයේ සංවේදීතාව | සාධාරණ අගයේ ධූරක්‍රමයේ මට්ටම |
|---|---|---|---|---|---|
| ඉඩම් – කොළඹ | විවෘත වෙළෙඳපොළ | 2015 මාර්තු 31 | පර්චසයක ඇස්තමේන්තු මිල රු. මිලියන 12 | සක්‍රියව සහසම්බන්ධ සංවේදිතාව | 3 වන මට්ටම |
| ගොඩනැගිලි – කොළඹ/කටුනායක | ක්ෂය කළ ප්‍රතිස්ථාපන පිරිවැය | 2015 මාර්තු 31 | වර්ග අඩියක ඇස්තමේන්තු මිල රු. 475/= – රු. 9,000/= | | |
| පිරියත හා උපකරණ යටතේ අන්තර්ගත ගුවන් යානාස්ථ මුළුතැන්ගෙයි උපකරණ – කටුනායක | විවෘත වෙළෙඳපොළ අගය ක්‍රමය | 2015 මාර්තු 31 | ඇස්තමේන්තු අගය රු. මිලියන 793.54 | | |

(ආ) ක්ෂය කිරීම් උෟණ පිරිවැය මත වත්කම් ඉදිරියට ගෙන ගොස් තිබුණේ නම් මූල්‍ය ප්‍රකාශ තුළ අන්තර්ගත කළ යුතුව තිබූ ප්‍රත්‍යාගණනිත වත්කම්වල ධාරණ මුදල් ප්‍රමාණය පහත දැක්වේ.

| වත්කම් වර්ගය | 2015 පිරිවැය | 2015 පිරිවැය මත වත්කම් ඉදිරියට ගෙන ගොස් තිබුණේ නම් සමුච්චිත ක්ෂය | 2015 ඉදිරියට ගෙන යන ශුද්ධ වටිනාකම | 2014 ඉදිරියට ගෙන යන ශුද්ධ වටිනාකම |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ඉඩම් හා ගොඩනැගිලි | 3,076.48 | 853.94 | 2,222.54 | 1,795.05 |
| පිරියත හා උපකරණ | 1,901.72 | 1,799.79 | 101.93 | 99.75 |

(ඇ) සමාලෝචිත වසර තුළ සමූහය විසින් රුපියල් මිලියන 2,896.64 ක්වූ (2014 – රුපියල් මිලියන 3,201.72) සමුච්චිත වටිනාකමක් සහිත දේපළ, පිරියත හා උපකරණ අත්කර ගන්නා ලදී. දේපළ, පිරියත හා උපකරණ අත්කර ගැනීම සඳහා වසර තුළ රුපියල් මිලියන 1,977.32 ක් වශයෙන් ගණනයවූ මුදල් ගෙවීම් සිදු කරන ලදී. (2014 – රුපියල් මිලියන 1,770.87)

(ඈ) රුපියල් මිලියන 10,647.44 ක්වූ ඉදිරියට ගෙන යන දළ මුදල් ප්‍රමාණයක් (2014 – රුපියල් මිලියන 7,518.51) සහිත සම්පූර්ණ ක්ෂය සලසා ඇති වත්කම් ප්‍රමාණයක් සමූහයට අයත් දේපළ, පිරියත හා උපකරණ තුළ අන්තර්ගත වේ.

## 3.3 සමාගම

| | ඉඩම් සහ ගොඩනැගිලි | පිරියත සහ උපකරණ | මෙහෙයුම් බදුකර මතවූ ගුවන් යානා වැඩිදියුණු කිරීම් | ගුවන් යානා ආශ්‍රිත උපකරණ | බදුකර පිරියත හා උපකරණ | අත්තිකාරම්/සක්‍රීය ප්‍රාග්ධන | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **පිරිවැය/ප්‍රත්‍යාගණනය** | | | | | | | |
| **2014.04.01 දිනට ශේෂය** | 2,704.85 | 5,031.89 | 3,201.69 | 6,892.60 | 2,639.61 | 73.36 | 20,544.00 |
| අත්කරගැනීම්/පිළිසකර කිරීම්/ප්‍රත්‍යාගණන* | 416.80 | 377.20 | 636.10 | 969.55 | 402.91 | 386.55 | 3,189.11 |
| පැවරුම්/ගැළපුම් | 20.01 | (18.09) | – | (1.00) | 22.87 | (74.99) | (51.20) |
| ව්‍යපහරණ/විසුම් ගැන්වීම් | (8.34) | (11.26) | (1,258.62) | (2.53) | – | (1.56) | (1,282.31) |
| **2015.03.31 දිනට ශේෂය** | 3,133.32 | 5,379.74 | 2,579.17 | 7,858.62 | 3,065.39 | 383.36 | 22,399.60 |
| **සමුච්චිත ක්ෂය** | | | | | | | |
| **2014.04.01 දිනට ශේෂය** | 561.68 | 3,914.52 | 2,044.81 | 5,276.75 | 374.92 | – | 12,172.68 |
| වර්ෂය සඳහා අයකිරීම් | 235.27 | 311.92 | 647.01 | 363.44 | 380.72 | – | 1,938.36 |
| පැවරුම්/ගැළපුම්/ප්‍රත්‍යාගණන | (249.99) | (1.41) | – | 0.01 | 7.64 | – | (243.75) |
| ව්‍යපහරණ/විසුම් ගැන්වීම් | (6.33) | (10.18) | (1,258.62) | (2.53) | – | – | (1,277.66) |
| **2015.03.31 දිනට ශේෂය** | 540.63 | 4,214.85 | 1,433.20 | 5,637.67 | 763.28 | – | 12,589.63 |
| **2015.03.31 දිනට ශුද්ධ පොත් අගය** | 2,592.69 | 1,164.89 | 1,145.97 | 2,220.95 | 2,302.11 | 383.36 | 9,809.97 |
| 2014.03.31 දිනට ශුද්ධ පොත් අගය | 2,143.17 | 1,117.37 | 1,156.88 | 1,615.85 | 2,264.69 | 73.36 | 8,371.32 |

*ඉහත සඳහන් ප්‍රත්‍යාගණන ගැළපුම, ලාභය හෝ අලාභය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබ ඇති දුබලතාවට පත් ගොඩනැගිලිවලට අදාළ රුපියල් මිලියන 37.8 ක මුදල් ප්‍රමාණය රහිතවය.*

**3.4** (අ) ස්වාධීන තක්සේරුකරුවකුවූ රන්ජන් ජේ. සමරකෝන් මහතා (ඒ.අයි.වී/ශ්‍රී ලංකා – ආයතනික තක්සේරුකරු) ප්‍රත්‍යාගණනය කිරීමක අනුසාරයෙන් ඉකුත් මූල්‍ය වර්ෂය තුළ සමාගමට අයත් ඉඩම් හා ගොඩනැගිලිවල සාධාරණ අගය නිශ්චය කරන ලදී. එම ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵල 2015 මාර්තු මස 31 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම මූල්‍ය ප්‍රකාශ තුළ අන්තර්ගත කර ඇත. ප්‍රත්‍යාගණනයෙන් උද්ගතවූ අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයක් වෙත මාරු කරන ලදී.

තක්සේරුවේදී සඳහන් කරන ලද සමාගමට අයත් ඉඩම්, ගොඩනැගිලි පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වත්කම් | තක්සේරු ක්‍රමය | තක්සේරුවේ ක්‍රියාත්මක දිනය | වැදගත් නිරීක්ෂණය කළ නොහෙන යෙදවුම් | නිරීක්ෂණය කළ නොහෙන යෙදවුම්වලට සාධාරණ අගයේ සංවේදීතාව | සාධාරණ අගයේ ධූරක්‍රමයේ මට්ටම |
|---|---|---|---|---|---|
| ඉඩම් – කොළඹ | විවෘත වෙළෙඳපොළ | 2015 මාර්තු 31 | පර්චසයක ඇස්තමේන්තු මිල රු. මිලියන 12 | සක්‍රියව සහබන්ධ සංවේදිතාව | 3 වන මට්ටම |
| ගොඩනැගිලි – කොළඹ/කටුනායක | ක්‍ෂය කළ ප්‍රතිස්ථාපන පිරිවැය | 2015 මාර්තු 31 | වර්ග අඩියක ඇස්තමේන්තු මිල රු. 475/= – 9,000/= | | |

(ආ) ක්ෂය කිරීම් ඌණ පිරිවැය මත වත්කම් ඉදිරියට ගෙන ගොස් තිබුණේ නම් මූල්‍ය ප්‍රකාශ තුළ අන්තර්ගත කළ යුතුව තිබූ ප්‍රත්‍යාගණනිත වත්කම්වල ධාරණ මුදල් ප්‍රමාණය පහත දැක්වේ.

| වත්කම් වර්ගය | 2015 | | | 2014 |
|---|---|---|---|---|
| | **පිරිවැය** | **පිරිවැය මත වත්කම් ඉදිරියට ගෙන ගොස් තිබුණේ නම් සමුච්චිත ක්ෂය** | **ඉදිරියට ගෙන යන ශුද්ධ වටිනාකම** | ඉදිරියට ගෙන යන ශුද්ධ වටිනාකම |
| | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | රු. මිලියන |
| ඉඩම් හා ගොඩනැගිලි | 1,455.96 | 453.18 | 1,002.78 | 802.61 |

(ඇ) සමාලෝචිත වසර තුළ සමාගම විසින් රුපියල් මිලියන 2,810.85 ක්වූ (2014 – රුපියල් මිලියන 3,209.43) සමුච්චිත වටිනාකමක් සහිත දේපළ, පිරියත හා උපකරණ අත්කර ගන්නා ලදී. දේපළ, පිරියත හා උපකරණ අත්කර ගැනීම සඳහා වසර තුළ රුපියල් මිලියන 1,893.30 ක් වශයෙන් ගණනයවූ මුදල් ගෙවීම් සිදු කරන ලදී. (2014 – රුපියල් මිලියන 1,725.90)

(ඈ) රුපියල් මිලියන 10,533.91 ක්වූ ඉදිරියට ගෙන යන දළ මුදල් ප්‍රමාණයක් (2014 – රුපියල් මිලියන 7,515.20) සහිත සම්පූර්ණ ක්ෂය සලසා ඇති වත්කම් ප්‍රමාණයක් සමාගමේ දේපළ, පිරියත හා උපකරණ තුළ අන්තර්ගත වේ.

## 4. ගුවන් යානා ඇණවුම් කිරීමේ පූර්ව ගෙවීම්

ඇණවුම් කිරීමේ පූර්ව ගෙවීම් සමන්විත වනුයේ, 2014 සිට 2021 අතර කාලය තුළ A330-300 ගුවන් යානා හයක් සහ A350-900 ගුවන් යානා හතරක් මිලදී ගැනීම සඳහා එයාර්බස් ආයතනය සමඟ එළඹි මිලදී ගැනීමේ ගිවිසුම පදනම්වය. 2015 සිට 2021 අතර කාලය තුළ භාරදිය යුතු A330-300 ගුවන් යානා තුනක් සහ A350-900 ගුවන් යානා හතරක් සඳහා කරන ලද පූර්ව බෙදාහැරීමේ ගෙවීම්වලින් රපෝර්තු දිනට ගෙවිය යුතු පූර්ව බෙදාහැරීමේ ගෙවීම් සමන්විත වේ. රුපියල් මිලියන 16,639.67 ක් වශයෙන් ගණනය වන දොළොස් මසක් ඇතුළත බදුකරුවන් වෙතින් අයකර ගත යුතු ඇණවුම් කිරීමේ පූර්ව ගෙවීම් මුදලක් වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු මුදල් යටතේ අන්තර්ගත කර ඇත.

## 5. ගුවන් යානා නඩත්තු සංචිතය

| | | සමූහය/සමාගම | |
|---|---|---|---|
| | සටහන | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන |
| අප්‍රේල් 01 දිනට ශේෂය | | **26,261.65** | 21,737.58 |
| ගෙවීම් | | **8,471.22** | 8,739.21 |
| ගැළපුම්* | | **(9,255.77)** | (123.47) |
| අයකරගැනීම් | | **(3,973.06)** | (4,916.86) |
| උපලබ්ධි නොවූ විනිමය ලාභය | | **544.78** | 825.19 |
| | | **22,048.82** | 26,261.65 |
| අඩුකළා: දුබලතා සඳහා ප්‍රතිපාදනය | 5.2 | **(9,769.46)** | (9,526.93) |
| **මාර්තු 31 දිනට අයකරගත හැකි ශුද්ධ ශේෂය** | 5.1 | **12,279.36** | 16,734.72 |

### 5.1 ජංගම/ජංගම නොවන වර්ගීකරණය

| | දළ<br>රු. මිලියන | දුබලතා සඳහා ප්‍රතිපාදනය<br>රු. මිලියන | ශුද්ධ<br>රු. මිලියන | වසරක් තුළ අයකරගත හැකි මුදල<br>රු. මිලියන | වසරකින් පසු අයකරගත හැකි මුදල<br>රු. මිලියන |
|---|---|---|---|---|---|
| **2015.03.31 දිනට ශේෂය** | 22,048.82 | (9,769.46) | 12,279.36 | 6,209.96 | 6,069.40 |
| 2014.03.31 දිනට ශේෂය | 26,261.65 | (9,526.93) | 16,734.72 | 9,384.01 | 7,350.71 |

### 5.2 දුබලතා සඳහා ප්‍රතිපාදනවල සංචලනය

| | **2015<br>රු. මිලියන** | 2014<br>රු. මිලියන |
|---|---|---|
| අප්‍රේල් 01 දිනට ශේෂය | **9,526.93** | 1,835.65 |
| වසර තුළ අයගත කළ | **4,024.42** | 3,061.11 |
| ගැළපුම්* | **(4,011.22)** | 4,566.46 |
| උපලබ්ධි නොවූ විනිමය ලාභය | **229.33** | 63.71 |
| මාර්තු 31 දිනට ශේෂය | **9,769.46** | 9,526.93 |

**ලාභය හෝ අලාභය පිළිබඳ ප්‍රකාශයෙහිලා සිදුවන පරිවර්තන වාර්ෂිය බලපෑම, ගුවන් යානා අලුත්වැඩියා හා පිරිවැඩියා පිරිවැය ප්‍රතිපාදනයේ (15 වන සටහන) ආපසු ලිවීමට අදාළ ශුද්ධ බලපෑම සහ A340-300 ගුවන් යානා තුනක් සඳහා නැවත ගනුදෙනු කළ පසු ලැබුම් කොන්දේසිවලින් අනතුරුව ගුවන් යානා නඩත්තු සංචිතයේ (5 වන සටහන) ශුද්ධ ලියා හැරීම් හා සම්බන්ධ මුදල් ප්‍රමාණ අන්තර්ගත වේ.*

## 6. අස්පෘෂ්‍ය වත්කම්

| | සමූහය | | | සමාගම | | |
|---|---|---|---|---|---|---|
| | මෘදුකාංග<br>රු. මිලියන | මූලධන ක්‍රියාත්මක වැඩ<br>රු. මිලියන | එකතුව<br>රු. මිලියන | මෘදුකාංග<br>රු. මිලියන | සක්‍රීය ප්‍රාග්ධන වැඩ<br>රු. මිලියන | එකතුව<br>රු. මිලියන |
| **පරිගණක මෘදුකාංග** | | | | | | |
| **පිරිවැය** | | | | | | |
| 2014 අප්‍රේල් 01 දිනට ශේෂය | 2,870.65 | 22.73 | 2,893.38 | 2,835.99 | 22.73 | 2,858.72 |
| අත්කරගැනීම්/පිළිසකර කිරීම් | 133.18 | 20.60 | 153.78 | 132.77 | 20.60 | 153.37 |
| පැවැරුම්/ගැළපුම් | (840.83) | (39.15) | (879.98) | (840.83) | (39.15) | (879.98) |
| ව්‍යපහරණ | (8.61) | – | (8.61) | (8.61) | – | (8.61) |
| **2015 මාර්තු 31 දිනට ශේෂය** | 2,154.39 | 4.18 | 2,158.57 | 2,119.32 | 4.18 | 2,123.50 |
| **සමුච්චිත හිලව් කිරීම්** | | | | | | |
| 2014 අප්‍රේල් 01 දිනට ශේෂය | 580.17 | – | 580.17 | 551.43 | – | 551.43 |
| වර්ෂය සඳහා අයකිරීම් | 338.81 | – | 338.81 | 337.32 | – | 337.32 |
| පැවැරුම්/ගැළපුම් | (36.87) | – | (36.87) | (36.87) | – | (36.87) |
| ව්‍යපහරණ | (8.61) | – | (8.61) | (8.61) | – | (8.61) |
| **2015 මාර්තු 31 දිනට ශේෂය** | 873.50 | – | 873.50 | 843.27 | – | 843.27 |
| **2015 මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | 1,280.89 | 4.18 | 1,285.07 | 1,276.05 | 4.18 | 1,280.23 |
| 2014 මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය | 2,290.48 | 22.73 | 2,313.21 | 2,284.56 | 22.73 | 2,307.29 |

රුපියල් මිලියන 474.54 ක්වූ ඉදිරියට ගෙන යන දළ මුදල් ප්‍රමාණයක් (2014 – රුපියල් මිලියන 409.56) සහිත සම්පූර්ණයෙන් හිලව් කරන ලද වත්කම් ප්‍රමාණයත් සමාගමේ අස්පෘෂ්‍ය වත්කම් තුළ අන්තර්ගත වේ.

## 7. ආයෝජන

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන |
| **ජංගම නොවන ආයෝජන** | | | | |
| **ශ්‍රී ලංකාවේ අනුබද්ධ සමාගමේ ආයෝජන** | | | | |
| - ශ්‍රීලංකන් කේටරින් ලිමිටඩ් | **–** | – | **42.24** | 42.24 |
| (ශුද්ධ වත්කම් අගය මත අධ්‍යක්ෂවරුන්ගේ තක්සේරුව රුපියල් බිලියන 5.87 (2014 – රුපියල් බිලියන 4.65) | | | | |
| - එයාර් ලංකා (පුද්ගලික) සමාගම (කොටස් 40,000)* | **0.40** | 0.40 | **0.20** | 0.20 |
| | **0.40** | 0.40 | **42.44** | 42.44 |

**සී/ස එයාර් ලංකා (පුද්ගලික) සමාගමේ 50% ක්වූ කොටස් ප්‍රාග්ධනය සමාගම විසින් දරණු ලබන අතර ඉතිරි 50% ක්වූ ප්‍රමාණය දරණුයේ අනුබද්ධ සමාගම විසිනි. සී/ස එයාර් ලංකා (පුද්ගලික) සමාගම සමාරම්භයේ සිටම අක්‍රීය තත්ත්වයේ පවත්නා සමාගමකි.*

## 8. ඉන්වෙන්ටරි භාණ්ඩ

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | සටහන | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන |
| පාරිභෝජන ද්‍රව්‍ය හා අමතර දෑ | | **6,159.71** | 5,568.10 | **6,055.24** | 5,474.06 |
| අමුද්‍රව්‍ය | | **235.75** | 201.98 | **–** | – |
| තීරු බදු රහිත වෙළෙඳ ද්‍රව්‍ය | | **2.37** | 2.21 | **2.37** | 2.21 |
| අඩුකළා: මන්දගාමීව චලනය වන තොග ප්‍රතිපාදන | 8.1 | **(999.96)** | (732.06) | **(979.41)** | (726.53) |
| | | **5,397.87** | 5,040.23 | **5,078.20** | 4,749.74 |

### 8.1 මන්දගාමීව චලනය වන තොග සඳහා ප්‍රතිපාදන

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන |
| අප්‍රේල් 1 දිනට ශේෂය | **(732.06)** | (650.69) | **(726.53)** | (646.21) |
| වසර තුළ සිදුකළ ප්‍රතිපාදන | **(279.85)** | (303.83) | **(264.83)** | (302.78) |
| වසර තුළ කපා හැරීම් | **11.95** | 222.46 | **11.95** | 222.46 |
| මාර්තු 31 දිනට ශේෂය | **(999.96)** | (732.06) | **(979.41)** | (726.53) |

## 9. වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු මුදල්

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | සටහන | 2015 රු. මිලියන | 2014 රු. මිලියන | 2015 රු. මිලියන | 2014 රු. මිලියන |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | | 10,165.86 | 11,017.39 | 9,673.74 | 10,168.27 |
| අඩුකළා: ලැබීම් නියමිත දුබලතා සඳහා ප්‍රතිපාදනය | 9.2 | (201.65) | (384.04) | (193.45) | (380.61) |
| | | 9,964.21 | 10,633.35 | 9,480.29 | 9,787.66 |
| වෙනත් ණයගැතියෝ | | 1,274.39 | 191.88 | 1,274.40 | 191.88 |
| ගුවන් යානා පූර්ව බෙදාහැරීමේ ගෙවීම් | 4 | 16,639.67 | 2,745.75 | 16,639.67 | 2,745.75 |
| තැන්පතු, අත්තිකාරම් සහ පූර්ව ගෙවීම් | | 3,178.95 | 2,414.87 | 2,976.30 | 2,146.34 |
| ගුවන් යානා උපනයන කටයුතු වලින් | | 1,701.19 | 1,032.32 | 1,701.19 | 1,032.32 |
| | | 32,758.41 | 17,018.17 | 32,071.85 | 15,903.95 |
| කාර්ය මණ්ඩලයට ණය හා අත්තිකාරම් | 9.3 | 60.34 | 73.49 | 42.81 | 55.54 |
| | | 32,818.75 | 17,091.66 | 32,114.66 | 15,959.49 |

වෙළෙඳ ලැබිය යුතු මුදල් පොලී නොදරණ අතර සාමාන්‍යයෙන් දින 30 ක ණය කොන්දේසිය මත පවතී.

### 9.1 මාර්තු මස 31 වන දිනට වෙළඳ නියමිතවල ආයුපූරණ විශ්ලේෂණයක් පහත දැක්වේ

2015 මාර්තු මස 31 වන දිනට සමූහයට අදාළ රුපියල් මිලියන 201.65 ක් වූ සහ සමාගමට අදාළ රුපියල් මිලියන 193.45 ක් වූ වෙළෙඳ ලැබිය යුතු මුදල් වල වටිනාකම දුබලත්වයට පත්වූ අතර ඊට පූර්ණ ප්‍රතිපාදන සපයා ඇත. වෙළෙඳ ලැබිය යුතු මුදල් වල දුබලත්වයේ සංචලනය සඳහා පහත දැක්වෙන 9.2 සටහන බලන්න.

| | එකතුව | ඉකුත් නියමිත හෝ දුබලත්වයට නොපත් | දුබලත්වයට නොපත් ඉකුත් නියමිත | | | |
|---|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | දින 30-60 රු. මිලියන | දින 61-90 රු. මිලියන | දින 91-180 රු. මිලියන | දින>180 රු. මිලියන |
| 2015.03.31 දිනට ශේෂය | | | | | | |
| සමාගම | 9,480.29 | 6,425.57 | 2,154.27 | 289.98 | 442.60 | 167.87 |
| සමූහය | 9,964.21 | 6,630.28 | 2,340.90 | 333.13 | 486.78 | 173.12 |

### 9.2 ලැබීම් නියමිත දුබලතා සඳහාවූ ප්‍රතිපාදනයේ සංචලනය

| | සමූහය | සමාගම |
|---|---|---|
| | 2015 රු. මිලියන | 2015 රු. මිලියන |
| අප්‍රේල් 1 දිනට ශේෂය | 384.04 | 380.61 |
| වර්ෂය සඳහා දුබලතාව* | 230.32 | 225.55 |
| වසර තුළ කපා හැරී මුදල | (412.71) | (412.71) |
| මාර්තු 31 දිනට ශේෂය | 201.65 | 193.45 |

*රජය හා සම්බන්ධ ආයතනවලින් නියමිත අනුමාන ලැබීම් නිමිත්තෙන් සිදුකර ඇති රුපියල් මිලියන 127.82 ක් වූ ප්‍රතිපාදනයක් (2014 රුපියල් මිලියන 12.16) ලැබීම් දුබලතා සඳහා වූ ප්‍රතිපාදනයට ඇතුළත් වේ.*

### 9.3 කාර්ය මණ්ඩලයට ණය හා අත්තිකාරම්

පහත දක්වා ඇත්තේ කාර්ය මණ්ඩලයට ප්‍රදානය කරන ලද රුපියල් 20,000/= ඉක්මවූ ණය සහ අත්තිකාරම් මුදල්වල විස්තර පමණි.

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන |
| අප්‍රේල් 1 දිනට ශේෂය | 1.52 | 2.89 | 0.74 | 2.14 |
| වසර තුළ දෙන ලද ණය | 2.75 | 2.80 | – | – |
| ආපසු ගෙවීම් | (3.21) | (4.17) | (0.69) | (1.40) |
| මාර්තු 31 දිනට ශේෂය | 1.06 | 1.52 | 0.05 | 0.74 |

## 10. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල් සාම්‍යයන්

**මුදල් හා මුදල් සාම්‍යයන්හී අංග**

| | සටහන | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන |
| **10.1 හිතකර මුදල් හා මුදල් සාම්‍යයන්හි ශේෂ** | | | | | |
| මුදල් හා බැංකු ශේෂ | | 3,749.18 | 5,500.14 | 3,669.09 | 5,350.83 |
| කෙටිකාලීන තැන්පතු | | 1,097.52 | 1,106.49 | 1,090.32 | 1,106.49 |
| | | 4,846.70 | 6,606.63 | 4,759.41 | 6,457.32 |
| **10.2 අහිතකර මුදල් හා මුදල් සාම්‍යයන්හි ශේෂ** | | | | | |
| බැංකු අයිරා | 14 | (5,533.26) | (7,342.76) | (5,533.26) | (7,342.76) |
| | | (686.56) | (736.13) | (773.85) | (885.44) |
| **10.3 සීමිත මුදල්** | 14.2 (අ) | (2,831.86) | (1,682.98) | (2,831.86) | (1,682.98) |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුළු මුදල හා මුදල් සාම්‍යයන් | | (3,518.42) | (2,419.11) | (3,605.71) | (2,568.42) |

## 11. ප්‍රකාශිත ප්‍රාග්ධනය

### 11.1 නිකුත්කළ ප්‍රාග්ධනය

| | සමූහය/සමාගම | |
|---|---|---|
| | **2015 මිලියන ගණන** | 2014 මිලියන ගණන |
| **නිකුත්කළ හා සම්පූර්ණයෙන් ගෙවන ලද සාමාන්‍ය කොටස්** | | |
| අප්‍රේල් 1 වන දිනට | 320.32 | 51.46 |
| වසර තුළ නිකුත්කළ හා සම්පූර්ණයෙන් ගෙවන ලද | 195.85 | 268.86 |
| මාර්තු 31 වන දිනට | 516.17 | 320.32 |

### 11.2 ප්‍රකාශිත ප්‍රාග්ධනයේ වෙනස්වීම්

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | සටහන | 2015 රු. මිලියන | 2014 රු. මිලියන | 2015 රු. මිලියන | 2014 රු. මිලියන |
| නිකුත්කළ හා සම්පූර්ණයෙන් ගෙවන ලද සාමාන්‍ය කොටස් | 11.3 | 51,617.44 | 32,032.75 | 51,617.44 | 32,032.75 |
| කොටස් ප්‍රාග්ධනය සඳහා අත්තිකාරම් | 11.4 | – | 19,584.69 | – | 19,584.69 |
| වරණීය කොටස් | | 1,000.00 | 1,000.00 | – | – |
| | | 52,617.44 | 52,617.44 | 51,617.44 | 51,617.44 |
| අඩුකළා: ප්‍රතිවර්ගීකරණය කරන ලද වරණීය කොටස් | 13 | (1,000.00) | (1,000.00) | – | – |
| | | 51,617.44 | 51,617.44 | 51,617.44 | 51,617.44 |

### 11.3 නිකුත්කළ හා සම්පූර්ණයෙන් ගෙවන ලද සාමාන්‍ය කොටස්

| | | සමූහය/සමාගම | |
|---|---|---|---|
| | සටහන | 2015 රු. මිලියන | 2014 රු. මිලියන |
| අප්‍රේල් 1 වන දිනට | | 32,032.75 | 5,146.35 |
| වසර තුළ නිකුත්කළ හා සම්පූර්ණයෙන් ගෙවන ලද | 11.4 | 19,584.69 | 26,886.40 |
| මාර්තු 31 වන දිනට | | 51,617.44 | 32,032.75 |

### 11.4 කොටස් ප්‍රාග්ධනය සඳහා අත්තිකාරම්

| | සමූහය/සමාගම | |
|---|---|---|
| | 2015 රු. මිලියන | 2014 රු. මිලියන |
| අප්‍රේල් 1 වන දිනට | 19,584.69 | 26,886.40 |
| වසර තුළ ලත් අත්තිකාරම් | – | 19,584.69 |
| වසර තුළ නිකුත්කළ කොටස් | (19,584.69) | (26,886.40) |
| මාර්තු 31 වන දිනට | – | 19,584.69 |

## 12. සංචිත

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2015 රු. මිලියන | 2014 රු. මිලියන | 2015 රු. මිලියන | 2014 රු. මිලියන |
| ප්‍රත්‍යාගණන සංචිතය | 4,355.27 | 2,522.65 | 2,514.89 | 1,850.94 |
| ආදායම් සංචිතය | – | 0.63 | – | 0.63 |
| පොදු සංචිතය | – | 53.44 | – | 53.44 |
| | 4,355.27 | 2,576.72 | 2,514.89 | 1,905.01 |

## 13. වරණීය කොටස්

### වරණීය කොටස් – දස අවුරුදු පරිවර්තය – සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල

ඡන්දය රහිත නිදහස් කර ගත හැකි සමුච්චිත පරිවර්තය වරණීය කොටස් අදාළ හිමිකරුගේ කැමැත්ත මත එකඟ වූ පදනමක් මත 2015 මැයි මස 16 වන දින හෝ අනිවාර්ය කල් ඉකුත්වීමේ දිනයේදී (2020 මැයි මස 16 වන දින) පරිවර්තනය කර ගත හැකිය. අදාළ හිමිකරු 15% ක් වූ වාර්ෂික ස්ථිර වරණීය කොටස් ලාභාංශයකට ද හිමිකම් ලබයි.

## 14. පොලී දරණ බැරකම්

| | සටහන | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | | 2015 රු. මිලියන | 2014 රු. මිලියන | 2015 රු. මිලියන | 2014 රු. මිලියන |
| **ජංගම බැරකම්** | | | | | |
| දීර්ඝ කාලීන ණය | 14.1 | 11,750.63 | 11,065.54 | 11,750.63 | 11,293.38 |
| මූල්‍ය බදුකර | 14.4 | 610.42 | 449.50 | 601.49 | 445.29 |
| කෙටිකාලීන ණය | | 22,487.34 | 2,876.50 | 22,487.34 | 2,876.50 |
| බැංකු අයිරා | | 5,533.26 | 7,342.76 | 5,533.26 | 7,342.76 |
| | | 40,381.65 | 21,734.30 | 40,372.72 | 21,957.93 |
| **ජංගම නොවන බැරකම්** | | | | | |
| දීර්ඝ කාලීන ණය | 14.1 | 33,590.45 | 21,211.26 | 33,590.45 | 21,869.32 |
| මූල්‍ය බදුකර | 14.4 | 2,117.36 | 1,964.26 | 2,102.46 | 1,961.67 |
| | | 35,707.81 | 23,175.52 | 35,692.91 | 23,830.99 |

### 14.1 දිගුකාලීන ණය

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2015 රු. මිලියන | 2014 රු. මිලියන | 2015 රු. මිලියන | 2014 රු. මිලියන |
| **(අ) ජංගම නොවන ප්‍රතිවර්ගීකරණය** | | | | |
| ජංගම බැරකම් යටතේ ඇතුළත් වසරකින් ගෙවිය යුතු | 11,750.63 | 11,065.54 | 11,750.63 | 11,293.38 |
| වසරකින් පසු එහෙත් වසර පහකට නොවැඩි | 33,590.45 | 21,211.26 | 33,590.45 | 21,869.32 |
| | 45,341.08 | 32,276.80 | 45,341.08 | 33,162.70 |
| **(ආ) විදේශ ව්‍යවහාර මුදලින් ගණනය වන දිගුකාලීන ණය** | | | | |
| දිගුකාලීන ණය - ඇ.ඩො. වලින් ගණනිතය | 312.42 | 209.83 | 312.42 | 209.05 |
| දිගුකාලීන ණය - AED | 122.43 | 183.65 | 122.43 | 183.65 |
| **(ඇ) දිගුකාලීන ණය සංචලනය** | | | | |
| අප්‍රේල් 1 දිනට ශේෂය | 32,276.80 | 36,125.96 | 33,162.70 | 37,187.69 |
| වසර තුළ එකතු කිරීම්/පැවරුම් | 23,989.48 | 19,805.34 | 24,061.74 | 19,805.34 |
| වසර තුළ ගෙවීම් | (11,792.14) | (24,717.21) | (12,746.63) | (24,927.67) |
| උපලබ්ධි නොවූ විනිමය අලාභය | 866.94 | 1,062.71 | 863.27 | 1,097.34 |
| මාර්තු 31 දිනට ශේෂය | 45,341.08 | 32,276.80 | 45,341.08 | 33,162.70 |

## 14.2 සමාගම

| ණය දෙනුවා | **2015 මාර්තු මස 31 දිනට ශේෂය රු. මිලියන** | 2014 මාර්තු මස 31 දිනට ශේෂය රු. මිලියන | ආපසු ගෙවුම් කාලය | ඇපකරය | |
|---|---|---|---|---|---|
| **(අ) බැංකු ණය** | | | | | |
| LIBOR ආශ්‍රිත පොලිය | | | | | |
| ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව හරහා හවුල් ණය | 13,191.89 | 19,453.13 | 2017 මාර්තු මසින් අවසන් මාසික වාරික | කුවේට්, බහරේන්, එක්සත් අරාබි එමීර් රාජ්‍ය, සවුදි අරාබිය, ඕමානය, එක්සත් රාජධානිය, චීනය, ප්‍රංශය සහ ඉන්දියාව යන රටවලින් ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය විසින් එකතු කළ ගුවන් ටිකට්පත් විකුණුම් සහ ඇ.ඩො.මි. 50 ක්වූ රජයේ ඇප සහතිකයක් ලෙස ණය වාරික තුනක් පවත්වාගනී. | |
| ස්ටැන්ඩර්ඩ් චාටඩ් බැංකුව | 3,077.62 | – | 2015 සැප්තැම්බර් මසින් අවසන් මාසික වාරික | තායිලන්තය, ජර්මනිය සහ ශ්‍රී ලංකාව යන රටවලින් ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය විසින් එකතු කළ ගුවන් ටිකට්පත් | |
| ලංකා බැංකුව | 518.70 | 980.63 | 2016 අප්‍රේල් මසින් අවසන් මාසික වාරික | සී/ස ශ්‍රීලංකන් කේටරින් සමාගමේ සාමන්‍ය කොටස් එල්ලේ උකස්කරය. | |
| ලංකා බැංකුව | – | 2,615.00 | 2014 අගෝස්තු මසින් අවසන් මාසික වාරික | ජාත්‍යන්තර බැදුම්කර මුදලින් ණය ආපසු ගෙවීම සඳහා සමාගම නිකුත්කර ඇති එකඟතා ලිපිය | |
| ලංකා කොමර්ෂල් බැංකුව | 923.35 | 1,218.86 | 2018 පෙබරවාරි මසින් අවසන් මාසික වාරික | ඇ.ඩො. 750,000 ක ස්ථාවර තැන්පතුව | ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය විසින් කටාර් රාජ්‍යයෙන් එකතු කළ ගුවන් ටිකට්පත් විකුණුම් සහ ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය විසින් එක්සත් රාජධානියෙන් එකතු කළ ගුවන් භාණ්ඩ විකුණුම් |
| ලංකා කොමර්ෂල් බැංකුව | 402.21 | 441.22 | 2019 මාර්තු මසින් අවසන්මාසික වාරික | මෙම පහසුකම යටතේ ගොඩබිම් මෙහෙයුම් උපකරණ සම්බන්ධ ඇ.ඩො. 350,000 ක් වූ ස්ථාවර තැන්පතු සහ උකස්කරය | |
| ලංකා කොමර්ෂල් බැංකුව | 842.34 | – | 2018 ජූලි මසින් අවසන් මාසික වාරික | ඇ.ඩො. 800,000 ක ස්ථාවර තැන්පතුව | |
| අමානා බැංකුව | 292.16 | 248.43 | 2020 දෙසැම්බර් මසින් අවසන් මාසික වාරික | ඉඩම් හැර A320 ගුවන් යානාගාරය සහ සිමියුලේටර ගොඩනැගිල්ල විකිණීම, බදුදීම, අන්සතු කිරීම හෝ උකස් කිරීම සම්බන්ධයෙන් සමාගමට පනවා ඇති සීමාව. | |
| AWPLR ආශ්‍රිත පොලිය | | | | | |
| ලංකා බැංකුව | 5,000.00 | – | රජය විසින් කෙරෙන ප්‍රාග්ධන නික්ෂේපනය ලද පසු | රජය විසින් කෙරෙන ප්‍රාග්ධන නික්ෂේපනය ලද පසු බේරුම් කිරීම සහතික කරනු ලබන එකඟතා ලිපිය | |
| **ස්ථාවර පොලී අනුපාතය** | | | | | |
| සිටි බැංකුව | 266.00 | 261.50 | දින 90 කින් ගෙවියන පහසුකම | නැත | |
| **(ආ) ජාත්‍යන්තර බැඳුම්කර** | | | | | |
| **ස්ථාවර පොලී අනුපාතය** | | | | | |
| ජාත්‍යන්තර බැදුම්කර | 23,275.00 | – | කල්පිරීම මත 2019 ජූනි මාසයේදී ගෙවීම | ඇ.ඩො.මි. 175 ක් වූ ශ්‍රී ලංකා රජයේ ඇප සහතිකය | |

| ණය දෙනුවා | **2015 මාර්තු මස 31 දිනට ශේෂය රු. මිලියන** | 2014 මාර්තු මස 31 දිනට ශේෂය රු. මිලියන | ආපසු ගෙවුම් කාලය | ඇපකරය |
|---|---|---|---|---|
| **(ඇ) වෙනත් ආයතනවලින් ණය** | | | | |
| **LIBOR අශ්‍රිත පොලිය** | | | | |
| පී.ඩී.පී. ණය පහසුකම | 14,143.72 | – | ගුවන් යානය භාරදුන් පසු | භාරදිය යුතු ගුවන්යානය මත ඇප සහතිකවී ඇත. |
| අනුබද්ධ ආයතනය | – | 1,060.76 | 2014 සැප්තැම්බර් මස වාර්ෂික වාරික 5 ක අවසන් විය. | නැත |
| සැපයුම්කරුවකුගේ විලම්බිත ගෙවුම් වැඩපිළිවෙල | 6,367.37 | 10,218.39 | 2016 සැප්තැම්බර් මස අවසන් වන කාර්තුමය වාරික | නැත |
| **ස්ථාවර පොලී අනුපාතය** | | | | |
| ගුවන් යානා බදුකරු | 67.03 | 89.37 | 2017 ජූනි මස අවසන් වන මාසික වාරික | |

## 14.3 අනුබද්ධ සමාගම

| | | | | |
|---|---|---|---|---|
| **(අ) බැංකු ණය** | | | | |
| **LIBOR ආශ්‍රිත පොලිය** | | | | |
| ලංකා කොමර්ෂල් බැංකුව | – | 97.72 | 2015 දී සම්පූර්ණයෙන් පියවන ලදී | සමාගම විසින් අත්සන් කරන ලද ඇ.ඩො. 3,000,000ක් සඳහා වූ කොන්දේසි රහිත හා අවලංගු කළ නොහැකි ගෙවුම් ඇපකරය. |
| ලංකා කොමර්ෂල් බැංකුව | – | 4.90 | 2015 දී සම්පූර්ණයෙන් පියවන ලදී | අනුබද්ධ සමාගම විසින් අත්සන් කරන ලද යන්ත්‍රෝපකරණ සම්බන්ධ ඇ.ඩො. 200,000ක්වූ උකස් බැඳුම්කරය. |

**USD සහ AED විනිමයෙන් ගණනය කර ඇති පොලී දරණ බැරකම් 2015 මාර්තු මස 31 දිනට පිළිවෙළින් රු. 133.00 ක් (2014 - රු. 130.75) ක් සහ රු. 35.33 (2014 - රු. 34.73) ක් වශයෙන් වූ විනිමය අනුපාත මත ශ්‍රී ලංකා රුපියලේ අගය අනුව පරිවර්තනය කරන ලදී.*

## 14.4 මූල්‍ය බදුකර බැරකම්

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන |
| **(අ) ජංගම/ජංගම නොවන වර්ගීකරණය** | | | | |
| ජංගම බැරකම් යටතේ ඇතුළත් වසරකින් ගෙවිය යුතු | 610.42 | 449.50 | 601.49 | 445.29 |
| ජංගම නොවන බැරකම් යටතේ ඇතුළත් වසරකින් පසු එහෙත් වසර පහකට නොවැඩි ජංගම නොවන බැරකම් | 1,665.41 | 968.65 | 1,650.51 | 966.06 |
| ජංගම නොවන බැරකම් යටතේ ඇතුළත් වසර පහකට වැඩි | 451.95 | 995.61 | 451.95 | 995.61 |
| ජංගම නොවන බැරකම් යටතේ ඇතුළත් වසරකින් පසු | 2,117.36 | 1,964.26 | 2,102.46 | 1,961.67 |

| | සමූහය/සමාගම | |
|---|---|---|
| | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන |
| **(ආ) විදේශ ව්‍යවහාර මුදලින් ගණනිත මූල්‍ය බදුකර** | | |
| මූල්‍ය බදුකර - යුරෝ මුදලිනි | 10.10 | 12.42 |
| මූල්‍ය බදුකර - ස්ටර්ලින් පවුම්වලිනි | 0.08 | 0.10 |
| මූල්‍ය බදුකර - ඇ.ඩො. වලිනි | 8.62 | 0.31 |

| | සමූහය | | | |
|---|---|---|---|---|
| | ගෙවිය යුතු දළ මුදල, රු. මිලියන | ඉදිරි කාල සඳහා මූල්‍ය ගාස්තු රු. මිලියන | **ගෙවිය යුතු ශුද්ධ මුදල 2015 රු. මිලියන** | ගෙවිය යුතු ශුද්ධ මුදල 2014 රු. මිලියන |
| **(ඇ) මූල්‍ය බදුකර බැරකම් සංචලනය** | | | | |
| අප්‍රේල් 1 දිනට ශේෂය | 3,290.98 | (877.22) | **2,413.76** | 950.71 |
| වසර තුළ එකතු කිරීම් | 1,342.91 | (185.61) | **1,157.30** | 1,454.45 |
| වසර තුළ ගෙවීම් | (676.81) | 229.15 | **(447.66)** | (101.04) |
| උපලබ්ධි නොවූ විනිමය ලාභය/(අලාභය) | (537.53) | 141.91 | **(395.62)** | 109.64 |
| මාර්තු 31 දිනට ශේෂය | 3,419.55 | (691.77) | **2,727.78** | 2,413.76 |

| | සමාගම | | | |
|---|---|---|---|---|
| | ගෙවිය යුතු දළ මුදල, රු. මිලියන | ඉදිරි කාල සඳහා මූල්‍ය ගාස්තු රු. මිලියන | **ගෙවිය යුතු ශුද්ධ මුදල 2015 රු. මිලියන** | ගෙවිය යුතු ශුද්ධ මුදල 2014 රු. මිලියන |
| අප්‍රේල් 1 දිනට ශේෂය | 3,285.06 | (878.10) | **2,406.96** | 939.35 |
| වසර තුළ එකතු කිරීම් | 1,312.68 | (176.37) | **1,136.31** | 1,454.45 |
| වසර තුළ ගෙවීම් | (672.59) | 228.90 | **(443.69)** | (96.48) |
| උපලබ්ධි නොවූ විනිමය ලාභය/(අලාභය) | (537.53) | 141.90 | **(395.63)** | 109.64 |
| මාර්තු 31 දිනට ශේෂය | 3,387.62 | (683.67) | **2,703.95** | 2,406.96 |

## 15. වෙනත් දිගුකාලීන බැරකම්

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | සටහන | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන |
| ගුවන් යානා නඩත්තු සහ පිරිවැඩියා වියදම් ප්‍රතිපාදනය | 15.1 (ආ) | **3,427.88** | 4,399.61 | **3,427.88** | 4,399.61 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 15.2 | **4,578.99** | 3,102.24 | **4,129.07** | 2,747.98 |
| විලම්බිත බදු බැරකම් | | **77.14** | 2.91 | **–** | – |
| | | **8,084.01** | 7,504.76 | **7,556.95** | 7,147.59 |

### 15.1 ගුවන් යානා නඩත්තු සහ පිරිවැඩියා වියදම් ප්‍රතිපාදනය

| | | සමූහය/සමාගම | |
|---|---|---|---|
| | සටහන | 2015<br>රු. මිලියන | 2014<br>රු. මිලියන |
| **(අ) සංචලනය** | | | |
| අප්‍රේල් 1 දිනට | | 22,308.57 | 23,073.46 |
| වර්ෂය සඳහා ප්‍රතිපාදන | | 3,524.27 | 3,002.72 |
| ආපසු එවුම් කොන්දේසි ප්‍රතිගනුදෙනු මත ගැලපුම් | 5 | (5,939.27) | – |
| උපයෝජනය | | (6,414.07) | (3,767.61) |
| මාර්තු 31 දිනට | | 13,479.50 | 22,308.57 |
| **(ආ) ජංගම/ජංගම නොවන වර්ගීකරණය** | | | |
| වෙළෙඳ ගෙවීම් නියමිත යටතේ ඇතුළත් වසරක් තුළ ගෙවිය යුතු | 17 | 10,051.62 | 17,908.96 |
| දිගුකාලීන බැරකම් ඇතුළත්ව වසරකින් පසු | | 3,427.88 | 4,399.61 |
| | | 13,479.50 | 22,308.57 |

### 15.2 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් - පාරිතෝෂිකය

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2015<br>රු. මිලියන | 2014<br>රු. මිලියන | 2015<br>රු. මිලියන | 2014<br>රු. මිලියන |
| අප්‍රේල් 1 දිනට ශේෂය | 3,102.24 | 3,264.95 | 2,747.98 | 2,983.76 |
| ප්‍රවර්තන වර්ෂයේ සේවා වියදම් හා පොලී වියදම් | 591.36 | 544.48 | 528.54 | 492.17 |
| ආයුගණක (ලාභය)/අලාභය | 1,116.89 | (512.66) | 1,054.24 | (548.19) |
| වසර තුළ ගෙවීම් | (231.50) | (194.53) | (201.69) | (179.76) |
| මාර්තු 31 දිනට ශේෂය | 4,578.99 | 3,102.24 | 4,129.07 | 2,747.98 |

පහත දැක්වෙන ප්‍රධාන උපකල්පන මත පදනම්ව සී/ස ඇක්චුවේරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්.) සමාගමේ සේවය කරන වෘත්තීය සුදුසුකම් ලත් ජීවගණකශාස්ත්‍රඥයෙකු වන එම්. පූපලනාදන් මහතා විසින් මාර්තු මස 31 වන දිනට අවසන් වර්ෂ සඳහා කාලගණක තක්සේරුවක් කරන ලදී.

| | සමාගම | | අනුබද්ධ සමාගම | |
|---|---|---|---|---|
| | 2015 | 2014 | 2015 | 2014 |
| (i) පොලී අනුපාතිකය | 10% | 10% | 10% | 10% |
| (ii) වැටුප් වර්ධක අගය | | | | |
| - ශ්‍රී ලංකා රුපියල් | 10% | 7% | – | – |
| - ඇ.ඩො. | 3% | 2% | – | – |
| - විධායක | – | – | 12% | 12% |
| - විධායක නොවන | – | – | 12% | 12% |
| (iii) විශ්‍රාම වයස - අවුරුදු | 60 | 60 | 55 | 55 |
| (iv) ආයතනය අඛණ්ඩව ක්‍රියාත්මක වන බව | | | | |
| (v) අපේක්ෂිත ඉතිරි සේවා ආයුකාලය - අවුරුදු | 11.81 | 11.60 | 9.03 | 7.80 |

### ජීවගණක තක්සේරුව තුළ යොදා ගැණුනු උපකල්පනවල සංවේදීතාව

සේවක ප්‍රතිලාභ බැරකම් මානනය තුළ ස්ථායිව පැවති අනෙකුත් සියලු විචල්‍යතා සමග යොදා ගැණුනු ප්‍රධාන උපකල්පන තුළ යුක්ති සහගතව සිදුවිය හැකියි.

යම් වෙනස්කමක් කෙරෙහි දැක්වෙන සංවේදීතාව පහත දැක්වෙන වගුවෙන් නියෝජනය කරයි. සර්වව්‍යාපි ආදායම් ප්‍රකාශයෙහි සහ මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයෙහි දැකිය හැකි සංවේදීතාව වනුයේ, වර්ෂය සඳහාවූ ලාභයේ හෝ අලාභයේ සහ සේවක ප්‍රතිලාභ බැඳීම්හි වට්ටම් ගත ප්‍රමාණනය හා වැටුප් වර්ධක අගය තුළ සිදුවෙතැයි හඟින වෙනස්කම්වල බලපෑමය.

| වට්ටම්ගත ප්‍රමාණනයේ වැඩිවීම / (අඩුවීම) | වැටුප් වැඩිවීමේ අගයේ වැඩිවීම / (අඩුවීම) | විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් මත බලපෑම | | | |
|---|---|---|---|---|---|
| | | **2015** | | 2014 | |
| | | **සමාගම රු. මිලියන** | **අනුබද්ධ සමාගම රු. මිලියන** | සමාගම රු. මිලියන | අනුබද්ධ සමාගම රු. මිලියන |
| 1% | * | (277.05) | (27.89) | (176.59) | (22.28) |
| -1% | * | 314.70 | 31.28 | 199.40 | 24.93 |
| ** | 1% | 312.77 | 32.51 | 209.50 | 25.89 |
| ** | -1% | (279.30) | (29.52) | (187.78) | (23.82) |

**වැටුප් වැඩිවීමේ අගය සමාගම සඳහා 10% ක් සහ 3% කි. අනුබද්ධ සමාගම සඳහා 12% කි.*

***වට්මම්ගත ප්‍රමාණනය - 10%.*

## 16. පූර්ව ප්‍රවාහන විකුණුම්

පූර්ව ප්‍රවාහන විකුණුම් නියෝජනය කෙරෙනුයේ මාස 12 ක් දක්වා අනුපයෝජිත ගුවන් ටිකට්පත්වල වටිනාකමය.

## 17. වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු මුදල්

| | සටහන | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන |
| වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු මුදල් | | **29,870.66** | 25,956.50 | **34,648.24** | 29,049.38 |
| විලම්බිත එන්ජින් උත්ශ්‍රේණි පිරිවැය | | **–** | 2,479.84 | **–** | 2,479.84 |
| ගුවන් යානා නඩත්තු සහ පිරිවැඩියා වියදම් ප්‍රතිපාදනය | 15.1(ආ) | **10,051.62** | 17,908.96 | **10,051.62** | 17,908.96 |
| ගෙවිය යුතු වරණීය ලාභාංශ | | **–** | 74.79 | **–** | – |
| | | **39,922.28** | 46,420.09 | **44,699.86** | 49,438.18 |

## 18. මූල්‍ය සාධන පත්‍ර

### 18.1 වර්ග අනුව මූල්‍ය වත්කම් හා බැරකම්

පහත දැක්වෙන වගුවල සඳහන් මූල්‍ය වත්කම් හා බැරකම් ලං.ගි.ප්‍ර. 39 අනුව වර්ගවලට බෙදේ.

| | සමූහය | | | |
|---|---|---|---|---|
| | 2015 | | 2014 | |
| | ණය මුදල් හා ලැබීම් නියමිත රු. මිලියන | හිලව් කරන ලද පිරිවැයට මූල්‍ය බැරකම් රු. මිලියන | ණය මුදල් හා ලැබීම් නියමිත රු. මිලියන | හිලව් කරන ලද පිරිවැයට මූල්‍ය බැරකම් රු. මිලියන |
| **මූල්‍ය වත්කම්** | | | | |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු මුදල් | 10,636.52 | – | 10,900.52 | – |
| ගුවන් යානා ඇණවුම් කිරීමේ පූර්ව ගෙවීම් | 18,907.60 | – | 6,799.00 | – |
| ගුවන් යානා නඩත්තු සංචිතය | 12,279.36 | – | 16,734.72 | – |
| අමතර ගුවන් යානා එන්ජින් තැන්පතු | 4,926.07 | – | 3,691.13 | – |
| මුදල් හා බැංකු ශේෂ | 4,846.70 | – | 6,606.63 | – |
| | 51,596.25 | – | 44,732.00 | – |
| **මූල්‍ය බැරකම්** | | | | |
| පොලී දරණ ණය හා ණය ගැනුම් | – | 76,089.46 | – | 44,909.82 |
| වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු මුදල් | – | 37,490.27 | – | 46,420.09 |
| එකතුව | – | 113,579.73 | – | 91,329.91 |

| | සමාගම | | | |
|---|---|---|---|---|
| | 2015 | | 2014 | |
| | ණය මුදල් හා ලැබීම් නියමිත රු. මිලියන | හිලව් කරන ලද පිරිවැයට මූල්‍ය බැරකම් රු. මිලියන | ණය මුදල් හා ලැබීම් නියමිත රු. මිලියන | හිලව් කරන ලද පිරිවැයට මූල්‍ය බැරකම් රු. මිලියන |
| **මූල්‍ය වත්කම්** | | | | |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු මුදල් | 10,136.84 | – | 10,036.88 | – |
| ගුවන් යානා ඇණවුම් කිරීමේ පූර්ව ගෙවීම් | 18,907.60 | – | 6,799.00 | – |
| ගුවන් යානා නඩත්තු සංචිතය | 12,279.36 | – | 16,734.72 | – |
| අමතර ගුවන් යානා එන්ජින් තැන්පතු | 4,926.07 | – | 3,691.13 | – |
| මුදල් හා බැංකු ශේෂ | 4,759.41 | – | 6,457.32 | – |
| | 51,009.28 | – | 43,719.05 | – |
| **මූල්‍ය බැරකම්** | | | | |
| පොලී දරණ ණය හා ණය ගැනුම් | – | 76,065.63 | – | 45,788.92 |
| වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු මුදල් | – | 42,391.76 | – | 49,438.18 |
| එකතුව | – | 118,457.39 | – | 95,227.10 |

**සාධාරණ අගය තක්සේරු කිරීම සඳහා පහත දැක්වෙන ක්‍රමවේද සහ උපකල්පන යොදා ගැනුනි**

කළමනාකරණය තක්සේරු කළ මුදල් හා බැංකු ශේෂ, වෙළෙඳ හා වෙනත් ලැබීම් නියමිත සහ වෙළෙඳ හා වෙනත් ගෙවීම් නියමිත බොහෝ සෙයින් එකී සාධන පත්‍රවල කෙටිකාලීන කල්පිරීම් හේතුව මත ඒවායේ ධාරණ වටිනාකම වෙත සන්නිකර්ෂණය වේ.

කළමනාකරණය තක්සේරු කළ දිගු කාලීන විචල්‍ය අනුපාත ණය ගැනුම්, වෙළෙඳපොළ පාදක වූ පොළී අනුපාත විශාල වශයෙන් කරණකොටගෙන ඒවායේ ධාරණ වටිනාකම සන්නිකර්ෂණය කරයි. එහෙයින්, සමූහයේ/සමාගමේ මූල්‍ය සාධන පත්‍රවල ධාරණ වටිනාකම්, ඒවායේ සාධාරණ අගයන් හා යුක්තයුක්ත ලෙස සන්නිකර්ෂණය වන්නේය.

## 19. ආදායම හා ඛණ්ඩමය තොරතුරු

### 19.1 ආදායම

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන |
| කාල නිශ්චිත සේවා | - මගීන් | **106,601.38** | 99,669.52 | **106,601.38** | 99,669.52 |
| | - ගුවන් බඩු | **13,595.28** | 12,416.17 | **13,595.28** | 12,425.19 |
| | - අතිරේක ගමන් බඩු | **958.47** | 715.16 | **958.47** | 715.16 |
| | - තැපෑල | **170.87** | 185.81 | **170.87** | 185.81 |
| | | **121,326.00** | 112,986.66 | **121,326.00** | 112,995.68 |
| ගුවන් පර්යන්ත හා අනෙකුත් සේවා | | **9,296.66** | 7,836.33 | **9,327.58** | 7,856.27 |
| තීරු බදු රහිත | | **508.88** | 410.82 | **508.88** | 410.82 |
| කාල අනිශ්චිත සේවා | | **759.67** | 323.06 | **759.67** | 323.06 |
| ගුවන් යානාස්ථ ආහාරපාන සැපයුම් | | **2,425.01** | 2,597.75 | **–** | – |
| එකතුව | | **134,316.22** | 124,154.62 | **131,922.13** | 121,585.83 |

### 19.2 ඛණ්ඩමය තොරතුරු

**(අ) භූගෝලීය ඛණ්ඩය අනුව මූලික වාර්තාකරණය – විකුණුම් ප්‍රභවය අනුව ආදායම**

| | | ශ්‍රී ලංකාව රු. මිලියන | ආසියාව (ශ්‍රී ලංකාව හැර) රු. මිලියන | යුරෝපය හා අප්‍රිකාව රු. මිලියන | මැද පෙරදිග රු. මිලියන | උතුරු ඇමරිකාව හා දකුණු ඇමරිකාව රු. මිලියන | නිරිත දිග ශාන්තිකරය රු. මිලියන | **එකතුව 2015 රු. මිලියන** |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම** | | | | | | | | |
| කාල නිශ්චිත සේවා | - මගීන් | 18,452.83 | 37,810.98 | 24,734.25 | 21,354.09 | 3,355.02 | 894.21 | **106,601.38** |
| | - ගුවන් බඩු | 5,937.35 | 5,765.16 | 1,481.30 | 393.34 | 5.81 | 12.32 | **13,595.28** |
| | - අතිරේක ගමන් බඩු | 88.14 | 302.02 | 44.98 | 517.53 | 5.00 | 0.80 | **958.47** |
| | - තැපෑල | 46.82 | 29.01 | 90.38 | – | – | 4.66 | **170.87** |
| | | 24,525.14 | 43,907.17 | 26,350.91 | 22,264.96 | 3,365.83 | 911.99 | **121,326.00** |
| ගුවන් පර්යන්ත හා අනෙකුත් සේවා | | 9,296.66 | – | – | – | – | – | **9,296.66** |
| තීරුබදු රහිත | | – | 280.93 | 67.19 | 160.76 | – | – | **508.88** |
| කාල අනිශ්චිත සේවා | | 759.67 | – | – | – | – | – | **759.67** |
| ගුවන් යානාස්ථ ආහාරපාන සැපයුම් | | 2,425.01 | – | – | – | – | – | **2,425.01** |
| ඛණ්ඩමය ආදායම | | 37,006.48 | 44,188.10 | 26,418.10 | 22,425.72 | 3,365.83 | 911.99 | **134,316.22** |

| | | ශ්‍රී ලංකාව රු. මිලියන | ආසියාව (ශ්‍රී ලංකාව හැර) රු. මිලියන | යුරෝපය හා අප්‍රිකාව රු. මිලියන | මැද පෙරදිග රු. මිලියන | උතුරු ඇමරිකාව හා දකුණු ඇමරිකාව රු. මිලියන | නිරිත දිග ශාන්තිකරය රු. මිලියන | එකතුව 2014 රු. මිලියන |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම** | | | | | | | | |
| කාල නිශ්චිත සේවා | - මගීන් | 22,460.03 | 31,944.61 | 22,888.37 | 18,821.15 | 3,067.40 | 487.96 | 99,669.52 |
| | - ගුවන් බඩු | 5,508.46 | 5,265.29 | 1,302.64 | 322.40 | 11.83 | 5.55 | 12,416.17 |
| | - අතිරේක ගමන් බඩු | 91.35 | 301.17 | 50.29 | 269.85 | 2.19 | 0.31 | 715.16 |
| | - තැපෑල | 108.60 | 19.40 | 48.62 | 0.05 | 0.19 | 8.95 | 185.81 |
| | | 28,168.44 | 37,530.47 | 24,289.92 | 19,413.45 | 3,081.61 | 502.77 | 112,986.66 |
| ගුවන් පර්යන්ත හා අනෙකුත් සේවා | | 7,836.33 | – | – | – | – | – | 7,836.33 |
| තීරුබදු රහිත | | 115.03 | 156.11 | 49.30 | 90.38 | – | – | 410.82 |
| කාල අනිශ්චිත සේවා | | 323.06 | – | – | – | – | – | 323.06 |
| ගුවන් යානාස්ථ ආහාරපාන සැපයුම් | | 2,597.75 | – | – | – | – | – | 2,597.75 |
| ඛණ්ඩමය ආදායම | | 39,040.61 | 37,686.58 | 24,339.22 | 19,503.83 | 3,081.61 | 502.77 | 124,154.62 |

**(ආ) ව්‍යාපාර ඛණ්ඩ අනුව ද්විතීයක වාර්තාකරණය**

| | 2015 | | | | 2014 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ව්‍යාපාර ඛණ්ඩය | | | සමූහය | ව්‍යාපාර ඛණ්ඩය | | | සමූහය |
| | ගුවන් සමාගම රු. මිලියන | ගුවන් යානාස්ථ ආහාරපාන සැපයුම් රු. මිලියන | අන්තර් ඛණ්ඩහරණය රු. මිලියන | රු. මිලියන | ගුවන් සමාගම රු. මිලියන | ගුවන් යානාස්ථ ආහාරපාන සැපයුම් රු. මිලියන | අන්තර් ඛණ්ඩහරණය රු. මිලියන | රු. මිලියන |
| **ආදායම** | 131,922.13 | 5,958.95 | (3,564.86) | 134,316.22 | 121,585.83 | 5,628.29 | (3,059.50) | 124,154.62 |
| **ප්‍රතිඵල** | | | | | | | | |
| බදු පසු ලාභය/(අලාභය) | (16,494.66) | 2,192.12 | (2,027.36) | (16,329.90) | (32,408.34) | 2,262.53 | (1,220.02) | (31,365.83) |
| **අනෙකුත් ඛණ්ඩමය තොරතුරු** | | | | | | | | |
| වත්කම් | 72,558.27 | 9,087.01 | (5,486.98) | 76,158.30 | 62,366.70 | 7,734.88 | (4,714.61) | 65,386.97 |
| බැරකම් | 146,664.17 | 3,231.73 | (6,444.74) | 143,451.16 | 119,587.65 | 3,078.13 | (5,600.12) | 117,065.66 |
| දේපළ, පිරියත හා උපකරණ අත්කර ගැනීම් | 2,810.85 | 85.79 | – | 2,896.64 | 3,209.43 | 44.09 | (51.80) | 3,201.72 |
| අස්පෘෂ්‍ය වත්කම් අත්කර ගැනීම් | 153.37 | 0.41 | – | 153.78 | 2,320.97 | 6.15 | (0.01) | 2,327.11 |
| ක්ෂයවීම හා හිලව් කිරීම | 2,275.98 | 279.62 | – | 2,555.60 | 1,602.79 | 283.84 | – | 1,886.63 |
| මූල්‍ය පිරිවැය | 5,009.46 | 308.54 | (223.32) | 5,094.68 | 6,196.92 | 305.26 | (207.92) | 6,294.26 |
| මූල්‍ය ආදායම | 112.06 | 13.21 | (0.32) | 124.95 | 969.11 | 9.37 | (3.67) | 974.81 |
| බදු | 61.63 | 13.74 | – | 75.37 | 50.36 | 17.83 | – | 68.19 |
| මෙහෙයුම් වියදම් | 145,983.35 | 3,474.63 | (3,564.49) | 145,893.49 | 150,389.46 | 3,372.24 | (3,368.39) | 150,393.31 |
| ලියාහළ වෙළෙඳ ණයගැතියෝ | 412.71 | – | – | 412.71 | – | – | – | – |
| ලියාහළ ඉන්වෙන්ටරි භාණ්ඩ | 11.95 | – | – | 11.95 | 222.46 | – | – | 222.46 |

## 20. වෙනත් ආදායම් සහ ලාභ

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | සටහන | 2015 රු. මිලියන | 2014 රු. මිලියන | 2015 රු. මිලියන | 2014 රු. මිලියන |
| දේපළ, පිරියත හා උපකරණ ව්‍යපහරණය මත ලාභය | | 5.08 | 26.88 | 2.47 | 14.84 |
| විවිධ | 20.1 | 287.39 | 233.62 | 273.12 | 233.62 |
| ශ්‍රීලංකන් කේටරින් සමාගමෙන් ලාභාංශ | | – | – | 2,250.00 | 1,425.00 |
| | | 292.47 | 260.50 | 2,525.59 | 1,673.46 |

**20.1** රක්ෂණ හිමිකම් ලැබීම් සහ නඩත්තු සංචිත මත හා ගුවන් ආරක්ෂක තැන්පතු මත පොලී ලැබීම් අන්තර්ගත වේ.

## 21. මෙහෙයුම් කටයුතුවලින් අලාභය

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2015 රු. මිලියන | 2014 රු. මිලියන | 2015 රු. මිලියන | 2014 රු. මිලියන |
| **අයගත කිරීමෙන්/(බැර කිරීමෙන්) පසුව ප්‍රකාශිත** | | | | |
| ගුවන් යානා රක්ෂණය | 481.45 | 539.58 | 481.45 | 539.58 |
| වරලත් ගාස්තු | 252.57 | 229.24 | 252.57 | 229.24 |
| මන්දගාමීව චලනය වන ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ප්‍රතිපාදනය | 279.85 | 303.83 | 264.83 | 302.78 |
| විගණකවරුන්ගේ පාරිශ්‍රමික – විගණනය | 8.03 | 7.71 | 6.30 | 6.11 |
| – වෙනත් සේවා | 1.15 | 9.44 | 0.45 | 8.71 |
| ලැබීම් නියමිත දුබලතා සඳහා ප්‍රතිපාදනය | 230.32 | 97.51 | 225.55 | 118.75 |
| දේපළ, පිරියත හා උපකරණ දුබලතා ප්‍රතිපාදනය* | 167.98 | – | 164.65 | – |
| විනිමය අලාභය | 409.98 | 380.38 | 706.63 | 653.76 |

**දේපළ, පිරියත හා උපකරණ දුබලතා සඳහා ප්‍රතිපාදනවල මත්තල මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළට අයත් වත්කම් සම්බන්ධයෙන් ගණනය කළ රුපියල් මිලියන 126.85ක මුදලක් ඇතුළත්වේ.*

## 22. මූල්‍ය ආදායම/මූල්‍ය පිරිවැය

### 22.1 මූල්‍ය ආදායම

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2015 රු. මිලියන | 2014 රු. මිලියන | 2015 රු. මිලියන | 2014 රු. මිලියන |
| පොලී ආදායම | 124.95 | 58.16 | 112.06 | 52.46 |
| භාණ්ඩාගාර බැඳුම්කර මත පොලිය | – | 916.65 | – | 916.65 |
| | 124.95 | 974.81 | 112.06 | 969.11 |

### 22.2 මූල්‍ය පිරිවැය

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන |
| ණය ගැනුම්, බැංකු අයිරා හා අතිප්‍රමාදිත සැපයුම්කාර ශේෂ මත පොලී වියදම් | 4,683.57 | 3,757.95 | 4,748.35 | 3,810.61 |
| භාණ්ඩාගාර බැඳුම්කර ව්‍යපහරණය මත අලාභය | – | 2,100.43 | – | 2,100.43 |
| විලම්බිත ගුවන් යානා උත්ශේණිගත කිරීම මත මූල්‍ය ගාස්තු | – | 141.84 | – | 141.84 |
| කල් බදුකර බැරකම් මත මූල්‍ය ගාස්තු | 261.11 | 144.04 | 261.11 | 144.04 |
| වරණීය කොටස් ලාභාංශ | 150.00 | 150.00 | – | – |
| | 5,094.68 | 6,294.26 | 5,009.46 | 6,196.92 |

## 23. බදුකරණය

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | සටහන | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන |
| **බදු වියදම** | | | | | |
| ආදායම් බදු වියදමෙහි ප්‍රධාන අංග පහත දැක්වේ: | | | | | |
| **ජංගම ආදායම් බද්ද** | | | | | |
| වසර සඳහා සාමන්‍ය කටයුතු ජංගම බදු වියදම් | 23.1 | 13.50 | 15.42 | – | – |
| කපා හරින ලද ආර්ථික සේවා ගාස්තු | | 61.63 | 50.36 | 61.63 | 50.36 |
| ඉකුත් වර්ෂ සම්බන්ධ ජංගම බදු ඌණ/(අධි) ප්‍රතිපාදනය | | 0.24 | 2.41 | – | – |
| | | 75.37 | 68.19 | 61.63 | 50.36 |

### 23.1 ජංගම බදු වියදම් සහ ගිණුම්කරණ අලාභ නිපැයුම් අතර සැසඳුම්

| | සමූහය | |
|---|---|---|
| | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන |
| බදු පූර්ව ගිණුම්කරණ අලාභය | (16,254.53) | (31,297.64) |
| බද්දට යටත් නොවූ ආදායම | 16,279.75 | 31,334.00 |
| 28% ක්වූ සාමාන්‍ය බදු අනුප්‍රමාණය යටතේ ව්‍යවස්ථාපිත ආදායම | 25.22 | 36.36 |
| බදුවන ලාභය | 25.22 | 36.36 |
| 28% ක්වූ බදු අනුප්‍රමාණය මත ව්‍යවස්ථාපිත බද්ද | 7.06 | 10.18 |
| ශුද්ධ අඩුකළ නොහැකි වියදම් කෙරෙහි බදු බලපෑම | (0.73) | 0.26 |
| වෙනත් ආදායම් මත බද්ද | 7.17 | 4.98 |
| ජංගම ආදායම් බදු වියදම | 13.50 | 15.42 |

### 23.2 හඳුනානොගත් විලම්බිත බදු (වත්කම්)

#### අනුබද්ධ සමාගම

අනුබද්ධ සමාගමට අයත් පහත දැක්වෙන විෂයාංග කෙරෙහි ආරෝපණය වන විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලැබ නොමැත.

| | වත්කම් | | බැරකම් | | ශුද්ධ | |
|---|---|---|---|---|---|---|
| | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන |
| දේපළ, පිරියත හා උපකරණ | **4.05** | 4.05 | **–** | – | **(4.05)** | (4.05) |
| සේවක ප්‍රතිලාභ | **674.88** | 53.14 | **–** | – | **(674.88)** | (53.14) |
| | **678.93** | 57.19 | **–** | – | **(678.93)** | (57.19) |

ගොඩනැගිලි දියුණු කිරීම මත ප්‍රත්‍යාගණන ලාභයට අදාළ විලම්බිත බදු බැරකම් හඳුනාගෙන ඇත. වෙනත් ප්‍රත්‍යාගණන ලාභ, ඒවා බදු විරාම කාලය තුළ පරිවර්තනය වන හෙයින්, විලම්බිත බදු නොසලසයි. විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලැබ නොමැත්තේ, තවදුරටත් වසර 8 ක කාලයක් සඳහා සහනදායි අනුපාතයක් අදාළ වන වසර 2021 දක්වා සහ ඉන් අනතුරුව දීර්ඝ කරනු ලබන සමාගමට අදාළ බදු විරාම කාලය නිසාය. එහෙයින් අදාළ බදු බලපෑම ඉතිරි සය අවුරුදු කාලය තුළ හිලවු කරනු ඇති අතර යම් ශේෂ මුදල් ප්‍රමාණ වෙතොත් ඒවා වැදගත් සේ නොසැලකේ. විලම්බිත බදු සඳහා 15% ක අනුපාතයක් ලැබේ.

#### වසර තුළ තාවකාලික වෙනස්කම්හි සංචලනය

| | මාර්තු 31 දිනට ශේෂය 2013 රු. මිලියන | වසර තුළ එකතු කිරීම් රු. මිලියන | මාර්තු 31 දිනට ශේෂය 2014 රු. මිලියන | වසර තුළ එකතු කිරීම් රු. මිලියන | **මාර්තු 31 දිනට ශේෂය 2015 රු. මිලියන** |
|---|---|---|---|---|---|
| දේපළ, පිරියත හා උපකරණ | 26.81 | 0.19 | 27.00 | 0.01 | **27.01** |
| සේවක ප්‍රතිලාභ | 281.19 | 73.07 | 354.26 | 95.66 | **449.92** |
| | 308.00 | 73.26 | 381.26 | 95.67 | **476.93** |

## 24. බැඳීම් හා අවිනිශ්චිතතා

### 24.1 ප්‍රාග්ධන වියදම් බැඳීම්

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලට ආනුෂංගික දේපළ, පිරියත හා උපකරණ අත්කර ගැනීම වෙනුවෙන් සමූහයේ සහ සමාගමේ බැඳීම් පහත දැක්වේ:

| | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන |
|---|---|---|
| ගිවිසුම්ගත එහෙත් ප්‍රතිපාදනය නොකළ | | |
| ස්පෘශ්‍ය* | **143,434.38** | 141,771.40 |
| අස්පෘශ්‍ය | **3.12** | 15.82 |
| මැදිරි ප්‍රති අනුරූපනය | **295.08** | 1,293.08 |
| | **143,732.58** | 143,080.30 |
| මණ්ඩලය අනුමත කළ එහෙත් ගිවිස නොගත් | | |
| ස්පෘශ්‍ය* | **327.48** | 161.08 |
| අස්පෘශ්‍ය | **164.12** | 26.49 |
| මැදිරි ප්‍රති අනුරූපනය | **–** | 314.09 |
| | **491.60** | 501.66 |
| | **144,224.18** | 143,581.96 |

**2015 මාර්තු මස 31 වන දිනට රුපියල් මිලියන 143,143 (අමෙරිකානු ඩොලර් මිලියන 1,076) (2014 - රුපියල් මිලියන 140,772) (අමෙරිකානු ඩොලර් මිලියන 1,076) ක් වශයෙන් ගණනය වූ මුදලක් අතිරේක විෂයාංග කිසිවක් සඳහා වූ වියදම් රහිත ලයිස්තු මිල නියෝජනය කරන අතර A350-900 වර්ගයේ ගුවන් යානා හතරක් මිලදී ගැනීම සඳහා පවත්නා ණය ප්‍රාග්ධන බැඳීම යටතේ සලකා ඇත.*

## 24.2 මූල්‍ය බැඳීම්

**(අ) මාර්තු මස 31 දිනට අවලංගු කළ නොහැකි ක්‍රියාකාරි බදුකර යටතේ සමාගමේ අනාගත අවම බදුකර බැඳීමෙහි මුළු ප්‍රමාණය පහත දැක්වේ:**

| | සමූහය/සමාගම | |
|---|---|---|
| | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන |
| වසරක් තුළ | **19,449.10** | 14,310.02 |
| වසරකින් පසුව එහෙත් වසර පහකට නොවැඩි | **101,185.34** | 76,370.98 |
| වසර පහකට පසුව | **178,448.06** | 140,527.01 |
| | **299,082.50** | 231,208.01 |

2015 මාර්තු මස 31 වන දිනට බදුකර බැඳීම්වලට පහත සඳහන් දෑ ඇතුළත් වේ:

(අ) වසර 2015 සහ 2018 යන කාල පරිච්ඡේදය තුළ ඇණවුම් භාරදීම අපේක්ෂා කරන A330-300 වර්ගයේ ගුවන් යානා හතරක් (රුපියල් මිලියන 75,554.13ක් වශයෙන් ගණනය වන) සම්බන්ධයෙන් ද, A350-900 වර්ගයේ ගුවන් යානා හතරක් (රුපියල් මිලියන 92,109.15ක් වශයෙන් ගණනය වන) සම්බන්ධයෙන් ද, 321 NEO වර්ගයේ ගුවන් යානා හතරක් (රුපියල් මිලියන 31,836.75 ක් වශයෙන් ගණනය වන) සම්බන්ධයෙන්ද කටයුතු කිරීම බලාපොරොත්තුවෙන් රපෝර්තු දිනට පරිශේෂව පවත්නා ගිවිසුම්වලට අදාළ රුපියල් මිලියන 199,500.03ක් වශයෙන් ගණනය වන බදුකර බැඳීම් ඇතුළත් 2015 මාර්තු මස 31 වන දිනට බදුකර බැඳීම. මේ සම්බන්ධයෙන් 2015 අගෝස්තු මාසයේදී ලැබුණු A330-300 වර්ගයේ ගුවන් යානය හැරුණු විට මූලික කුලී පදනම මත පිහිටා බදුකර බැඳියාව නිශ්චය කර ඇත.

2014 සහ 2016 යන කාලපරිච්ඡේදය තුළ ඇණවුම් භාරදීම අපේක්ෂා කරන A330-300 වර්ගයේ ගුවන්යානා හයක් (රු.මි. 114,597.42 ක් වශයෙන් ගණනය වන) සම්බන්ධයෙන් ද, A350-900 වර්ගයේ ගුවන් යානා තුනක් (රුපියල් මිලියන 67,436.60 ක් වශයෙන් ගණනය වන) සම්බන්ධයෙන්ද කටයුතු කිරීම බලාපොරොත්තුවෙන් පරිශේෂව පවත්නා ගිවිසුම්වලට අදාළ රුපියල් මිලියන 182,034.02 ක් වශයෙන් ගණනය වන බදුකර බැඳීම් ඇතුළත් 2014 මාර්තු මස 31 වන දිනට බදුකර බැඳීම. මේ සම්බන්ධයෙන් මූලික කුලී පදනම මත පිහිටා බදුකර බැඳියාව නිශ්චය කර ඇත.

(ආ) බද්දට ගත් ගුවන් යානා සඳහා ඇප තැන්පතු ලෙස 2015 මාර්තු මස 31 වන දිනට රුපියල් මිලියන 2,118.04 (අමෙරිකානු ඩොලර් මිලියන 15.92) ක් (2014 - අමෙරිකානු ඩොලර් මිලියන 7.62 ක්වූ රුපියල් මිලියන 996.46) වටිනා ණයවර ලිපි සමාගම මගින් නිකුත්කර ඇත.

(ඇ) සමාගම හා අනුබද්ධ ආයතන විසින් බදුගත් ඉඩම් හා ගොඩනැගිලි සඳහා වන ඉතිරි බදු කුලී බැඳීම් පහත දැක්වේ:

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන |
| **ගෙවිය යුතු වාරික මුදල:** | | | | |
| වසරක් තුළ | **443.45** | 396.47 | **390.42** | 372.47 |
| වසරකින් පසුව එහෙත් වසර පහකට නොවැඩි | **1,778.14** | 1,688.84 | **1,650.20** | 1,572.84 |
| වසර පහකට පසුව | **3,514.76** | 3,098.34 | **3,195.66** | 2,756.34 |

## 24.3 අවිනිශ්චිතතා

**සමාගම**

2015 මාර්තු මස 31 දිනට හිමිකම් ඉල්ලීම මත පදනම් වූ අවිනිශ්චිත බැරකම් රුපියල් මිලියන 123.54 ක් (2014 - රුපියල් මිලියන 421.88) බව කළමනාකරණය ඇස්තමේන්තු කරයි. සමාගමට එරෙහිව සේවාදායකයන්, සැපයුම්කරුවන් සහ සේවක සේවිකාවන් විසින් ඉදිරිපත් කෙරුනු නීති කෘත්‍ය හා වෙනත් හිමිකම් ඉල්ලීම් හා සම්භාවී හිමිකම් ඉල්ලීම් සම්බන්ධයෙන් සමාගමේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කරගෙන යාමේදී උද්ගතවූ යම් අවිනිශ්චිත බැරකම්වලට අදාළ සැලකිය යුතු බැරකම් කිසිවක් අධ්‍යක්ෂවරුන් අපේක්ෂා නොකෙරෙන හෙයින් එහිලා මෙම මූල්‍ය ප්‍රකාශ තුළ ප්‍රතිපාදන කිසිවක් සලසා නැත. සේවාදායකයන්, සැපයුම්කරුවන් සහ සේවක සේවිකාවන්ගෙන් හැරුණු විට සමාගම සම්බන්ධයෙන් නීති කෘත්‍ය කිසිවක නොවීය.

**අනුබද්ධ සමාගම**

සමාගමේ නීතිඥයන්ගේ මතයට අනුව රපෝර්තු දිනට සමාගමට එරෙහිව පැවති සැලකිය යුතු නොනිමි නඩු කටයුතු කිසිවක් නොවීය. (2014 - නොනිමි නඩු කටයුතු කිසිවක් නොවීය.)

## 25. ප්‍රතිඥාත වත්කම්

**සමූහය/සමාගම**

ලබාගෙන ඇති බැංකු පහසුකම් එල්ලේ වත්කම්වල විස්තර සඳහා 14.2 හා 14.3 වන සටහන් බලන්න.

## 26. රපෝර්තු දිනයට පසුව උද්ගතවන සිදුවීම්

### 26.1 සමාගම

අදාළ බදුකර ගිවිසුම් අවසන් වීමෙන් පසුව සමාගම විසින් A340-300 වර්ගයේ ගුවන් යානා දෙකක් බදුකරු වෙත ආපසු පිටත්කර වන ලදී.

ජෙට් ඉන්ධන සම්බන්ධයෙන් වූ පරිශේෂව පවත්නා හිඟ මුදල් හා අනාගත මිලදී ගැනීම් පියවා ගැනීම පිණිස රුපියල් බිලියන 26.7 ක් වශයෙන් ගණනය වන කෙටි කාලීන ණය පහසුකම් ලබාගැනීම සඳහා රජයේ බැංකු වෙතින් ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර "සහන ලිපි" ශ්‍රීලංකන් ගුවන් සමාගම වෙත නිකුත් කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. මෙම මුදල් පහසුකමෙන් රුපියල් බිලියන 13.35 ක් රපෝර්තු දින වන විට උපයෝජනය කර ඇත.

2015 අගෝස්තු මස තුළ සමාගම නව A330-300 වර්ගයේ ගුවන් යානයක් භාරගත්තේය.

**අනුබද්ධ සමාගම**

මූල්‍ය ප්‍රකාශවලට ගැළපුම් හෝ ඊට හෙළිදරව් කිරීම් අවශ්‍ය වන සිදුවීම් කිසිවක් රපෝර්තු දිනයෙන් පසුව වාර්තා නොවිය.

## 27. අදාළ පාර්ශ්වවල හෙළිදරව් කිරීම්

### 27.1 සමූහය හා සමාගම

#### 27.1.1 ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග ගනුදෙනු

සමාගමෙහි සහ එහි අනුබද්ධ ආයතනයෙහි කටයුතු සැලසුම් කිරීම, මෙහෙයවීම හා ක්‍රියාත්මක කිරීම යන කාර්යයන්හි බලධාරීත්වය හා වගකීම දරණ තැනැත්තන් ලෙස අර්ථ නිරූපිත ප්‍රධාන කළමනාකරණ පිරිස් අදාළ පාර්ශ්වවලට ඇතුළත් වේ. එකී පිරිසට අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන විධායක නිලධාරී හා යතෝක්ත නිර්ණායක සපුරාලන සමූහයට අයත් අනෙකුත් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ විධායක නිලධාරීන් ඇතුළත් වේ.

සමාගම සහ ආශ්‍රිත පාර්ශ්ව (සමාගමට අනුබද්ධිතවූවන්, අධ්‍යක්‍ෂවරුන්, සේවක සේවිකාවන් හෝ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් විසින් යම් බැඳියාවක් පවත්වා ගනු ලබන) අතර යම් ගනුදෙනුවක් පවතී නම් ඒවා හෙළිදරව් කළ යුතුයැයි නියමකර ඇති සමූහයේ/සමාගමේ ප්‍රතිපත්තියට අනුව ප්‍රධාන කළමනාකරණ පිරිස් විසින් කර ඇති ප්‍රකාශ පත්‍ර පිළිබඳව සැලකිල්ල යොමුකර ඇත.

ප්‍රධාන කළමනාකරණ පිරිස් විසින් රපෝර්තු කාල පරිච්ඡේදය තුළ සිදුකර ඇති වැදගත් ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | 2015<br>රු. මිලියන | 2014<br>රු. මිලියන |
|---|---|---|
| කෙටිකාලීන ප්‍රතිලාභ | 208.28 | 166.79 |
| පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ | 36.28 | 22.81 |

වසර තුළ අධ්‍යක්ෂවරුන්ට ගෙවන ලද රුපියල් මිලියන 14.40 ක්වූ (2014 - රුපියල් මිලියන 13.17) පාරිශ්‍රමික ඉහත මුදල් ප්‍රමාණවලට ඇතුළත් වේ. හෙළිදරව් කර ඇති ඉහත ප්‍රතිපාදනවලට අමතරව, ප්‍රධාන කළමනාකරණ පිරිස් ඔවුන්ගේ කලත්‍රයන් හා යැපෙන දූ දරුවන් ස්වකීය ධූරකාලය තුළ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ මාර්ග ගත ගුවන් සේවාවල ව්‍යාපාරික පංතියෙහි නොමිලයේ ගමන් කිරීමට හිමිකම් ලබයි.

2015 පෙබරවාරි 12 වන දින සිට බලපැවැත්වෙන පරිදි පත් කල නව අධ්‍යක්‍ෂක මණ්ඩලයේ සාමාජිකයින්ට කිසිදු දීමනාවක් ගෙවා නැත. තවද, එම දින සිට අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයින්ට, ඔවුන්ගේ කාලාත්‍රයන්ට සහ ඔවුන්ගෙන් යැපෙන දරුවන් හට වසරකට ව්‍යාපාරික පන්තියේ ප්‍රවේශ පත් තුනකට හිමිකම් ඇත.

### 27.2 සමූහය

**27.2.1** සමාගමේ ප්‍රධාන කොටස්හිමියා වන ශ්‍රී ලංකා රජයට සමූහය සම්බන්ධයෙන් පාලන බලය පවතී.

(අ) සමාගම ස්වකීය සාමාන්‍ය ව්‍යාපාරික කාර්යයන් අතරතුර පහත දැක්වෙන සැලකිය යුතු කටයුතු ඇතුළත් ගනුදෙනු ශ්‍රී ලංකා රජයේ පාලනයට යටත් ආයතන සමග ඉටුකර ඇත:

| | | | ගනුදෙනුවේ මුදල | | ලැබිය යුතු/(ගෙවිය) යුතු ශේෂය | |
|---|---|---|---|---|---|---|
| සමාගමේ නම | සබඳතාව | ගනුදෙනුවේ ස්වභාවය | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන |
| ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | රජය සතු | ඉන්ධන | (29,992.65) | (33,204.64) | (14,255.93) | (9,317.43) |
| | | විලම්බිත සැපයුම් ගෙවීම් | (3,951.24) | (3,791.19) | (6,367.37) | (10,218.39) |
| | | ප්‍රමාදිත ගෙවීම් මත මූල්‍ය පිරිවැය | (786.83) | (1,713.35) | (229.34) | (131.23) |
| සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම | රජය සතු | ගොඩබෑම්, ගාල් කිරීම්, ගුවන් පාලම්, මගී ශාලා, කුලී, වරලත් ගාස්තු සහ කසල නාශක ගාස්තු | (3,185.43) | (2,464.36) | (1,808.86) | (2,882.69) |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | රජය සතු | බලපත්‍ර, අවසර පත් හා බදු | (4,009.41) | (3,734.78) | (0.20) | – |
| සී/ස මිහින් ලංකා සමාගම | රජය සතු | විකුණුම් | 6,428.13 | 4,988.82 | 867.55 | 1,882.77 |
| | | ගැණුම් | (5,684.39) | (4,312.02) | – | – |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | රජය සතු | රක්‍ෂණ සේවා | (515.28) | (546.02) | – | – |
| ලංකා බැංකුව | රජය සතු | ණය ආපසු ගෙවීම් | (3,076.93) | (552.04) | (5,518.70) | (3,595.63) |
| | කොටස් හිමිකරු | ලද ණය | 5,000.00 | – | – | – |
| | | කෙටිකාලීන තැන්පතු | – | – | 741.96 | 264.60 |
| | | බැංකු අයිරා | – | – | (5,097.59) | (6,675.25) |
| සේවක අර්ථසාධක අරමුදල | අනුබද්ධ සමාගමේ කොටස් හිමිකරු | වරණීය කොටස් ලාභාංශ | (150.00) | (150.00) | (74.79) | (74.79) |
| | | ඡන්දවරය අහිමි නිදහස් කරගත හැකි සමුච්චිත 15% කොටස් (10 අවුරුදු) වරණීය කොටස් | – | – | (1,000.00) | (1,000.00) |

**ශ්‍රී ලංකා රජයේ පාලනයට යටත් ආයතන වෙතින් වූ/වෙත වූ ශේෂ, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වෙළෙඳ හා වෙනත් ලැබීම් නියමිත/ගෙවීම් නියමිත සහ පොලී දරණ බැරකම් යටතේ අන්තර්ගත කෙරේ.*

සේවක විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වූ දායකවීම්වලට අදාළ වැඩිමනත් ගනුදෙනු සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ අණපනත් හා රෙගුලාසිවලට අනුකූලව සිදු කරනු ලැබේ.

## 27.3 සමාගම

**27.3.1** සමාගම ස්වකීය ව්‍යාපාර කාර්යයන් අතරතුර පහත දැක්වෙන කටයුතු ඇතුළත් වැදගත් ගනුදෙනු ස්වකීය අනුබද්ධ සමාගම සමග ඉටුකර ඇත:

| | | | ගනුදෙනුවේ මුදල | | ලැබිය යුතු/(ගෙවිය) යුතු ශේෂය | |
|---|---|---|---|---|---|---|
| සමාගමේ නම | සබඳතාව | ගනුදෙනුවේ ස්වභාවය | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන |
| සී/ස ශ්‍රීලංකන් කේටරින් සමාගම | අනුබද්ධ සමාගම | ගුවන් යානාස්ථ සේවා | **9.67** | 9.02 | **–** | – |
| | | ගුවන් යානාස්ථ ආහාරපාන හා වෙනත් සේවා | **(3,533.95)** | (3,001.57) | **(5,444.73)** | (3,617.98) |
| | | ලාභාංශ | **2,100.00** | 1,275.00 | **–** | – |
| | | දිගු කාලීන ණය පියවීම | **(988.51)** | (235.40) | **–** | – |
| | | ඡන්දවරය අහිමි නිදහස් කරගතහැකි සමුච්චිත 15% කොටස් (5ස් අවුරුදු) වරණීය කොටස් | **150.00** | 150.00 | **1,000.00** | 1,000.00 |
| ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | රජය සතු | ඉන්ධන | **(29,881.70)** | (33,088.80) | **(14,255.93)** | (9,317.43) |
| | | විලම්බිත සැපයුම් ගෙවීම් | **(3,951.24)** | (3,791.19) | **(6,367.37)** | (10,218.39) |
| | | ප්‍රමාදිත ගෙවීම් මත මූල්‍ය පිරිවැය | **(786.83)** | (1,713.35) | **(229.34)** | (131.23) |
| සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම | රජය සතු | ගොඩබෑම, ගාල්කිරීම, ගුවන් පාලම්, මගී ශාලා, කුලී වරලත් ගාස්තු හා කසළ නාශක ගාස්තු | **(2,867.24)** | (2,151.98) | **(1,767.49)** | (2,833.36) |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | රජය සතු | බලපත්‍ර, අවසර පත් හා බදු | **(4,009.41)** | (3,734.78) | **(0.20)** | – |
| සී/ස මිහින් ලංකා සමාගම | රජය සතු | විකුණුම් | **6,186.14** | 4,740.63 | **760.72** | 1,433.13 |
| | | ගැණුම් | **(5,684.39)** | (4,312.02) | **–** | – |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | රජය සතු | රක්‍ෂණ සේවා | **(515.28)** | (546.02) | **–** | – |
| ලංකා බැංකුව | රජය සතු | ණය ආපසු ගෙවුම් | **(3,076.93)** | (552.04) | **(5,518.70)** | (3,595.63) |
| | කොටස් හිමිකරු | ලද ණය | **5,000.00** | – | **–** | – |
| | | කෙටිකාලීන තැන්පතු | **–** | – | **741.96** | 264.60 |
| | | බැංකු අයිරා | **–** | – | **(5,097.59)** | (6,675.25) |

**ශ්‍රී ලංකා රජයේ පාලනයට යටත් ආයතන වෙතින් වූ/වෙත වූ ශේෂ, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වෙළෙඳ හා වෙනත් ලැබීම් නියමිත/ගෙවීම් නියමිත සහ පොලී දරණ බැරකම් යටතේ අන්තර්ගත කෙරේ.*

සේවක විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වූ දායකවීම්වලට අදාළ වැඩිමනත් ගනුදෙනු සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ අණපනත් හා රෙගුලාසිවලට අනුකූලව සිදු කරනු ලැබේ.

## 28. මූල්‍ය අවදානම් කළමනාකරණ පරමාර්ථ සහ ප්‍රතිපත්ති

සමූහයේ ප්‍රධාන මූල්‍ය වගකීම් සමන්විත වනුයේ ණය හා ණය ගැණුම්, වෙළෙඳ හා වෙනත් ලැබීම් නියමිත සහ වෙනත් මූල්‍ය වගකීම් යනාදියෙනි. මෙම මූල්‍ය වගකීම්වල ප්‍රධාන අරමුණ වනුයේ, සමූහයේ මෙහෙයුම් කටයුතුවලට මූල්‍යකරණය සලසා දීමයි. ස්වකීය මෙහෙයුම් කටයුතු තුළින් ඍජුවම ලබා ගන්නා වෙළෙඳ හා වෙනත් ලැබීම් නියමිත සහ මුදල් හා කෙටි කාලීන තැන්පතුවලින් සමූහයේ මූල්‍ය වත්කම් සමන්විත වේ.

ආයතනික කළමනාකරණය විසින් සර්වව්‍යාපී අවදානම් කළමනාකරණ න්‍යාසයක් වාරමය වශයෙන් සමාලෝචනයට හසුකර යාවත්කාලීන කරනු ලබන අතර සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි පහත දැක්වෙන මූල්‍ය අවදානම් හඳුනාගනු ලැබ ඇත.

i වෙළෙඳපොළ අවදානම

- පොලී අනුපාත අවදානම
- ව්‍යවහාර මුදල් අවදානම

ii ද්‍රවශීලතා අවදානම

iii ණයවර අවදානම

වෙළෙඳපොළවල් තුළ සහ අනෙකුත් මූල්‍යමය අවදානම් සහිත කටයුතුවල වෙනස්කම් නිරූපණය වනු පිණිස සමූහයේ නිත්‍ය පදනමක් මත සිය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති හා ක්‍රියාපරිපාටි සමාලෝචනයට භාජනය කරන අතර, ඒවා පනවා ඇති ප්‍රතිපත්ති හා ක්‍රියාපරිපාටිවලට අනුකූලව අවදානම් හඳුනා ගනු ලැබ, මානනය කර, කළමනාකරණය වනු ඇති බවට වගබලා ගනු පිණිස ප්‍රශස්ත ප්‍රතිපත්ති හා ක්‍රියාපරිපාටි මගින් පාලනය කෙරේ.

### (i) වෙළෙඳපොළ අවදානම

### පොලී අනුපාත අවදානම

පොලී අනුපාත අවදානම යනු, මූල්‍ය සාධන පත්‍රයක අනාගත මුදල් ගලනවල සාධාරණ අගය වෙළෙඳපොළ පොලී අනුපාතවල වෙනස්කම් කරණකොට ගෙන උච්චාවචනය වීමේ අවදානමයි. වෙළෙඳපොළ පොලී අනුපාතවල සිදුවන වෙනස්කම් ආශ්‍රිත අවදානම අදාළ වනුයේ, ඉපිලෙන පොලී අනුපාත සහිත සමූහයේ දිගු කාලීන ණය බැඳියාවන් කෙරෙහිය.

සමූහයේ ප්‍රතිපත්තිය වනුයේ, පොලී අනුපාත උච්චාවචනවල බලපෑම සමනය කරනු අටියෙන් සිදු කෙරෙන ගුවන් යානා කල්බදු මත සපයා ගැනීමේ කාර්යද ඇතුළුව ස්ථිර හා විචල්‍ය අනුපාත ණය ගැණුම් අතර ප්‍රශස්ත සමබරතාවක් පවත්වා ගැනීමයි.

ණය හා ණය ගැණුම් මත පොලී අනුපාතවලත්, බැඳුම්කර ආයෝජනවල පොලී අනුපාතවලත් යුක්තයුක්ත අයුරින් සිදුවිය හැකි වෙනස්කම්හී ලා උද්ගත වන සංවේදීතාව පහත දැක්වෙන වගුවෙන් නිරූපණය වේ. අනෙකුත් සියලුම විචල්‍යතා සංගතව පවතින තත්ත්වයක් යටතේ, ඉපිලෙන අනුපාත මත ණය ගැණුම්වල මෙන්ම භාණ්ඩාගාර බැඳුම්කරවලද සංඝට්ටනය ඔස්සේ සමූහයේ/සමාගමේ බදු පූර්ව අලාභය කෙරෙහි බලපෑම් ඇති වනුයේ පහත දැක්වෙන පරිදිය:

| | බදු පූර්ව අලාභය මත බලපෑම | | | |
|---|---|---|---|---|
| | සමූහය | | සමාගම | |
| | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන |
| පොලී අනුපාතයේ වැඩිවීම/(අඩුවීම) | | | | |
| +1% | 527.91 | 711.47 | 527.91 | 719.12 |
| -1% | (527.91) | (711.47) | 527.91 | (719.12) |

*පොලී අනුපාතවල වැඩිවීම, අලාභවල වැඩි වීමට හේතු කාරකයක් වෙයි.*

### විදේශ ව්‍යවහාර මුදල් අවදානම

විදේශ ව්‍යවහාර මුදල් අවදානම යනු, මූල්‍ය සාධන පත්‍රයක අනාගත මුදල් ගලනවල සාධාරණ අගය විදේශ විනිමය අනුපාතවල වෙනස්කම් කරණකොට ගෙන උච්චාවචනය වීමේ අවදානමයි. විදේශ විනිමය අනුපාත උච්චාවචනවල බලපෑම කෙරෙහි සමූහය නිරාවරණය වනුයේ, විදේශ ව්‍යවහාර මුදලින් ගණනය වන ස්වකීය ආදායම්, වියදම් හා වෙනත් සාධන පත්‍ර ආශ්‍රිත කටයුතු නිසාය.

එක් එක් කරුණට අදාළ වන්නාවූ වැදගත් ව්‍යවහාර මුදල් ඒකක අනුසාරයෙන් හැකිතාක් දුරට ගළපා ගනිමින් උපයෝගී කර ගනු ලබන ප්‍රතිපත්තියකට අනුව සමූහය ස්වකීය විදේශ විනිමය ආශ්‍රිත කටයුතුවලට මුහුණ දීම කළමනාකරණය කරයි.

ඇමරිකානු ඩොලර් මුදල් එල්ලේ ශ්‍රී ලංකාවේ රුපියල් විනිමය අනුපාතයෙහි යුක්තායුක්ත අයුරින් සිදුවිය හැකි වෙනස්කම්හිලා උද්ගත වන සංවේදිතාව පහත දැක්වෙන වගුවෙන් නිරූපණය වන අතර අනෙකුත් සියලුම විචල්‍යතා සංගතව පවතින තත්ත්වයක් යටතේ, මූල්‍ය වත්කම්වල හා බැරකම්වල සාධාරණ මුදල්මය අගය තුළ සිදුවන වෙනස්කම් හේතුවෙන් රපෝර්තු දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි සටහන් කර ඇති සමූහයේ/සමාගමේ බදු පූර්ව අලාභය මත ඇතිවූ බලපෑම ඉන් විද්‍යාමාන වේ. අනෙකුත් ව්‍යවහාර මුදල් සම්බන්ධයෙන් සිදුවූ විදේශ ව්‍යවහාර මුදල් විනිමය වෙනස්කම් ආශ්‍රිත සමූහයේ නිරාවරණය වැදගත් සේ නිරූපණය නොවේ.

| | බදු පූර්ව අලාභය මත බලපෑම | | | |
|---|---|---|---|---|
| | සමූහය | | සමාගම | |
| | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන | **2015 රු. මිලියන** | 2014 රු. මිලියන |
| ඇ.ඩො. අනුපාතය එල්ලේ ශ්‍රී.ලං.රු. වැඩිවීම/(අඩුවීම) | | | | |
| +3% | **816.00** | 320.41 | **823.88** | 346.99 |
| -3% | **(816.00)** | (320.41) | **(823.88)** | (346.99) |

*විනිමය අනුපාතවල (ඇමරිකානු ඩොලර්) වැඩිවීම, අලාභවල වැඩි වීමට හේතු කාරකයක් වේ.*

## (ii) ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු, සිය ප්‍රවර්තන හා අනාගත මුදල් බැදියාවන්, ඒවා ගෙවීමට නියමිත අවස්ථාව වන විට සමූහය විසින් සපුරාලීමට අසමත් විය හැකි අවදානමයි. දෛනිකව/සතිපතා/මාසිකව හා වාර්ෂිකව සිදු කෙරෙන මුදල් කළමනාකරණ හා අය වැය ලේඛන ක්‍රියාවලියක් උපයෝගී කර ගනිමින් සමූහය සිය අරමුදල් ඌනතාවයේ අවදානම අධීක්ෂණය කරයි. එකී අවදානම සමනය කිරීමේ අටියෙන් සමූහය, දිගු හා කෙටි කාලීන ණය, බැංකු අයිරා පහසුකම් සහ මූල්‍ය/ක්‍රියාකාරී කල්බදුකර ඇතුළු විවිධ මූලාශ්‍ර සහිත අරමුදල්කරණයක් මූල්‍ය ආයතන වෙතින් සපයා ගනියි.

ප්‍රාග්ධන නික්ෂේපණ වැඩසටහනේ කොටසක් වශයෙන් ශ්‍රී ලංකා රජය භාණ්ඩාගාර බැඳුම්කර අනුසාරයෙන් සමාගම සඳහා ආයෝජන සිදු කර තිබේ. සමාගමේ ද්‍රවශීලතා තත්ත්වය සවිමත් කිරීම සඳහා එකී භාණ්ඩාගාර බැඳුම්කර ඒවායේ කල් ඉකුත් වීමට පෙර මුදල් කර ගැනීම පිණිස සමාගම මූල්‍ය වර්ෂය තුළ කටයුතු කළේය.

| | 2015 | | | | | |
|---|---|---|---|---|---|---|
| | ඉල්ලුවිට රු. මිලියන | මාස 3 ට අඩු රු. මිලියන | මාස 3-12 අතර රු. මිලියන | අවු. 1-5 අතර රු. මිලියන | වසර 5 ට වැඩි රු. මිලියන | එකතුව රු. මිලියන |
| **සමූහය** | | | | | | |
| පොලී දරණ බැරකම් | 5,533.26 | 3,453.27 | 33,016.72 | 40,968.53 | 514.59 | 83,486.37 |
| වෙළෙඳ හා වෙනත් ගෙවීම් නියමිත | 11,286.80 | 26,203.47 | – | – | – | 37,490.27 |
| වරණීය කොටස් | – | 37.50 | 112.50 | 600.00 | 1,150.00 | 1,900.00 |
| | 16,820.06 | 29,694.24 | 33,129.22 | 41,568.53 | 1,664.59 | 122,876.64 |
| **සමාගම** | | | | | | |
| පොලී දරණ බැරකම් | 5,533.26 | 3,451.04 | 33,010.03 | 40,954.53 | 514.59 | 83,463.45 |
| වෙළෙඳ හා වෙනත් ගෙවීම් නියමිත | 11,286.80 | 31,104.96 | – | – | – | 42,391.76 |
| | 16,820.06 | 34,556.00 | 33,010.03 | 40,954.53 | 514.59 | 125,855.21 |

| | 2014 | | | | | |
|---|---|---|---|---|---|---|
| | ඉල්ලුවිට<br>රු. මිලියන | මාස 3 ට අඩු<br>රු. මිලියන | මාස 3-12 අතර<br>රු. මිලියන | අවු. 1-5 අතර<br>රු. මිලියන | වසර 5 ට වැඩි<br>රු. මිලියන | එකතුව<br>රු. මිලියන |
| **සමූහය** | | | | | | |
| පොලී දරණ බැරකම් | 7,342.76 | 5,533.26 | 11,288.87 | 25,464.06 | 1,477.53 | 51,106.48 |
| වෙළෙඳ හා වෙනත් ගෙවීම් නියමිත | 4,160.47 | 42,259.62 | – | – | – | 46,420.09 |
| වරණීය කොටස් | – | 37.50 | 112.50 | 600.00 | 1,300.00 | 2,050.00 |
| | 11,503.23 | 47,830.38 | 11,401.37 | 26,064.06 | 2,777.53 | 99,576.57 |
| **සමාගම** | | | | | | |
| පොලී දරණ බැරකම් | 7,342.76 | 4,005.83 | 11,207.49 | 25,461.40 | 1,477.54 | 49,495.02 |
| වෙළෙඳ හා වෙනත් ගෙවීම් නියමිත | 4,160.47 | 40,408.92 | – | – | – | 44,569.39 |
| | 11,503.23 | 44,414.75 | 11,207.49 | 25,461.40 | 1,477.54 | 94,064.41 |

### iii. ණයවර අවදානම

ණයවර අවදානම යනු, මූල්‍ය අලාභයකට හේතුවන අයුරින් මූල්‍ය සාධන පත්‍රයක් හෝ සේවාදායක කොන්ත්‍රාත්තුවක් යටතේ ප්‍රති පාර්ශ්වයක් විසින් ස්වකීය බැඳියා නොසපුරාලීමේ අවදානමයි. ප්‍රධාන වශයෙන් සිය මෙහෙයුම් කටයුතු ඔස්සේ (මූලික වශයෙන් වෙළෙඳ ලැබීම් නියමිත හරහා) සමූහය ණයවර අවදානමට නිරාවරණය වෙයි.

ගුවන් මගී විකුණුම් හා ගුවන් බඩු ප්‍රවාහනය මූලික වශයෙන් 'අයටා' (IATA)  සංගමයේ බලයලත් අලෙවි නියෝජිතයන් හරහා සිදුවේ. එබඳු විකුණුම්හි ණයවර අවදානම පුළුල් විවිධාංගීකරණය හේතුවෙන් සාපේක්ෂ වශයෙන් සුළු එකකි. මෙම නියෝජිතයන් විසින් කරනු ලබන මුදල් බේරුම් කිරීම්,, සිය ගුවන් මගී හා ගුවන් භාණ්ඩ බේරුම් කිරීමේ ක්‍රියා පිළිවෙත් ඔස්සේ 'අයටා' සංගමය විසින් ඍජුවම ගුවන් සමාගමට බේරුම් කරන අතර එමගින් එකී නියෝජිතවරුන්ගේ ණය ගෙවීමේ හැකියාව පිළිබඳව වැඩිමනත් සහතිකයක් ද සැපයේ.

ප්‍රධාන ගුවන් සමාගම් අතර ලැබීම් නියමිත හා ගෙවීම් නියමිත මූලික වශයෙන් නිරවුල් කෙරෙනුයේ 'අයටා' සංගමයේ නිශ්කාෂණ මධ්‍යස්ථානයෙනි. සාමාන්‍යයෙන් ලැබීම් නියමිත හා ගෙවීම් නියමිත එකතුකර නිරවුල් කෙරෙනුයේ සතිපතා විරාමයක් සහිතව වන අතර එමගින් ගෙවීම් ප්‍රමාද කිරීමේ අවදානම තුළ පැහැදිලි අඩුවීමක් සිදුවේ. වෙනත් සේවා සබඳතා සඳහා,, ඉටු කරනු ලබන සේවාවන්හි ස්වභාවය හා විෂය පථය අනුව රඳා පවතින සමපාර්ශ්වික ඇපයක් අවශ්‍ය වේ. ණය ගැතියන් වෙතින් ලැබෙන එබඳු සමපාර්ශ්වික ඇපවලට බැංකු ඇපකර සහ සුරැකුම් තැන්පතු ඇතුළත් වේ.

අවදානම් හඳුනා ගනු ලබූ විට ලැබීමට නියමිත අනුමත ගිණුම් සඳහා දුබලත්ව ප්‍රතිපාදන සැපයේ.

### ප්‍රාග්ධන කළමනාකරණය

මෙම මූල්‍ය ප්‍රකාශවල 2.1.2 වන සටහනෙහි වැඩිමනත් වශයෙන් විස්තර කර ඇති අනුමත ව්‍යාපාර සැලැස්ම මත පිහිටා අවශ්‍ය අරමුදල් සපයා දීම සඳහා වන සිය වගකීම ණය මූල්‍යකරණය සලසා ගනු පිණිස කොටස් නික්ෂේපනය කිරීම සහ රාජ්‍ය ඇපකර සහන ලිපි නිකුත් කිරීම මගින් ශ්‍රී ලංකා රජය ප්‍රදර්ශනය කර ඇත. නාකරණය ප්‍රාග්ධන ව්‍යුහය අඛණ්ඩව සමාලෝචනයට භාජනය කරනු ලබන අතර ප්‍රවර්තන වෙළෙඳපොළ තත්ත්වයන් මෙන්ම සමූහයේ මෙහෙයුම් කටයුතුද නිරූපණය වනු පිණිස අවශ්‍ය ගැළපුම් සිදු කිරීම සඳහා සුදුසු පියවර ගනු ලබනවා ඇත.

# දස අවුරුදු සමාලෝචනය



| | | සමාගම | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | **2015** |
| **ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශය** | | | | | | | | | | | |
| ආදායම | රු. මිලියන | 61,160.14 | 67,963.76 | 79,128.56 | 73,307.77 | 62,363.58 | 77,125.45 | 92,867.93 | 119,570.90 | 121,585.83 | **131,922.13** |
| මෙහෙයුම් වියදම | රු. මිලියන | 60,720.29 | 69,406.68 | 82,154.01 | 84,794.86 | 69,026.74 | 81,334.34 | 111,775.88 | 146,700.24 | 150,389.46 | **145,983.35** |
| ශුද්ධ ලාභය/(අලාභය) | රු. මිලියන | 476.53 | 568.04 | 4,428.23 | (9,305.94) | (2,698.20) | (381.61) | (19,778.03) | (26,088.57) | (32,408.34) | **(16,494.66)** |
| **මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය** | | | | | | | | | | | |
| කොටස් ප්‍රාග්ධනය/ ප්‍රකාශිත ප්‍රාග්ධනය | රු. මිලියන | 5,146.35 | 5,146.35 | 5,146.35 | 5,146.35 | 5,146.35 | 5,146.35 | 19,432.67 | 32,032.75 | 51,617.44 | **51,617.44** |
| ජංගම නොවන වත්කම් | රු. මිලියන | 16,136.77 | 16,568.73 | 15,730.43 | 19,333.18 | 28,531.75 | 19,862.87 | 37,591.58 | 23,338.28 | 25,212.47 | **22,836.78** |
| ජංගම වත්කම් | රු. මිලියන | 21,866.73 | 21,347.46 | 32,209.67 | 15,008.38 | 15,910.82 | 18,276.59 | 22,072.71 | 54,905.22 | 37,154.23 | **49,721.49** |
| මුළු වත්කම් | රු. මිලියන | 38,003.50 | 37,916.19 | 47,940.10 | 34,341.56 | 44,442.57 | 38,139.46 | 59,664.29 | 78,243.50 | 62,366.70 | **72,558.27** |
| ජංගම බැරකම් | රු. මිලියන | 25,485.05 | 25,006.65 | 29,134.89 | 25,012.31 | 28,399.92 | 28,017.97 | 64,235.43 | 71,346.64 | 88,609.07 | **103,414.31** |
| **උත්පාදනය/ඒකක පිරිවැය** | | | | | | | | | | | |
| සමස්ත උත්පාදනය | රු. tkm | 52.2 | 55.71 | 61.01 | 64.85 | 54.94 | 60.27 | 64.47 | 74.31 | 77.26 | **80.32** |
| ඒකක පිරිවැය | රු. tkm | 37.62 | 40.30 | 46.48 | 50.71 | 43.37 | 45.92 | 57.28 | 64.68 | 64.96 | **61.88** |
| සමච්ඡේදක පැටවුම් සාධකය | % | 72.0 | 72.34 | 76.18 | 78.19 | 78.94 | 76.19 | 88.84 | 87.03 | 84.07 | **77.03** |
| මගී කිලෝමීටර් ප්‍රමාණ ආදායම | රු./RPK | 5.3 | 5.6 | 6.5 | 6.8 | 5.8 | 6.3 | 6.6 | 7.6 | 7.8 | **8.2** |
| **නිපැයුම** | | | | | | | | | | | |
| මගී ධාරිතාව | ASK මිලියන | 11,934.86 | 12,375.62 | 12,599.58 | 11,731.56 | 10,724.83 | 12,481.41 | 14,248.94 | 15,944.31 | 15,780.54 | **16,180.27** |
| සමස්ත ධාරිතාව | ATK මිලියන | 1,590.55 | 1,695.91 | 1,741.10 | 1,635.62 | 1,541.03 | 1,755.23 | 1,978.33 | 2,186.96 | 2,187.18 | **2,224.87** |
| **ප්‍රවාහනය** | | | | | | | | | | | |
| ප්‍රවාහනිත මගීන් | දහස් සංඛ්‍යාත | 3,005 | 3,176 | 3,196 | 2,735 | 2,558 | 2,867 | 3,459 | 4,255 | 4,175 | **4,348** |
| ප්‍රවාහනිත මගීන් | RPK මිලියන | 9,050.44 | 9,535.79 | 9,793.05 | 8,546.44 | 8,357.89 | 9,584.02 | 11,270.23 | 12,968.74 | 12,810.95 | **12,963.71** |
| මගී පැටවුම් සාධකය | % | 75.83 | 77.05 | 77.73 | 72.85 | 77.93 | 76.79 | 79.10 | 81.34 | 81.18 | **80.12** |
| ප්‍රවාහනිත ගුවන් භාණ්ඩ | ටොන් | 82,142 | 88,833 | 93,161 | 73,106 | 72,058 | 86,053 | 87,750 | 101,100 | 94,410 | **101,878** |
| ප්‍රවාහනිත ගුවන් භාණ්ඩ පැටවුම | RTK මිලියන | 300.73 | 325.97 | 350.35 | 302.36 | 283.83 | 332.98 | 345.67 | 377.75 | 355.59 | **373.32** |
| සමස්ත ප්‍රවාහනිත සැපයුම | RTK මිලියන | 1,102.77 | 1,150.84 | 1,232.62 | 1,065.15 | 1,028.11 | 1,184.13 | 1,338.30 | 1,513.70 | 1,466.74 | **1,519.93** |
| ගුවන් භාණ්ඩ පැටවුම් සාධකය | % | 56.11 | 58.44 | 61.60 | 53.17 | 56.42 | 56.80 | 53.78 | 53.89 | 49.79 | **52.14** |
| සමස්ත පැටවුම් සාධකය | % | 69.33 | 67.86 | 70.80 | 65.12 | 66.72 | 67.46 | 67.65 | 69.22 | 67.06 | **68.32** |
| **කාර්ය මණ්ඩලය** | | | | | | | | | | | |
| සාමාන්‍ය සේවක ආදායම | සංඛ්‍යාව | 5,395 | 5,272 | 5,113 | 4,837 | 4,614 | 4,998 | 5,594 | 6,359 | 6,578 | **6,987** |
| ඒක සේවක පිරිස | රු. | 11,336,449 | 12,891,457 | 15,475,955 | 15,155,627 | 13,516,164 | 15,431,263 | 16,601,346 | 18,803,412 | 18,483,708 | **18,881,084** |
| ඒක සේවක ධාරිතාව | ටොන්-කි.මී | 294,820 | 321,683 | 340,523 | 338,148 | 333,991 | 351,186 | 353,652 | 343,916 | 332,499 | **318,430** |
| ඒක සේවක ප්‍රවාහනිත පැටවුම | ටොන්-කි.මී | 204,406 | 218,293 | 241,077 | 220,210 | 222,825 | 236,922 | 239,238 | 238,041 | 222,976 | **217,537** |
| **ගුවන් යානා ඇණිය** | | | | | | | | | | | |
| A320-200 | ගණන | 5 | 5 | 5 | 3 | 3 | 4 | 7 | 8 | 8 | **6** |
| A321-200 | ගණන | – | – | – | – | – | – | – | – | – | **2** |
| A330-200 | ගණන | 4 | 4 | 4 | 4 | 4 | 5 | 7 | 7 | 7 | **7** |
| A330-300 | ගණන | – | – | – | – | – | – | – | – | – | **2** |
| A340-300 | ගණන | 5 | 5 | 5 | 5 | 5 | 5 | 6 | 6 | 6 | **4** |
| ටර්බෝ ඔට | ගණන | 2 | 2 | – | – | – | 2 | 2 | 1 | – | **–** |
| වසරාවසන සේවයේ නිරත ගුවන් යානා | ගණන | 16 | 16 | 14 | 12 | 12 | 16 | 22 | 22 | 21 | **21** |

# ගුවන් මාර්ග සිතියම



ශ්‍රීලංකන් සෘජු ගුවන් ගමන්

මිහින් ලංකා සමඟ සංකේත
හුවමාරු ගුවන් ගමන් මාර්ගය

අලිතාලියා සමඟ සංකේත
හුවමාරු ගුවන් ගමන් මාර්ගය

එයාර් කැනඩා සමඟ සංකේත
හුවමාරු ගුවන් ගමන් මාර්ගය

එටිහාඩ් එයාර්වේස් සමඟ සංකේත
හුවමාරු ගුවන් ගමන් මාර්ගය

ෆින්එයාර් සමඟ සංකේත
හුවමාරු ගුවන් ගමන් මාර්ගය

මැලේෂියා එයාර්ලයින්ස් සමඟ සංකේත
හුවමාරු ගුවන් ගමන් මාර්ගය

ඕමාන් එයාර් සමඟ සංකේත
හුවමාරු ගුවන් ගමන් මාර්ගය

සයිබීරියන් එයාර්ලයින්ස් සමඟ සංකේත
හුවමාරු ගුවන් ගමන් මාර්ගය




SriLankan Airlines
You're our world

oneworld




ශ්‍රීලංකන් එයාර්ලයින්ස් දැන් රටවල් 44 ගමනාන්ත 89 ක් දක්වා ගුවන් මෙහෙයුම් සිදුකරයි.

# ශ්‍රීලංකන් එයාර්ලයින්ස් - විශේෂ කඩඉම්



**2004/05**

- ශ්‍රීලංකන් කෙයාර්ස් නමැති ගුවන් සමාගමට අයත් පුණ්‍ය සත්කාරක ඒකකය ආරම්භ කිරීම.
- මෙහෙයුම් බදුකර ගිවිසුමක් යටතේ 2004 අප්‍රේල් මාසයේදී A320 වර්ගයේ එයාර්බස් ගුවන් යානයක් සමාගම වෙනුවෙන් ගුවන් ගමන් ඇරඹීය.

**2006/07**

- ශ්‍රීලංකන් කේටරින් සමාගම අති නවීන අංගෝපාංගවලින් සමන්විත ගුවන් යානා ආහාරපාන සැපයීමේ මුළුතැන්ගෙයක් ස්ථාපනය කර විවෘත කරයි.
- ජාත්‍යන්තර ගුවන් සේවා විද්‍යායතනයක් ආරම්භ කිරීම.

**2007/08**

- ඉන්දියාව කරා සතියකට ගුවන් ගමන් වාර 100 ක් ධාවනය කරන ප්‍රථම විදේශ ගුවන් සේවය බවට ශ්‍රීලංකන් ගුවන් සමාගම පත්වීම.

**2008/09**

- සමාගම වෙනුවෙන් මෙහෙයුම් බදුකර ගිවිසුමක් යටතේ A320 වර්ගයේ එයාර්බස් ගුවන් යානයක් සිය ගුවන් ගමන් ආරම්භ කළේය. එමිරේට්ස් ගුවන් සමාගම දස වසරක කාලපරිච්ඡේදයක් සඳහා දැරූ සමාගමේ කළමනාකාරිත්ව පාලනය 2008 මාර්තු මාසයේදී අවසන් විය. ඉන් අනතුරුව, සමාගමේ කළමනාකරණය 2008 අප්‍රේල් මස 01 වන දින සිට ඇරඹෙන පරිදි ශ්‍රී ලංකා රජය වෙත පවරා දෙනු ලැබිණි.
- සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන 'ෆ්ලයිස්මයිල්ස්' නමැති නිරන්තර ගුවන් පියාසර වැඩසටහන දියත් කිරීම.

**2009/10**

- මෙහෙයුම් බදුකර ගිවිසුමක් යටතේ A320 වර්ගයේ එයාර්බස් ගුවන් යානා දෙකක් සමාගම වෙනුවෙන් ගුවන් ගමන් ඇරඹීය.

**2010/11**

- මෙහෙයුම් බදුකර ගිවිසුම් යටතේ A320 වර්ගයේ එයාර් බස් ගුවන් යානයක් සහ A330 වර්ගයේ පුළුල් බඳ එයාර්බස් ගුවන් යානා දෙකක් සමාගම වෙනුවෙන් ගුවන් ගමන් ඇරඹීය.
- එමිරේට්ස් ගුවන් සමාගම විසින් දරණ ලද සමාගම සතු කොටස් හිමිකාරිත්වයේ 43.63% ක්වූ ප්‍රමාණය මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය 2010 ජූලි මාසයේදී අවශ්‍ය මුල්‍ය පහසුකම් සලසා දුන්නේය.

**2011/12**

- මෙහෙයුම් බදුකර ගිවිසුම් යටතේ A320 වර්ගයේ එයාර්බස් ගුවන් යානා හතරක්ද, A330 වර්ගයේ පුළුල්බඳ එයාර්බස් ගුවන් යානා දෙකක්ද, A340 වර්ගයේ පුළුල්බඳ එයාර්බස් ගුවන් යානයක්ද සමාගම වෙනුවෙන් ගුවන් ගමන් ඇරඹීය.
- ගුවන් සමාගමේ ප්‍රතිප්‍රාග්ධන කටයුතු සඳහා ශ්‍රී ලංකා රජය විසින් ඇමරිකානු ඩොලර් මිලියන 500 ක කොටස් ආයෝජනයක් කළ යුතු යැයි අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**2012/13**

- ලොව ප්‍රමුඛ ගුවන් සමාගම් සන්ධානයක් වන 'වන්වර්ල්ඩ්' සංවිධානයේ සාමාජිකත්වයට බැඳෙන ලෙස ආරාධනා ලැබීම.
- A320 වර්ගයේ ගුවන් යානාවල නියමුවන් පුහුණු කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ ප්‍රථමවරට ගුවන් පියාසර සිමියුලේටරයක් ස්ථාපනය කිරීම.
- මෙහෙයුම් බදුකර ගිවිසුමක් යටතේ A320 වර්ගයේ එයාර්බස් ගුවන් යානයක් ගුවන් සමාගම වෙනුවෙන් ගුවන් ගමන් ඇරඹීය.
- මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළේ සිට ජාත්‍යන්තර ගුවන් ගමන් ඇරඹීම.
- ඇමරිකානු ඩොලර් මිලියන 175 ක්වූ මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා 2012 මැයි මාසයේදී සමාගම හවුල් විදේශ බැංකු සින්ඩිකේටයක් සඳහා මූල්‍ය වැඩපිළිවෙළකට එළැඹීම.

**2013/14**

- A330 වර්ගයේ ගුවන් යානාවල නියමුවන් පුහුණු කිරීම සඳහා ගුවන් පියාසර සිමියුලේටරයක් ස්ථාපනය කිරීම.
- සමාගමට අයත් පුළුල්බඳ ගුවන් යානා ඇණිය වෙනුවට A330-300 වර්ගයේ ගුවන් යානා හයක් සහ A350-900 වර්ගයේ ගුවන් යානා හතරක් 2014 සිට 2021 දක්වා කාලපරිච්ඡේදය තුළ මිලදී ගැනීම සඳහා සමාගම, එයාර්බස් ආයතනය සමග ගිවිසුමකට එළැඹි අතර 2016 දී A350-900 වර්ගයේ නව ගුවන් යානා තුනක් තවදුරටත් ගුවන් සමාගම වෙනුවෙන් සේවයේ යෙදවීම සඳහාද බදුකර ගිවිසුම්වලට එළැඹියේය.
- 2013 දෙසැම්බර් මාසයේදී සමාගම ස්වකීය ගුවන් මගී සේවා පද්ධතිය, ඇම්ඩියස් ඇල්ටියා පද්ධතියට අනුකූලවන පරිදි පරිවර්තනය කළේය.
- ඇමරිකානු ඩොලර් මිලියන 150 ක්වූ වටිනාකමක් සහිත මැදිකාලීන මූල්‍යකරණයක් සලසාගනු පිණිස සමාගම 2014 මාර්තු මාසයේදී හවුල් බැංකු සින්ඩිකේටයක් සමග මූල්‍යන ගිවිසුමකට එළැඹියේය.

**2014/15**

- සමාගම 2014 මැයි මස 1 වන දින 'වන්වර්ල්ඩ්' ගුවන් සමාගම් සංධානයට ඇතුළත් විය.
- සමාගම 2014 ජූනි මාසයේදී ජාත්‍යන්තර බැඳුම්කරයක් නිකුත් කරන ලදී.
- පිළිවෙලින් 2014 ඔක්තෝබර්, 2014 දෙසැම්බර් සහ 2015 මාර්තු යන මාසවලදී නවීනතම A340-300 වර්ගයේ ගුවන් යානා තුනක් සමාගම විසින් මෙරටට ගෙන්වා ගනු ලැබීය.

# පාරිභාෂික පද විවරණය



**ලබා ගත හැකි ආසන කිලෝමීටර ප්‍රමාණය** (ASK)
විකුණුම් සඳහා තැබෙන ආසන නිපැයුම සහ ඒවා ප්‍රවාහනය කෙරෙන දුර ප්‍රමාණය.

**ලබාගත හැකි ටොන් කිලෝමීටර් ප්‍රමාණය** (ATK)
මෙය ප්‍රවාහන නිපැයුමෙහි මිණුම වේ.

ගුවන් යානාවක් නිපදවන ලබාගත හැකි ටොන් කිලෝමීටර් ප්‍රමාණය වනුයේ, පියාසර කළ දුර ප්‍රමාණයෙන් ගුණිත ටොන් ප්‍රමාණයෙන් ගණනය වන ගුවන් යානාවේ ලාභ භාරයේ ධාරිතාවයි.

**මගී කිලෝමීටර් ප්‍රමාණ ආදායම** (RPK)
ප්‍රවාහනය කරන ලද මගීන්ගේ නිපැයුම සහ ඒවා ප්‍රවාහනය කෙරෙන දුර ප්‍රමාණය.

**ටොන් කිලෝමීටර් ප්‍රමාණ ආදායම** (RTK)
ප්‍රවාහනය කරන ලද මගීන්ගේ සහ භාණ්ඩවල ටොන් ප්‍රමාණ නිපැයුම සහ ඒවා ප්‍රවාහනය කෙරෙන දුර ප්‍රමාණය.

**පැටවුම් සාධකය**
ආදායම් පැටවුමට සැපයූ ධාරිතාවයේ සබඳතාව අනුව ප්‍රතිශතය.

මගී පැටවුම් සාධකය, මගී කිලෝමීටර් ප්‍රමාණ ආදායමට ලබාගත හැකි ආසන කිලෝමීටර් ප්‍රමාණය හා අදාළ වන අතර සමස්ත පැටවුම් සාධකය, ටොන් කිලෝමීටර් ප්‍රමාණ ආදායමට ලබාගත හැකි ටොන් කිලෝමීටර් ප්‍රමාණය හා අදාළ වේ.

**මගී කිලෝමීටර් ප්‍රමාණ ආදායම එක් කිලෝමීටරයකට අනුව ආදායම**
මගී කිලෝමීටර් ප්‍රමාණ ආදායම එක් කිලෝමීටරයකට අනුව ආදායම, මගී ආදායමට මගී කිලෝමීටර් ප්‍රමාණ ආදායම හා අදාළ වේ.

**ඒකක පිරිවැය**
ඒකක පිරිවැය, මුළු මෙහෙයුම් පිරිවැයට ලබාගත හැකි ටොන් කිලෝමීටර් ප්‍රමාණය හා අදාළ වේ.

**සමස්ත ඉපදවීම**
සමස්ත ඉපදවීම, ශුද්ධ ප්‍රවාහන ආදායමට ටොන් කිලෝමීටර් ප්‍රමාණ ආදායම හා අදාළ වේ.

ශුද්ධ ප්‍රවාහන ආදායම වනුයේ මගීන්, අතිරේක ගුවන් බඩු, ගුවන් බඩු හා තැපැල් ආදායම් යනාදියෙන් ලැබෙන මුදල් ප්‍රමාණයයි.

**සමච්ඡේදක පැටවුම් සාධකය**
කාල නිශ්චිත ගුවන් සමාගම් මෙහෙයුම්වලින් ලබන ආදායම මෙහෙයුම් පිරිවැය හා සාම්‍ය වනු පිණිස පැටවුම් සාධකය අවශ්‍ය වේ.

# මහ සභා රැස්වීම දැනුම් දීම



සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ කොටස්හිමියන්ගේ තිස්හත් වන වාර්ෂික මහ සභා රැස්වීම පහත දැක්වෙන අරමුණු සඳහා 2015 ඔක්තෝබර් මස 15 වන ගුරු දින පෙ.ව. 10.00 ට කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ 'මිහලක මැදුර' රැස්වීම් ශාලාවේදී පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**න්‍යාය පත්‍රය**

1. 2015 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වර්ෂය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ, ඒ පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව සමග භාරගනු ලැබ සලකා බැලීම.

2. වයස අවුරුදු හැත්තෑව ඉක්මවූ චානක ද සිල්වා මහතා සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස නැවත පත් කිරීම හා සුදුසුයැයි හැගේ නම් පහත දැක්වෙන යෝජනාව සම්මත කර ගැනීම:

   "2007 අංක 07 දරන සමාගම් පනතේ 210 වන වගන්තිය මගින් නියමකර ඇති වයස් සීමාව චානක ද සිල්වා මහතා සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු බවත් වාර්ෂික මහ සභා රැස්වීම අවසන් වූ තැන් සිට තවදුරටත් එක් වසරක කාලසීමාවක් සඳහා චානක ද සිල්වා මහතා සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස නැවත පත් කළ යුතු බවත් මෙයින් යෝජනා කර සිටිමු."

3. අර්න්ස්ට් ඇන්ඩ් යංග් සමාගම විගණකවරුන් වශයෙන් නැවත පත්කිරීම හා ඔවුන්ගේ පාරිශ්‍රමික නියම කිරීම සඳහා අධ්‍යක්ෂවරුන්ට බලය පැවරීම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



**ඩැල්රින් තිරුකුමාර්**
සමාගමේ ලේකම්

2015 අගෝස්තු මස 25 දින
කටුනායකදීය.

***සටහන:***

*1. මහ සභා රැස්වීමට සහභාගිවී ඡන්දය දීමට හිමිකම් ලබන සාමාජිකයෙකු ඔහු වෙනුවෙන් එම රැස්වීමට සහභාගිවී ඡන්දය පාවිච්චි කිරීම සඳහා පෙරකලාසිකරුවකු පත්කරනු ලැබීම පිණිස හිමිකම් ලබයි.*

*2. පෙරකලාසිකරුවකු සමාගමේ සාමාජිකයෙකු වීම අවශ්‍ය නොවේ.*

*3. මෙම දැනුම්දීම සමග පෙරකලාසි පත්‍රයක් මෙයට යාකර ඇත.*

*4. මහ සභා රැස්වීමට සහභාගි වන කොටස් හිමියන්/පෙරකලාසිකරුවන් මෙම දැනුම්දීම සමග ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත්‍රය ද රැගෙන ආ යුතු යයි ඉල්ලා සිටිනු ලැබේ.*

# සටහන්

# පෙරකලාසි පත්‍රය



**සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම**

සී/ස ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ගුවන් සමාගමේ සාමාජිකයෙකු/සාමාජිකයන් වන ……………………………………………………………………………………පදිංචි

……………………………………………………………………………………………………………………………………වන මම/අපි,

2015 ඔක්තෝබර් මස 15 වන ගුරු දින පෙ.ව. 10.00 ට, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ "මිහිලක මැදුර" රැස්වීම් ශාලාවේදී පවත්වනු ලබන සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමට අයත් කොටස්හිමියන්ගේ තිස්හත් වන වාර්ෂික මහා සභා රැස්වීමේදී හා එහි කිසියම් කල්තැබූ රැස්වීමකදී මා/අප වෙනුවෙන් පෙනී සිටිමින් මා/අප නියෝජනය කිරීම පිණිස:

…………………………………………………………………………… පදිංචි ……………………………………………………………………………

……………………………………………හෝ ඔහු/ඇය පැමිණීමට අපොහොසත් වෙතොත් පහත දැක්වෙන,

අජිත් නිශ්ශංක ඩයස් මහතා
රකිත ජයවර්ධන මහතා
ලුතිනන් කර්නල් සුනිල් පීරිස් මහතා
ජෝශප් බ්‍රිටෝ මහතා
මහින්ද හරදාස මහතා
චානක ද සිල්වා මහතා
නිරංජන් ද සිල්වා දේවා ආදිත්‍ය  මහතා
හරින්ද්‍ර බාලපටබැඳි මහතා

යන අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙකු, මගේ/අපගේ පෙරකලාසි බලකරු වශයෙන් මෙයින් පත් කරමි.

| | | පක්ෂව | විපක්ෂව |
|---|---|---|---|
| 1. | 2015 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වර්ෂය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ, ඒ පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව සමග භාරගනු ලැබ සලකා බැලීම. | ☐ | ☐ |
| 2. | වයස අවුරුදු හැත්තෑව ඉක්මවූ චානක ද සිල්වා මහතා සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස නැවත පත් කිරීම හා සුදුසු යැයි හැඟේ නම් පහත දැක්වෙන යෝජනාව සම්මත කර ගැනීම:<br>"2007 අංක 07 දරන සමාගම් පනතේ 210 වන වගන්තිය මගින් නියමකර ඇති වයස් සීමාව චානක ද සිල්වා මහතා සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු බවත්, වාර්ෂික මහ සභා රැස්වීම අවසන් වූ තැන් සිට තවදුරටත් එක් වසරක කාලසීමාවක් සඳහා චානක ද සිල්වා මහතා සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස නැවත පත් කළ යුතු බවත් මෙයින් යෝජනා කර සිටිමු." | ☐ | ☐ |
| 3. | අර්න්ස්ට් ඇන්ඩ් යංග් සමාගම විගණකවරුන් වශයෙන් නැවත පත්කිරීම හා ඔවුන්ගේ පාරිශ්‍රමික නියම කිරීම සඳහා අධ්‍යක්ෂවරුන්ට බලය පැවරීම. | ☐ | ☐ |

වර්ෂ දෙදහස් පහළොවේ ................................................ මස ............................................ ක්වූ මෙම දිනයේ දී අත්සන් කළෙමි.

.............................................
අත්සන

***සටහන:***

*චචන කිසිවක් කපා හරිනු ලැබ නොමැති නම් හෝ පෙරකලාසි පත්‍ර හිමිකරු සිය ඡන්දය පාවිච්චි කළයුතු ආකාරය සම්බන්ධයෙන් එකී පෙරකලාසි පත්‍ර හිමිකරු සැලකිල්ලට ගැනීමේදී (පෙරකලාසි පත්‍රෙයහි අඩංගු උපදෙස් සම්පූර්ණ කර ඇති ආකාරය සම්බන්ධ හේතුවෙන්) යම් සැකයක් මතු නොවේ නම් හෝ පෙරකලාසි බලපත්‍රහිමියා තමන්ට යෝග්‍ය හා සුදුසු යැයි හැඟෙන පරිදි ස්වකීය ඡන්දය පාවිච්චි කරනු ඇත.*

පෙරකලාසි පත්‍රය



## පෙරකලාසි පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

1. ඔබගේ සම්පූර්ණ නම සහ ලිපිනය පැහැදිලිව ලියා, සපයා ඇති ඉඩෙහි අත්සන යොදා, අත්සන් තැබූ දිනයද, සටහන් කර පෙරකලාසි පත්‍රය නිවැරදිව සම්පූර්ණ කරන්න.
2. නේවාසික/අනේවාසික කොටස්හිමියන් සම්බන්ධයෙන් වන විට, සම්පූර්ණ කරන ලද පෙරකලාසි පත්‍රය සමාගම වෙත භාරගනු ලැබීනේ පසුව ඊට අදාළ මුද්‍රා කටයුතු සිදු කෙරේ.
3. සම්පූර්ණ කරන ලද පෙරකලාසි පත්‍රය මහ සභා රැස්වීම පැවැත්වීමට නියමිත වේලාවට පැය 48 කට නොඅඩු කාලයකට පෙර සමාගමේ පහත දැක්වෙන ලියාපදිංචි කළ කාර්යාලයෙහි තැන්පත් කරනු ලැබිය යුතුය.

# ආයතනික තොරතුරු

**සමාගමේ නාමය**

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්

**සමාගම ලියාපදිංචි කිරීමේ අංකය**

PB 67

**නෛතික ආකෘතිය**

පොදු සීමිත වගකීම් සමාගමකි

**අධ්‍යක්ෂ මණ්ඩලය**

අජිත් ඩයස් මහතා
රබිත ජයවර්ධන මහතා
ලුතිනන් කර්නල් සුනිල් පීරිස්
ජෝශප් බ්‍රිටෝ මහතා
චානක ද සිල්වා මහතා
මහින්ද හරදාස මහතා
නිරංජන් ද සිල්වා දේවා ආදිත්‍ය මහතා
හරින්ද්‍ර බාලපටබැඳි මහතා

**විගණන කමිටුව**

ජෝශප් බ්‍රිටෝ මහතා (සභාපති)

චානක ද සිල්වා මහතා

මහින්ද හරදාස මහතා

ලුතිනන් කර්නල් සුනිල් ඩී පීරිස්

**මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව**

ලුතිනන් කර්නල් සුනිල් පීරිස් (සභාපති)

ජෝශප් බ්‍රිටෝ මහතා

චානක ද සිල්වා මහතා

මහින්ද හරදාස මහතා

**සමාගමේ ලේකම්**

ඩැල්රීන් තිරුකුමාර් මහත්මිය

**බැංකුකරුවෝ**

ජාතික සංවර්ධන බැංකුව
ලංකා බැංකුව
ස්ටෑන්ඩර්ඩ් චාටඩ් බැංකුව හොංකොං ඇන්ඩ්
ෂැංහයි බැංකුව
සිටි බැංකුව එන්.ඒ
සම්පත් බැංකුව
නේෂන් ට්‍රස්ට් බැංකුව
ඩෝච බෑන්ක් එන්.ජී
හැටන් නැෂනල් බැංකුව
කොමර්ෂල් බැංකුව
අමානා බැංකුව
මහජන බැංකුව

**විගණකවරු**

අර්න්ස්ට් ඇන්ඩ් යංග්
වරලත් ගණකාධිකාරිවරු
201, ද සේරම් පෙදෙස,
කොළඹ 10.

**ලියාපදිංචි කාර්යාලය**

ගුවන් සමාගම් මධ්‍යස්ථානය
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල
කටුනායක,
ශ්‍රී ලංකාව.

**ආයතනික වෙබ් අඩවිය**

www.srilankan.com

★

**මෙම වාර්ෂික වාර්තාව කාබන් මධ්‍යස්ථ වේ.**

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම මෙම වාර්ෂික වාර්තාව සකස් කරනුලැබ ඇත්තේ සහතිකලත් කාබන් මධ්‍යස්ථ සංවිධානයක් වන ස්මාට් මීඩියා නම්වූ වාර්ෂික වාර්තා සමාගම විසිනි. මීට අතිරේකව, කඩදාසි භාවිතය සහ මුද්‍රණය ඇතුළු, මෙම වාර්ෂික වාර්තාව නිෂ්පාදනය කිරීමේදී, ස්මාට් මීඩියා විසින් බැහැරව භාරදෙන ලද කාර්යයන්ගේ ප්‍රතිඵලයක ලෙස සිදුවන හරිතගාර ගෑස් විමෝචනයන්, සත්‍යායනය කරන ලද මාර්ග මගින් මග හරවනු ලැබේ.

www.smart.lk www.carbonfund.org

Produced by **Smart Media** The Annual Report Company © Copyright Reserved

SriLankan Airlines

ගුවන් ගමන් මධ්‍යස්ථානය
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ
කටුනායක